උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදය
සිංහල අධ්‍යයන අංශය

# URSDS 2016

## Undergraduate Research Symposium of the Department of Sinhala

**27th October 2016**

## Abstracts

සාර සංක්ෂේප සංග්‍රහය

සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදය
# සිංහල අධ්‍යයන අංශය

# සාර සංක්ෂේප සංග්‍රහය

**සංස්කරණ උපදේශක**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර

**සංස්කරණය**

පී. ඩබ්ලිව්. චින්තා පවිත්‍රානි
එච්. ඒ. ගිහාන් මධුසංඛ
පී. ඩිල්ශානි චතුරිකා දාබරේ
එච්. පී. ඒ. වී. කේ. එම්. කොබ්බෑකඩුව
එස්. ලවන්දි සේනානායක

සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
2016

**උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදය - සිංහල අධ්‍යයන අංශය.**
**සාර සංක්ෂේප සංග්‍රහය - 2016**

ISSN : 2536-8699
Web : http://conf.kln.ac.lk/URSDS2016

පිටකවර සැකසුම : පී. ඒ. අමිල මදුසංක
මුද්‍රණය : විද්‍යාලංකාර මුද්‍රණාලය, පෑලියගොඩ
ප්‍රකාශනය : සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

Undergraduate Research Symposium
Department of Sinhala

# Abstracts

**Consultant Editor**

Senior Lecturer Buddhika Jayasundara

**Editors**

P. W. Chintha Pawithrani
H. A. Gihan Madusanka
P. Dilshani Chathurika Dabare
H. G. A. V. K. M. Kobbekaduwe
S. Lawandi Senanayake

Department of Sinahala
University of Kelaniya
2016

**Undergraduate Research Symposium - Department of Sinhala**
**Abstracts – 2016**

ISSN : 2536-8699
Web : http://conf.kln.ac.lk/URSDS2016

Cover Design : P. A. Amila Madusanka
Print : Vidyalankara Press, Peliyagoda
Published : Department of Sinhala, University of Kelaniya, Kelaniya

# පටුන


| | |
|---|---|
| පරිසංවාද කමිටුව | IX - X |
| උපකුලපතිතුමාගේ පණිවිඩය | 11 |
| මානවශාස්ත්‍ර පීඨාධිපතිතුමාගේ පණිවිඩය | 12 |
| පර්යේෂණ සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය | 13 |
| අංශාධිපතිතුමාගේ පණිවිඩය | 14 |
| සම්බන්ධීකාරකවරයාගේ පණිවිඩය | 15 |
| සංස්කාරක සටහන | 16 |
| මුඛ්‍ය දේශනය | 17-20 |
| සාර සංක්ෂේප නාමාවලිය | 21-24 |
| සාර සංක්ෂේප | 25-79 |

# Table of Contents


| | |
|---|---|
| **Conference Information** | **IX-X** |
| **Message - The Vice Chancellor, University of Kelaniya** | **11** |
| **Message - The Dean, Faculty of Humanities** | **12** |
| **Message - The Chairman, Research Council** | **13** |
| **Message - The Head, Department of Sinhala** | **14** |
| **Message - The Coordinator, URSDS-2016** | **15** |
| **Editors' Note** | **16** |
| **The Keynote Speech** | **17-20** |
| **List of Abstracts** | **21-24** |
| **Abstracts** | **25-79** |

## පරිසංවාද කමිටුව

**අනුශාසක**
මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි
අංශාධිපති, සිංහල අධ්‍යයන අංශය

**සම්බන්ධීකාරක**
ජ්‍යෙ. කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර

**මෙහෙයුම් කමිටුව**
ආචාර්ය කුසුම් හේරත්
ආචාර්ය හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්
ජ්‍යෙ. කථිකාචාර්ය අනුරුද්ධිකා කුලරත්න

**සංවිධායක කමිටුව**
ආධුනික කථිකාචාර්ය මදාරා කරුණාරත්න
අධිශිෂ්‍යත්වලාභී පී. ඩබ්ලිව්. චින්තා පවිත්‍රානි පෙරේරා
අධිශිෂ්‍යත්වලාභී එච්. ඒ. ගිහාන් මධුසංඛ
අධිශිෂ්‍යත්වලාභී ජයනි සමීරා
අධිශිෂ්‍යත්වලාභී ඉන්දුකා මධුමාලි

**සමීක්ෂණ කමිටුව**
විශ්‍රාමික මහාචාර්ය ජිනදාස දනන්සූරිය
විශ්‍රාමික මහාචාර්ය කුලතිලක කුමාරසිංහ
ජ්‍යෙ. මහාචාර්ය හර්සන් ඩයස්
ජ්‍යෙ. මහාචාර්ය පූජ්‍ය ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි
මහාචාර්ය දර්ශන රත්නායක
මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි
ආචාර්ය ස්වර්ණා ඉහළගම
ජ්‍යෙ. කථිකාචාර්ය පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි
ආචාර්ය කුසුම් හේරත්
ජ්‍යෙ. කථිකාචාර්ය අනුරුද්ධිකා කුලරත්න
ආචාර්ය හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්
කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර
කථිකාචාර්ය චින්තක රණසිංහ

**සැසි සභාපතිත්වය**
විශ්‍රාමික මහාචාර්ය ජිනදාස දනන්සූරිය
විශ්‍රාමික මහාචාර්ය කුලතිලක කුමාරසිංහ
විශ්‍රාමික මහාචාර්ය ගුණවර්ධන නානායක්කාර

ජ්‍යෙ. මහාචාර්ය හර්සන් ඩයස්
ජ්‍යෙ. මහාචාර්ය පූජ්‍ය ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි
මහාචාර්ය දර්ශන රත්නායක
මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි
ආචාර්ය ස්වර්ණා ඉහළගම
ජ්‍යෙ. කථිකාචාර්ය පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි
ආචාර්ය කුසුම් හේරත්
ජ්‍යෙ. කථිකාචාර්ය අනුරුද්ධිකා කුමාරි කුලරත්න
ආචාර්ය හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්
ජ්‍යෙ. කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර
කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර
කථිකාචාර්ය චින්තක රණසිංහ

**සංස්කරණ කමිටුව**
අධිශිෂ්‍යත්වලාභී පී. ඩබ්ලිව්. චින්තා පවිත්‍රානි
අධිශිෂ්‍යත්වලාභී එච්. ඒ. ගිහාන් මධුසංඛ
පී. ඩිල්ශානි චතුරිකා දාබරේ
එච්. ජී. ඒ. වී. කේ. එම්. කොබ්බෑකඩුව
එස්. ලවන්දි සේනානායක

**පරිගණක නිර්මාණ සැකසුම්**
පී. ඒ. අමිල මදුසංක
නුවන් චාමර හෙට්ටිගේ

**සැසි මෙහෙයුම් සහායක කමිටුව**
පී. ඩිල්ශානි චතුරිකා දාබරේ
හසිතා බුද්ධිනී යසරත්න
පී. නර්මදා තිලංකා කමලවීර
ඒ. සෙව්වන්දි මනෝරත්න
එල්. බී. ජේ. වගීෂානි
එච්. ජී. ඒ. වී. කේ. එම්. කොබ්බෑකඩුව
සුදේශ් කවීශ්වර
එරංග කෞශල්‍ය ගොඩකන්දආරච්චි
සසින්ද ගිම්හාන් ප්‍රේමකුමාර
ඩබ්ලිව්. චාන්දනී
එස්. පී. ගයානි මධූෂා කුමාරි
ඩබ්ලිව්. ජී. ඩී. එන්. ලක්මාලි
ජී. ජී. එස්. සී. පුෂ්පකුමාර
පී. ඩබ්ලිව්. වරුණි වත්සලා
එස්. ලවන්දි සේනානායක

## උපකුලපතිතුමාගේ පණිවිඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීන් උදෙසා පළමු වරට පවත්වනු ලබන ශාස්ත්‍රීය පර්යේෂණ පරිසංවාදය සඳහා පළමු ව මාගේ ශුභාශිංසන ගෙන එනුයේ හදපිරි සොම්නසිනි. විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ කුසලතාව ප්‍රදර්ශනය කරන අවස්ථාවක් ලෙස පමණක් නොව, විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ජීවිතයේ සැබෑ අරුත ප්‍රකට කරන කාර්යයක් ලෙස ද මෙම කටයුත්ත හඳුනාගත හැකි ය.

පර්යේෂණාත්මක, ගවේෂණාත්මක, විචාරපූර්වක අධ්‍යයන මඟින් නව දැනුම උත්පාදනය කොට සමාජයට දායාද කිරීමට උත්සුක වීම විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගෙන් අප අපේක්ෂා කරන ප්‍රධානතම ප්‍රතිලාභයයි. නිදහස් අධ්‍යාපනයේ වරප්‍රසාදලාභීන් ලෙස උසස් දැනුම සොයා සරසවි වරම් ලැබ ස්වකීය යෞවනය ඥාන ගවේෂණයට යොදාගන්නා විද්‍යාර්ථියා සැබෑ මානව සම්පතක් වන්නේ නව දැනුමක් සම්පාදනයට දරන අනල්ප වෑයම මත පදනම් ව ය. එබඳු උත්සාහයක් පෙන්නුම් කරන මෙම කර්තව්‍යය භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ව නව්‍යාකාරයෙන් දැනුම ගවේෂණය කෙරෙන අවස්ථාවක් ලෙසත් විද්‍යාර්ථීන්ගේ ශාස්ත්‍රීය පර්යේෂණ කුසලතාව ඔප්නැංවූ කටයුත්තක් ලෙසත් අගය කළ හැකි ය. මෙම කර්තව්‍යය බෙහෙවින් ම සාර්ථක වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරන අතර මේ සඳහා ඇපකැප වී ක්‍රියා කළ සිංහල අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමාටත් සංවිධායක කමිටුවේ සියලු දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

## පීඨාධිපතිතුමාගේ පණිවුඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය මඟින් සංවිධානය කරනු ලබන උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදයට පළමු ව උණුසුම් සුභ පැතුම් එක් කිරීමට කැමැත්තෙමි. සිංහල අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨයේ ඉතා සුවිශේෂ අධ්‍යයන අංශයකි. මෙහි සේවය කළ ආචාර්ය, මහාචාර්යවරුන්ගේ ඉගැන්වීම් සහ පර්යේෂණ හේතුවෙන් කැලණිය විශ්වවිද්‍යාලය, ලංකාවේ විශ්වවිද්‍යාල අතර ඉමහත් කීර්තියක් සහ ප්‍රසාදයක් ලබා ගෙන තිබීම අපගේ අභිමානයට හේතු වේ. එමෙන් ම වර්තමාන ආචාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථීන්ගේ ක්‍රියාකාරකම් මඟින් ද විශ්වවිද්‍යාලයට විශාල කීර්ති නාමයක් ලබා දීමට සිංහල අධ්‍යයන අංශයට හැකියාව ලැබී තිබීම අපගේ සතුටට කාරණයක් වේ. සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය පිළිබඳ නව පර්යේෂණ මෙහෙයවා එකී දැනුම බෙදා දීම උදෙසා පවත්වනු ලබන මෙම ශාස්ත්‍රීය පරිසංවාදය මම බෙහෝ සෙයින් අගය කරමි.

මෙම ශාස්ත්‍රීය සත්කාර්යය සඳහා අවශ්‍ය උපදේශනය ලබා දුන් කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාටත්, සිංහල අධ්‍යයන අංශයේ අංශාධිපති මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි සහ ඇදුරු මඬුල්ලටත් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. සිංහල අධ්‍යයන අංශයේ උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදය සාර්ථක වේවා'යි ඉතසිතින් පතමි.

මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න
පීඨාධිපති
මානවශාස්ත්‍ර පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

## පර්යේෂණ සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය

යම්කිසි විෂය පථයක දැනුම වර්ධනය කිරීම උදෙසා පර්යේෂණ අතිශයින් ම වැදගත් වන්නකි. එමෙන් ම පර්යේෂණයන්ගෙන් මතු කර ගන්නා දැනුම ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව, විද්‍යාර්ථීන් සහ පොදු ජනතාව  අතර බෙදා හැරිය යුතු ය. පර්යේෂණයන්ගෙන් සිදු කෙරෙන සොයාගැනීම් විද්වත් ප්‍රජාවගේ පිළිගැනීමට ලක් කිරීම උදෙසා සාකච්ඡාවට බඳුන් කිරීම සැබවින් ම වැදගත් වේ. ශාස්ත්‍රීය පරිසංවාද ඒ උදෙසා  කදිම වේදිකාවක් තනා දෙයි. කැලණිය විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණයන් පමණක් නොව පර්යේෂණ මගින්  සොයා ගන්නා තොරතුරු සාකච්ඡා  කිරීම සහ එම තොරතුරු බෙදා හැරීම සඳහා ශාස්ත්‍රීය පරිසංවාද  සංවිධානය කරනු ලැබේ. උපාධි අපේක්ෂකයින් පර්යේෂණ සඳහා උනන්දු කිරීම විශ්වවිද්‍යාලය මඟින් සිදු කරනු ලබන්නේ එමඟින් විද්‍යාර්ථීන් හට ස්වයං-ගවේෂණය, නිරවද්‍ය තොරතුරු අනාවරණය, දත්ත විශ්ලේෂණය, තර්කනය සහ තොරතුරු පවත්වාගෙන යාම මඟින් ගුණාත්මක හා බාහිර ලෝකයේ අභියෝග හමුවේ නොසැලෙන උපාධිධාරියකු බිහි කිරීමේ අභිලාෂයෙනි.

කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාවේ සභාපතිවරයා ලෙස සිංහල අධ්‍යයන අංශය මඟින් සංවිධානය කරනු ලබන උපාධි අපේක්ෂකයින් සඳහා වන ශාස්ත්‍රීය පරිසංවාදය පිළිබඳ මම ඉතා සතුටට පත් වෙමි. වර්තමානයේ විශ්වවිද්‍යාලය තුළ සුබවාදී පර්යේෂණ සංස්කෘතියක් ගොඩනැඟෙමින් පවතී. මේ වන විට විශ්වවිද්‍යාලය තුළ පවත්වන්නට යෙදුණ පර්යේෂණ පරිසංවාද සමූහය මීට සාක්ෂ්‍ය දරයි. මෙකී නව ප්‍රවණතාව සඳහා විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සභාව පිහිටුවීම ද සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර අර්ධ වශයෙන් මූල්‍ය සහයෝගය දැක්වීමට අමතර ව පර්යේෂණ සභාව මඟින් පර්යේෂණ තොරතුරු ලොව පුරා විශාල පිරිසකට බෙදා හැරීම සිදු කිරීමට ද දායක වේ. මෙම කාර්යය  සිදු කරනු ලබන්නේ පර්යේෂණ සාර සංක්ෂේප ලිපි විශ්වවිද්‍යාලයේ ඊ-ගබඩාවට ඇතුළත් කිරීමෙනි. මේ වන විටත්  දොළොස් දහසකට අධික ලිපි ප්‍රමාණයක් එහි ඇතුළත් ව ඇත.

අවසන් වශයෙන්  ශාස්ත්‍රීය  පරිසංවාදය අතිසාර්ථක කර ගැනීමෙහි ලා සිංහල අධ්‍යයන අංශය දරන නොමඳ උත්සාහයට එම අධ්‍යයනාංශයේ අංශාධිපතිතුමන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයටත්  සංවිධායක මණ්ඩලයටත් මගේ උණුසුම් සුබපැතුම් පිරිනමමි. එමෙන් ම මෙම කර්තව්‍යය  සර්වප්‍රකාරයෙන්  සාර්ථක වන ලෙස ප්‍රාර්ථනා කරන අතර ම ඉදිරි වර්ෂවලදීත් මෙබඳු පරිසංවාද  සංවිධානය වනු ඇතැයි ද අපේක්ෂා කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. ජේ. එස්. විජේරත්න
සභාපති
පර්යේෂණ සභාව
කැලණිය විශ්වවිද්‍යාලය

## අංශාධිපතිතුමාගේ පණිවිඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ වර්තමාන උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර මහතාගේ හා පර්යේෂණ සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. ජේ. එස්. විජේරත්න මහතාගේ සුවිශේෂ මඟ පෙන්වීම යටතේ අප විශ්වවිද්‍යාලයට මෑතක දී හඳුන්වා දෙන ලද උපාධි අපේක්ෂක, අපේක්ෂිකාවන්ගේ ශාස්ත්‍රීය පරිසංවාද මාලාව අධ්‍යයන අංශ මට්ටම දක්වා පුළුල් කරලීමට උත්සුක වීම සැබෑ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් බිහි කරලීමට දරන ප්‍රයත්නයේ ප්‍රධානතම, නවතම හා විශිෂ්ටතම කාර්යය ලෙස හැඳින්වීම අතිශයෝක්තියක් නොවේ. විචාරශීලී, විමංසනාත්මක බුද්ධියෙන් විවිධ විෂය ධාරාවන්ගේ නව දිශානතීන් සොයා යන ශාස්ත්‍ර පිපාසිත ඡාත්‍ර වර්ගයාට මෙම වැඩ පිළිවෙළ විශ්වවිද්‍යාල ජීවිතයේ දී තමන් ලද ප්‍රමුඛතම ආශීර්වාදය වනු නො අනුමාන ය.

හද්‍ර යෞවනයේ ජවසම්පන්න සකල ශක්තීන්ට හිමිකම් කියන විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අනාගත මානව සම්පතක් වී රටට පමණක් නොව ලෝකයට ම අභිවෘද්ධිදායක පිරිසක් වනු දැක්ම අපගේ පරම අභිලාෂයයි. සිංහල අධ්‍යයන අංශයේ සිංහල හා සාහිත්‍ය විචාර යන විෂයයන් හදාරන විද්‍යාර්ථීන් විසින් ප්‍රථම වරට සංවිධානය කරනු ලබන මෙම ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය, ස්වකීය විෂය ඥානයේ නිම්වළලු පර්යේෂණ සංස්කෘතියක් ඔස්සේ තවතවත් ප්‍රසාරණය කර ගැනීමට සමාරම්භයක් වනු නිරනුමාන ය.

මෙම කාර්ය සඵලත්වය උදෙසා නිරන්තර ව අප දිරිමත් කරන ගරු උපකුලපතිතුමාට, පර්යේෂණ සභාවේ ගරු සභාපතිතුමාට හා හිඟ ප්‍රතිපාදන ලබා දුන් මානවශාස්ත්‍ර ගරු පීඨාධිපතිතුමාටත්, මෙම ප්‍රථම ප්‍රයත්නයේ මුඛ්‍ය දේශනය සිදු කරලීමට නොපැකිල ව ඉදිරිපත් වූ, සිංහල අංශයට, විශ්වවිද්‍යාලයට පමණක් නොව රටට ම සම්පතක් වූ මහාචාර්ය දර්ශන රත්නායක මහතාට ද අපගේ කෘතඥතාව පළ කර සිටිමු. සම්බන්ධීකාරකවරයා ලෙස කටයුතු කරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර මහතා ඇතුළු සංවිධායක මණ්ඩලයේ ගුරු, සිසු දෙපිරිසට ද අනධ්‍යයන කාර්යය මණ්ඩලයට ද අපගේ නොවක් තුති හිමි විය යුතු ය.

මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි
අංශාධිපති
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

## සම්බන්ධීකාරකවරයාගේ පණිවිඩය

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි විචාරශීලී බුද්ධිමතුන් පිරිසක් රටට දායාද කිරීම ය. එකී අභිමතාර්ථය සපුරා ගැනීමට නම් විද්‍යාර්ථීන්ගේ නිදහස් චින්තනයට හා ශාස්ත්‍ර ගවේෂණයට සුදුසු පරිසරයක් විශ්වවිද්‍යාලය තුළ නිර්මාණය විය යුතු ය. කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා මෑතක දී හඳුන්වා දෙන ලද ශාස්ත්‍රීය පරිසංවාද මාලාව එකී අරමුණ සපුරාලමින්, පර්යේෂණ කාර්යයෙහි ලා ශිෂ්‍ය ප්‍රජාවට උත්තේජනයක් ලබා දුන් සාර්ථක වැඩපිළිවෙළක් වශයෙන් ශාස්ත්‍රවන්තයින්ගේ ඇගැයුමට ලක් වෙයි.

2015 වර්ෂයේ දී මානවශාස්ත්‍ර පීඨයේ උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් උදෙසා පවත්වන ලද ශාස්ත්‍රීය පරිසංවාදයේ දී වැඩි ම පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාවක් ඉදිරිපත් කළ සිංහල අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීහු මෙවර ස්වාධීන ශාස්ත්‍රීය පරිසංවාදයකින් නැවතත් පර්යේෂණ ක්ෂේත්‍රයට අවතීර්ණ ව සිටිති. එහි දී චිරන්තන සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය, නූතන සිංහල ප්‍රබන්ධ කතා, ප්‍රාසංගික හා වාර්තික කලා, ජනශ්‍රැතිය හා සංස්කෘතිය, භාෂාව හා ව්‍යාකරණය, සිංහල කලා ශිල්ප, සාහිත්‍ය සමාජ විද්‍යාව සහ සාහිත්‍ය විචාරය ආදි විෂයක්ෂේත්‍ර අලළා ඉදිරිපත් කරන ලද පනහකට අධික පර්යේෂණ පත්‍රිකාවලින් සාහිත්‍ය කලා විචාරයෙහි ලා ස්වකීය නව චින්තාවන් සභාගත කරන ඔවුහු මතවාදාත්මක ව ගැටෙති.

විශ්වවිද්‍යාලයෙහි මෙබඳු ශාස්ත්‍රීය පරිසරයක් නිර්මාණය කිරීමෙහි ලා පුරෝගාමී වූ වත්මන් උපකුලපතිතුමන් වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර මහතාට සහ පර්යේෂණ සභාවේ සභාපතිතුමන් වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. ජේ. එස්. විජේරත්න මහතාට ද මුදල් ප්‍රතිපාදන ලබා දෙමින් අප දිරිමත් කළ මානවශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිතුමන් වන මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතාට ද ප්‍රථමයෙන් අපගේ ගෞරවනීය ස්තුතිය ප්‍රකාශ කර සිටිමු. මේ ශාස්ත්‍රීය සද් කාර්යයේ දී නිරන්තර උපදේශකත්වයෙන් හා අධීක්ෂණයෙන් අපට ශක්තියක් වූ සිංහල අංශයේ අංශාධිපති මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි මහතාත්, පර්යේෂණ පත්‍රිකා සමීක්ෂණයෙන් හා පර්යේෂණ සැසි අධීක්ෂණයෙන් සහය වූ සිංහල අධ්‍යයන අංශයේ සමස්ත ආචාර්ය මණ්ඩලයත් ගෞරවයෙන් සිහිපත් කරමු. ගුරු-සිසු දෙපිරිසගෙන් සැදුම් ලත් සංවිධායක මණ්ඩලයේ සියලු ම සාමාජික භවතුන්ගෙන් හා අනධ්‍යයන කාර්යමණ්ඩලයෙන් ලද සහයෝගය මේ කර්තව්‍යයෙහි සාර්ථකත්වය හා අත්‍යන්තයෙන් බැඳී සිටියි. ඒ සියලු දෙනාට අපගේ කෘතඥතාව පළ කර සිටින අතර, 2016 වර්ෂයේ සිංහල අංශයෙහි උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදයේ දී පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරමින් ශාස්ත්‍ර ගවේෂණයෙහි යෙදෙන සියලු විද්‍යාර්ථීන්ට ඥානයෙන් ප්‍රසිද්ධ වන්නට ශක්තිය ධෛර්යය ලැබේවායි ශුභාශිංශන එක් කරමු.

ජ්‍යෙ. කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර
සම්බන්ධීකාරක
උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදය - 2016
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

## සංස්කාරක සටහන

කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීන්ගේ ප්‍රථම ශාස්ත්‍රීය පරිසංවාදය සඳහා අපගේ සුභ පැතුම් ගෙන එන්නේ ඉමහත් අපේක්ෂා සහගත ව ය. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ කුසලතාව ඔප්නැංවීම වනාහි ශාස්ත්‍ර ක්ෂේත්‍රයේ අනාගත අභිවෘද්ධිය උදෙසා කරනු ලබන දිගුකාලීන ආයෝජනයකි. මේ සඳහා විද්‍යාර්ථීන් දැක්වූ උනන්දුව හා දායකත්වය ද විශිෂ්ට මට්ටමක පැවති බව නිරීක්ෂණය කළ හැකි විය. ඔවුන්ගේ සාර සංක්ෂේප බහුතරය උසස් මට්ටමේ අනාගත ශාස්ත්‍ර පර්යේෂකයන් පිළිබඳ අපේක්ෂා දල්වන මට්මටක පවතී.

මෙම කර්තව්‍යය වනාහි හුදු ශාස්ත්‍ර ගවේෂණයට පමණක් නොව සාමූහික ආකල්ප නගා සිටුවීමටත් අදහස් හා විවේචන ඉදිරිපත් කිරීමේ සහ මැදහත් ව ඉවසීමේ ගුණය වර්ධනයටත් ජීවනාවබෝධය පුළුල් කිරීමටත් හේතුකාරක වන මහඟු ක්‍රියාදාමයක් වේ. මෙබඳු මැදිහත්වීම්හි ආනුෂංගික ප්‍රතිඵල අනාගතය කෙරෙහි වඩාත් හිතකර බලපෑම් ඇති කරනු නියත ය. සාර සංක්ෂේප පරීක්ෂා කරමින් අවශ්‍ය උපදෙස් සැපයූ ජ්‍යෙෂ්ඨ ආචාර්ය මණ්ඩලය කඩිනමින් ඒ සඳහා යොමු වෙමින් කටයුතු කිරීම ස්තුති පූර්වක ව සිහි කළ යුතු ය. එමෙන් ම මෙම කාර්යය සාර්ථක කර ගැනීමට නොමසුරු දායකත්වය ලබාදුන් කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාට, පර්යේෂණ සභාවේ සභාපතිතුමාට, සිංහල අශයේ අංශාධිපතිතුමන් ඇතුළු සමස්ත ආචාර්ය මණ්ඩලයට, විද්‍යාර්ථීන්ට හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අපගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුද කර සිටිමු.

සංස්කාරක මණ්ඩලය
උපාධි අපේක්ෂකයින්ගේ ශාස්ත්‍රීය පරිසංවාදය - 2016
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

## මුඛ්‍ය දේශනය

මහාචාර්ය දර්ශන රත්නායක
(ගෞරව ශාස්ත්‍රවේදී, දර්ශනපති (කැලණිය), රාජකීය පණ්ඩිත, ග්‍රන්ථ විශාරද)
සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

**ශාස්ත්‍රීය පර්යේෂණ සහ පරිසංවාද**

"ඔබ උගන්වන්නේ දැනුම සඳහා ද? විභාගය සඳහා නොවෙයි ද?" මෙය මේ වසරේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) ප්‍රථම වර්ෂයේ නාට්‍ය කලාව පිළිබඳ දේශනයේ දී මවෙතින් විමසූ ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය නැගූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යයාව අපගේ දයානුකම්පාවට පාත්‍ර විය යුතු ය. මක්නිසා ද? අද වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන බහුතරයක් සිය ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උපකාරක අධ්‍යාපනය ද ලබමින් ප්‍රශ්නය හා පිළිතුර උගන්වමින් විභාග සඳහා ම සූදානම් කරන සිසු පිරිසක් බැවිනි. නාට්‍ය පිළිබඳ මාතෘකාව පසෙක තබා අධ්‍යාපනයේ සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ පරමාර්ථ පිළිබඳ පැහැදිලි කර දෙන්නට මට සිදු විය. මා මේ ප්‍රවේශය ලබා ගත්තේ සිංහල අධ්‍යයන අංශයේ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් සඳහා පවත්වන ශාස්ත්‍රීය පරිසංවාදයෙහි කාලීන හා ප්‍රායෝගික භාවය ප්‍රකාශ කිරීම සඳහා ය.

විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථියා විමර්ශනශීලී, පර්යේෂණශීලී, ගවේෂණශීලී, නිර්මාණශීලී හා විප්ලවකාරී අයකු විය යුතු බව පිළිගැනේ. විශේෂයෙන් මෙහි විප්ලවකාරී යන්නේ ගතානුගතික සාවද්‍ය මතවාද සතාර්කික ලෙස හා සහේතුක ලෙස නිශේධනය කිරීමේත් සමාජ ප්‍රගමනය සඳහා ක්‍රියා කිරීමේත් දෘෂ්ටිය හා පෞරුෂය අපේක්ෂා කෙරේ.

විශ්වීය ඥානය උත්පාදනය වී ඇත්තේ මිනිසාගේ සම්භවයේ සිට ම සිදු වූ විවිධ සෙවීම් විමසීම් හා සාකච්ඡා, සංවාද ආදියෙහි අනිවාර්ය ප්‍රතිඵලයක් වශයෙනි. ඒෂණ, ගවේෂණ, පර්යේෂණ, සංවාද, විසංවාද හා පරිසංවාද යන කෘදන්ත නාමවල ඊට ම අනන්‍ය වූ විශේෂාර්ථ අරෝපණය වී ඇත. ලොව සිදු වූ විද්‍යා, වාණිජ, සමාජීය විද්‍යා පර්යේෂණ මඟින් විශේෂ වශයෙන් මිනිසාගේ භෞතික ලෝකය උන්නතියට පත් වන අතර ශාස්ත්‍ර-කලා අධ්‍යයන හා පර්යේෂණ මඟින් විශේෂයෙන් අධ්‍යාත්මික, භාවමය ලෝකය උද්දීප්තියට පත් වේ. මානව සමාජයේ සමබරතාව සුරක්ෂිත වීම සඳහා මෙකී මාර්ග දෙක ම එකට හමු විය යුතු ය. මානව ජීවිතයේ සංවර්ධනය සඳහා මිනිසාගේ සිතීමේ, විමසීමේ හා ක්‍රියාකිරීමේ ශක්තිය බෙහෙවින් උපස්තම්භක වේ. එසේ ම

1. සංජානනය : මැනවින් දැන ගැනීම
2. සංප්‍රාපණය : දැනුම මැනවින් පැමිණවීම
3. සංවේදනය : දැනුම මැනවින් විඳගැනීම
4. සංඥානනය : මැනවින් දැනුම්වත් කිරීම
5. සංජීවනය : ජීවිතය සඳහා දැනුම භාවිත කිරීම

යන පඤ්චවිධ කාර්ය සංසිද්ධිය සඳහා පර්යේෂණ හා පරිසංවාද ආමුඛ වෙයි. ඈත අතීතයෙහි ග්‍රීක, චීන, හා භාරතීය ශිෂ්ටාචාර කේන්ද්‍ර කොටගෙන සිදු වූ දාර්ශනික හා තාක්ෂණික ඥාන විසරණය වර්තමානය වන විට විශ්ව ව්‍යාප්ත වී පවතී. අතීත පර්යේෂකයන්ට

ඇති වූ ඇතැම් අභියෝග වර්තමාන පර්යේෂකයන්ට අවිෂය වන අතර නව අභියෝගවලට මුහුණපෑමට සිදු වී තිබේ.

අධ්‍යයන හා පර්යේෂණ සිදු කිරීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් ඇරඹුණු විශ්වවිද්‍යාල කාලානුක්‍රමයෙන් අධ්‍යාපනය හෙවත් ඉගැන්වීමෙන් නව පරපුරක් ශික්ෂණය කිරීමේ කාර්යභාරයට ද අවතීර්ණ විය. වර්තමානය වන විට මෙරට ආගමදහම භාෂා සාහිත්‍ය වැනි විෂය ද හුදෙක් වෘත්තීය ශක්‍යතා සඳහා ලක්ෂ්‍ය කිරීමේ පෙලඹුමක් දක්නට ලැබේ. එහෙත් මානව ශාස්ත්‍ර අධ්‍යාපනයෙන් අපේක්ෂිත ජාතික චරිතය හා ජාතික පෞරුෂය වර්ධනය කිරීම සඳහා වන ප්‍රධාන කාර්ය භාරය ද නොතකා හැරිය යුතු නොවේ. චරිතය සුශෝභනය කිරීම ප්‍රඥාවේ කාර්ය භාරය බව විශේෂ පිළිගැනීමකි.

විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් සඳහා වන පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම හා ශාස්ත්‍රීය පරිසංවාදයක් සිදුවන මෙම අවස්ථාවේ අපගේ අවධානයට පාත්‍ර විය යුතු ඉතා වැදගත් අදහස් කීපයක්, ඇස්. ජී. සමරසිංහ, අමරදාස ගුණවර්ධන, සහ හැරල්ඩ් පීරිස් යන විද්වතුන් විසින් සංස්කරණය කරන ලද සංස්කෘති ත්‍රෛමාසිකයෙහි 1983 ජූලි - සැප්තැම්බර්, 17 කලාපය -3 සඟරාවෙහි ඇතුළත් "විශ්විද්‍යාලය හා පර්යේෂණය" නම් සංස්කාරක ප්‍රකාශනයෙන් ගෙන හැර දැක්වීම යෝග්‍ය වේ යැයි කල්පනා කරමි.

> "විශ්වවිද්‍යාලයේ බුද්ධිමය වාතාවරණය ගොඩනැංවීමේ එක් මගක් නම් උපාධි අපේක්ෂක මට්ටමේ සිට පර්යේෂණයට ශිෂ්‍යයින් යොමු කර වීමයි. මෙය විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය භාර බලධාරීන්, විශ්වවිද්‍යාල ගුරුවරුන් සහ අධ්‍යාපන විශේෂඥයින්ගේ දැඩි අවධානය ලක් විය යුතු ක්ෂේත්‍රයකි. එයින් කිසි ම ගණයකට අයත් නොවන අපට බැහැරින් සිට පෙනෙන කරුණු කිහිපයක් සඳහන් කිරීම මැනවැයි සිතමු.
>
> විශ්වවිද්‍යාලය වූකලි තවත් මහා විද්‍යාලයක්, උසස් විද්‍යාලයක් හෝ තවත් ඊට සමාන ආයතනයක් නොවේ. එය ඒ සියල්ලට ම වඩා උසස් ඊට වඩා වෙනස් නිදහසේ සිතන්න පුහුණු කරවන කේන්ද්‍රස්ථානයකි. ඒ බව නවක සිසුන්ට හඳුන්වාදීම ගුරුවරුන්ට පැවරෙන ප්‍රථම වගකීමයි. උසස් පාසලක සිට එන ශිෂ්‍යයා විශ්වවිද්‍යාලයට පැමිණි විට තමාගේ අධ්‍යාපනයෙහි පමණක් නොව මුළු ජීවිතය ගැන ද නව ආලෝකයක්, නව පිබිදවීමක් බලාපොරොත්තු වෙයි. අලුත් ම ආකාරයට සිතන පතන ආචාර්යවරුන් රැසක් එහි ඇතැයි යනු ඔහුගේ මතයයි. මෙවැනි බලාපොරොත්තු ඇති ව එන ශිෂ්‍යයාට විශ්වවිද්‍යාලයෙහි දී ද එහි කථිකාචාර්යවරුන් ඔවුන්ගේ දේශන "කියවන විට ලිවීමේ" මට්ටමෙන් කරන්නට ගියහොත් ශිෂ්‍ය අපේක්ෂාවන් සියල්ල ම බිඳ වැටේ. ශිෂ්‍යයා තමා සිටි උසස් විද්‍යාලයත් විශ්වවිද්‍යාලයත් අතර වෙනසක් නොදකියි.
>
> අප දන්නා පරිදි බොහෝ විශිෂ්ට විශ්වවිද්‍යාලවල පවතින්නේ ශිෂ්‍යයින් තුළ ඔවුන්ගේ වගකීම ප්‍රගුණ කරවන අයුරු ගුරු ශිෂ්‍ය සම්බන්ධයක් ඇති වීමයි. පාඨමාලාවේ නිර්දේශපත්‍ර ආවරණය කිරීම ශිෂ්‍යයාගේ වගකීමයි. ඒ සඳහා උපදෙස් දීම මග පෙන්වීම කරනු ලබන්නේ ගුරුවරයා විසිනි. පීඨාධිපති, මහාචාර්යවරු,

කථිකාචාර්යවරු, පුස්තකාලය සහ දේශන ඔහුට සහාය වෙති. නමුත් ගුරුවරුන් විසින් නිර්දේශපත්‍ර ආවරණය කිරීමේ වගකීම බාර නොගන්නා බව පෙන්වීම උපාධි අපේක්ෂකයා පර්යේෂණ මාවතට යොමු කරන පළමු වැනි පියවරයි.

උසස් විද්‍යාලයෙන් පැවත එන තවත් අහිතකර සම්ප්‍රදායක් නම් පොත පතෙහි එන බොහෝ කරුණු දේව භාෂිතය වශයෙන් පිළිගැනීමයි. පොතපතෙහි එන කරුණු හදාරා කිසියම් මතයක් පිළිබඳ ව ස්වාධීන ව සිතන්නට පුරුදු කරවීම විශ්වවිද්‍යාලයෙන් ඉටුවිය යුතු ඵලග මෙහෙයයි. ස්වාධීන ව සිතන ශිෂ්‍යයා ඔහුගේ ම කිසියම් අලුත් නිගමනයක් ඔප්පු කිරීම සඳහා අලුත් තොරතුරු සොයන්නට පෙලඹෙයි. එසේත් නැත්නම් පොත පතෙහි එන කරුණු ම නව විවරණයකට භාජන කරන්නට උත්සාහයක් දරයි. එවැනි ව්‍යායාමයක යෙදෙන නවක ශිෂ්‍යයා එයින් ප්‍රබෝධයක් ලබනවා පමණක් නොව ඒ ගැන සහෝදර ශිෂ්‍යයින් සහ ගුරුවරුන් සමග සංවාදයකට එළඹෙයි. පර්යේෂණයේ මුල් පියවර ඔහු ඉගෙන ගන්නේ එලෙසිනි."

කිසියම් පර්යේෂණ කාර්යක දී අවධානය යොමු විය යුතු අංශ අතර පර්යේෂණ ක්ෂේත්‍රය හා පර්යේෂණීය ගැටලුව තෝරා ගැනීම, පර්යේෂණයෙහි අරමුණ හෝ පරමාර්ථය, පර්යේෂණයේ මුඛ්‍යාර්ථ සූචක මාතෘකාවක් හෝ ශීර්ෂපාඨයක් යොදා ගැනීම. පර්යේෂණ ව්‍යුහය හෝ සන්දර්භය සකසා ගැනීම, පර්යේෂණ ක්‍රමවේදය නිර්ණය කිරීම, දත්ත සම්පාදනය හා විශ්ලේෂණය, පූර්ව පර්යේෂණ කෙරෙහි සාවධාන වීම, මූලාශ්‍රය භාවිතය, නිබන්ධ රචනය හා භාෂා භාවිතය, අදාළ සිතියම්, රූපසටහන් හා ඡායාරූප ආදිය යොදා ගනිමින් සිදු කරන සන්නිරූපණය, සමාලෝචනය හා නිගමනය දැක්වීම, පාදක සටහන් ආන්තික සටහන් හා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය දැක්වීම අතිශය වැදගත් වේ. විශේෂයෙන් භාෂාව මාධ්‍ය කොට ගත් පර්යේෂණ හා ප්‍රකාශනයන්හි දී භාෂාවේ නිරාකුල ප්‍රකාශන ශක්තිය හා නිරවද්‍යතාව කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ. පර්යේෂකයාගේ තොරතුරු හා අදහස් ආදිය නිරාකුල ලෙස පාඨකයාට සන්නිවේදනය වීම අත්‍යවශ්‍ය බැවිනි. එසේ ම අතිශයෝක්ති සහිත වර්ණනාත්මක හා කාව්‍යමය භාෂාව ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා යෝග්‍ය නොවේ.

අද්‍යතන සිංහල පර්යේෂණ හා ප්‍රකාශනවල භාෂා භාවිතය පිළිබඳ දුර්වලතා බහුල වශයෙන් දක්නට ලැබේ. අක්ෂර වින්‍යාසය, පද සාධනය, වාක්‍ය ප්‍රයෝග, ක්‍රියාකාරක පද සම්බන්ධ, විරාම ලක්ෂණ, පද බෙදීම, ඡේද වෙන් කිරීම හා රචනා රීතිය පිළිබඳ ලේඛනයේ දී විශේෂ අවධානය යොමු කළ යුතු ය. වාක්කෝෂයේ සම්මුතිබද්ධ අර්ථ සුරක්ෂිත වන අයුරින් භාෂාව භාවිත කළ යුතු ය. කාව්‍ය රචනය ඇතුළු නිර්මාණ සාහිත්‍යයේ දී නම් අසම්මත ලෙස භාෂාව භාවිත කිරීමේ අයිතිය නිර්මාණකරුවාට ලැබේ. කවියාට අනුව "ඇළදොළවල ලෝ දිය බඩගායි." "රන්වන් දිගැටි මුහුණෙහි කරය ගලා බසියි". පර්යේෂකයා ස්වකීය පර්යේෂණයෙහි අන්තර්ගතය නිර්බාධිත ව පාඨකයා වෙත රැගෙන යාමට සමත් වීම අත්‍යවශ්‍ය සාධනාවකි.

සාර්ථක පර්යේෂණයකින් :-

1. අභිනව දැනුම සම්පාදනය කිරීම
2. සාවද්‍ය කරුණු නිරවද්‍ය කිරීම

3. සම්පාදිත නිරවද්‍ය කරුණු සාවද්‍ය නොකිරීම

4. නව පර්යේෂණ වීථි ආනාවරණය කිරීම

5. නව පර්යේෂකයන්ගේ පර්යේෂණ කුතුහලය වර්ධනය කිරීම වැනි වැදගත් ඵල ප්‍රයෝජන රැසක් ඉටුවේ. එසේ ම,

සාධනීය පරිසංවාදයකින් :-

1. තත්වඥානය ඇති කර ගැනීම
2. සාවද්‍ය ස්ථාන නිරවද්‍ය කර ගැනීම
3. පුද්ගලාන්තර දැනුම ආශ්‍රයෙන් සිය අදහස් සනාථ කර ගැනීම
4. නිශේධනීය කරුණු නිශේධනය හා සාධනීය කරුණු සාධනය කර ගැනීම
5. සෙසු මතවාද සමග ගැටීමෙන් සිය මතවාද මුවහත් කර ගැනීම
6. වඩාත් නිවැරදි තීරණවලට එළඹීම
7. පරමත ඉවසීමේ ශාස්ත්‍රීය පෞරුෂය වර්ධනය කර ගැනීම
8. පෞද්ගලික අනුග්‍රහ හෝ නිග්‍රහ නොකිරීම

වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම ඵලදායක වේ. කවර විෂයක්ෂේත්‍රයක හෝ පරිණත භාවයට පත්වීම සඳහා අනුපූර්ව ශික්ෂණයක් අවශ්‍ය වේ. එක් පියවරකින් දෙකකින් ගමනාන්තයට ළඟා විය නොහැකි ය.

ආධුනික විශ්වවිද්‍යාල විද්‍යාර්ථියා තමා ලබන පර්යේෂණ ශික්ෂණය හේතු සම්පත් කොට ගනිමින් සාර්ථක පර්යේෂකයකු බවට පත් කිරීම මෙබඳු ප්‍රායෝගික ශාස්ත්‍රීය ක්‍රියාකාරීකම්වල ධනාත්මක ප්‍රතිඵලයයි.

ශ්‍රී ලංකාවේ භාෂා, සාහිත්‍ය කලා පිළිබඳ කීර්තිධර අධ්‍යාපන ආයතනයක් වූ විද්‍යාලංකාර පිරිවෙන ප්‍රතිෂ්ඨාව කොට ගෙන බිහි වූ කැලණිය විශ්වවිද්‍යාලය සතු ශාස්ත්‍රීය අනන්‍යතාවක් පවතී. සත්‍ය ගවේෂණය ම මුඛ්‍ය පරමාර්ථය කර ගත් බෞද්ධ පර්යේෂණ ක්‍රමයෙහි නිර්මාතෘවරයා වූ ගෞතම බුදුන් වහන්සෙගේ හය වසරක ක්ෂේත්‍ර හා සිද්ධාන්ත අධ්‍යයනය මූලික කරගත් ආර්ය පර්යේෂණයෙහි පර්යේෂණ වාර්තාව වූ "ධර්මචක්‍ර සූත්‍රය" විනාඩි කීපයකින් ඉදිරිපත් කළ හැකි ය. පිටු කීපයක සංග්‍රහ කළ හැකි ය. අර්ථ පූර්ණ ය. ගාම්භීර්ය ය. එසේ ම එකී අද්විතීය පර්යේෂණය පශ්චාත්කාලීන සුවිශාල ග්‍රන්ථාවලියකට ප්‍රතිෂ්ඨාධාර වී ඇත. මිහිඳු හිමියන් විසින් දෙවනපෑතිස් රජු සමග කරන ලද පරිසංවාදය ප්‍රඥාප්‍රදීපනය සඳහා හේතු විය. ශ්‍රී ලංකාවේ මහා විහාරීය භික්ෂු පර්ෂදය වෙත බුද්ධඝෝෂ හිමියන් විසින් ඉදිරිපත් කරන ලද "විසුද්ධිමග්ග" නම් වූ පර්යේෂණ නිබන්ධය මෙරට ප්‍රථම ආචාර්ය උපාධි නිබන්ධය ලෙස සැලකීමේ වරද කුමක් ද? එකී අතීතය සහ පෘථුල වර්තමානය ප්‍රතියෝජනය කරමින් අභිනව පර්යේෂණ සිදු කිරීමෙන් පර්යේෂණවල සහ පරිසංවාදවල අව්‍යාජ වූත් අපූර්වතම වූත් ප්‍රතිඵල දිනාගත හැකි වනු ඇත.

# සාර සංක්ෂේප නාමාවලිය

| | පර්යේෂණ මාතෘකාව | පර්යේෂකයාගේ නම |
|---|---|---|
| 01 | අනුරාධපුර හා පොළොන්නරු යුගන්හි ලක්දිව පැවති නාට්‍ය කලාවේ ස්වභාවය පිළිබඳ විමසීමක් | සුමාලි තක්ෂිලා ගුණසේකර, ඒ. පී. |
| 02 | අලුත් සහල් මංගල්‍යය පිළිබඳ අධ්‍යයනයක් | දිල්හානි, එච්. පී. |
| 03 | "ඊඩිපස් රජ" නාට්‍යය සහ "ප්‍රතිමා ගෘහය" කෙටිකතාව යන නිර්මාණ ද්වයේ අන්දැකීම ඉදිරිපත් කෙරෙන ආකාරය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් | දසනායක, ඩබ්. ඩී. එන්. එම්. |
| 04 | 'ඊඩිපස්' හා 'රත්නාවලී' නාට්‍යද්වයෙහි ගැටුමෙහි සාදෘශ්‍යතාව හා දෘෂ්ටියෙහි විසදෘශ්‍යතාව | උදයකුමාර, එස්. එම්. කේ. එම්. |
| 05 | උම්මග්ග ජාතකයේ මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව රාජ්‍ය පාලනය කෙරෙහි පරිභාවිත ආකාරය පිළිබඳ විමසීමක් | රුවන්ගිකා හේමමාලි දිසානායක, ජී. ඩබ්. |
| 06 | ඌවේ යක්කාරි ශාන්තිකර්මය හා බැඳි පූජාවිධි රටාව | ලක්මාලි, ඩබ්. ජී. ඩී. එන්. |
| 07 | කතරගම දේව විශ්වාසය හා තවලම | ලක්මාලි, ඩබ්. පී. ඩී. එන්. |
| 08 | කර්තෘගේ මරණය හා ඩේවිඩ් කොපර්ෆීල්ඩ් නවකතාව | කවීශ්වර, සුදේශ් |
| 09 | කරුවල ගෙදර නවකතාවෙන් නිරූපිත ග්‍රාමීය සමාජ විපර්යාසය | කෞශල්‍යා, එස්. එස්. |
| 10 | කිරම ධම්මානන්ද හිමියන් සහ උන්වහන්සේගෙන් සිදු වූ සාහිත්‍ය සේවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | ඉසංකා සංජීවනී, කේ. |
| 11 | ගංගාරෝහණ වර්ණනාවේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | රමණී, ඩබ්ලිව්. |
| 12 | ගාර්ෂියා ලෝකාගේ (1899-1936) ග්‍රාමීය ශෝකාන්ත නාට්‍ය ත්‍රිත්වය පිළිබඳ ස්ත්‍රීවාදී කියවීමක් | දර්ශන, කේ. ඩී. |
| 13 | ගුත්තිල කාව්‍යයේ ගුරුගෝල ගැටුම ගුරුමුෂ්ටිය හා සම්බන්ධ වූවක් ද? | උදේශිකා දමයන්ති, ඩී. එම්. |

| | | |
|---|---|---|
| 14 | ගුරුළුවතෙහි සංකේතාශ්‍රිත යථාර්ථ නිරූපණය පිළිබඳ අධ්‍යයනයකි | සේනානායක, සසී ලවන්දි |
| 15 | ගෝරා නවකතාවෙන් හෙළි වන නූතනත්වයේ හා සම්ප්‍රදායේ මත ගැටුම පිළිබඳ විමර්ශනයක්. | දම්මිකා කුමාරි, ජී. |
| 16 | චරිතකතා කාව්‍යයක් වශයෙන් යසෝදරාවතෙහි පවත්නා අගය පිළිබඳ විමර්ශනයක් | මදූෂානි, ඩී. එම්. එච්. එම්. |
| 17 | ජනකවියෙන් පිළිබිඹුවන යෞවන ප්‍රේමය | දොරකුඹුර, ආර්. පී. එස්. සී. එච්. |
| 18 | ජාතක කතා සාහිත්‍යයෙන් නිරූපිත දිසාපාමොක් ගුරු භූමිකාව පිළිබඳ විමසුමක් | චාරංගා, ජේ. එම්. එන්. එම්. |
| 19 | ජාතක පොතෙන් ප්‍රතීත වන මනෝරෝග චිකිත්සක ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් මාතෘකා කිහිපයක් ඇසුරෙනි) | විමලතිස්ස හිමි, වහරක<br>ජයකොඩි, ජේ. ඒ. එස්. එස්. |
| 20 | දෙවනපිය යෙදුම විග්‍රහ කරන සිංහල නිරුක්ති; (ක්‍රි. ව. 10-15 සෙල්ලිපි ඇසුරිනි) | චාමර, එච්. එන්. |
| 21 | නූතන සිංහල නවකතාවෙහි 71 කැරල්ල නිරූපිත ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (තෝරා ගත් නවකතා ඇසුරෙන්) | නිරෝෂිකා, යූ. එන්. |
| 22 | ප්‍රවාස විප්‍රලම්භ ශෘංගාරය සීගිරි ගීවලින් ප්‍රතිනිර්මාණය වන ආකාරය | ගයානි මධූෂා කුමාරි, එස්. පී. |
| 23 | පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ මුල් කාලීන කාව්‍ය නිර්මාණ හා දෘෂ්ටිවාද ප්‍රකාශනය පිළිබඳ විමර්ශනයක් | චිත්‍රා කුමාරි සිල්වා, එස්. එම්. |
| 24 | v වැනි කාශ්‍යප රජුගේ ( ක්‍රි. ව. 914-923 ) පුවරු ලිපියෙන් හෙළි වන අධිකරණ ක්‍රමය | පුෂ්ප කුමාර, පී. පී. එස්. සී. |
| 25 | පුද්ගලානුබද්ධ අත්දැකීම් නිර්මාණකරණය සඳහා උපයෝගී වන ආකාරය (ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග්ගේ පීතෘ නාට්‍යය ඇසුරින්) | නිමල් අබේසූරිය, ආර්. ඩී.<br>සරණකිත්ති හිමි, බෙරලිහෙළ |
| 26 | 'පෙමතො ජායතී සොකො' නාට්‍යයෙහි නිරූපිත ශෝකෝත්පාදක ලක්ෂණ | ගොඩකන්ද ආරච්චි, එරංග කෞශල්‍ය |
| 27 | බටුවන්ගල රාහුල හිමියන්ගේ 'උපන් ලපය' කෙටිකතා සංග්‍රහයෙහි විද්‍යමාන ලිබරල් මානවවාදී ලක්ෂණ පිළිබඳ විමසුමක් | ප්‍රේමකුමාර, සසින්ද ගිම්හාන් |

| | | |
|---|---|---|
| 28 | මහනුවර යුගයේ පද්‍ය කෙරෙහි පතිත වූ ද්‍රවිඩ ආභාසය | වන්නිනායක, ඩබ්. එම්. ඩී. යූ. |
| 29 | මහනුවර යුගයේ සමාජ විපර්යාසය සාම්ප්‍රදායික චිත්‍ර කලාව කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ අධ්‍යයනයක්<br>(දූල්වල අලංකාරේ නවකතාව ඇසුරිනි) | සුභාෂිණී වේරගොඩ, ඩබ්. ඒ. ඩබ්. |
| 30 | මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ කාව්‍යකරණයෙහි මතුවන විරෝධාකල්පය පිළිබඳ විමසුමක් | ප්‍රේමකුමාර, සසින්ද ගිම්හාන් |
| 31 | මළගිය ඇත්තෝ නවකතාවේ දෙවොන්දරා සං හා මිනිස් සිතේ ගුඪත්වය | දහනායක, එච්. ටී. |
| 32 | මීනා නවකතාවෙන් මතුවන කතුවරයාගේ ස්වාධීනත්වය | ප්‍රියදර්ශනී, ඩී. එච්. සී. ඒ. |
| 33 | මුවදෙව්දාවත කෙරෙහි පූර්ව සංස්කෘත කාව්‍යයන් බලපා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක් | දිසානායක, ඩී. එම්. ඩී. එම්. |
| 34 | මුවදෙව්දාවත රචනා වීමට බලපෑ දේශපාලනික පසුබිම පිළිබඳ විවරණයක් | විස්නා ලක්මාලි, එල්. ජී. |
| 35 | මුහුණුපොතෙන් සිංහල භාෂාවට එක් වූ නව්‍ය ව්‍යවහාරයන්හි බලපෑම | ලක්මාලි, ජී. ඩී. ඩබ්. |
| 36 | මුහුණුපොතේ බලපෑම නිසා සිදු වන භාෂා ගතිකත්වය පිළිබඳ විමසීමක් | සෙව්වන්දි මනෝරත්න, ඒ. |
| 37 | යථාර්ථ ප්‍රතිනිර්මාණ විධික්‍රමයක් වශයෙන් මායා යථාර්ථවාදයේ භාවිතය හා මොහාන් රාජ් මඩවලගේ නවකතා | ලක්මාලි, ඩබ්ලිව්. ජී. ඩී. එන්.<br>සේනානායක, සසී ලවන්දි |
| 38 | සද්ධර්මරත්නාවලියේ කතා රීතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්<br>(තෝරා ගත් කතා කිහිපයක් ඇසුරිනි) | නුවන්ති, ආර්. පී. එස්. |
| 39 | සම්ප්‍රදාය - නව්‍යත්වය හා ගුණදාස අමරසේකරගේ අසක්දා කව | සපුතන්ත්‍රි, අයි. එම්. |
| 40 | 'සමනල සංධ්වනිය' හා 'ඇගේ ඇස අග'යන චිත්‍රපටවලින් ප්‍රේමය පිළිබිඹු කරන ආකාරය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් | උදයකුමාර, එස්. එම්. කේ. එම්. |
| 41 | සංචාරක ව්‍යාපාරය දක්ෂිණ ලංකාවේ සංස්කෘතියට කර ඇති බලපෑම | හේමමාලි, කේ. ජී. එස්. |

| | | |
|---|---|---|
| 42 | සාම්ප්‍රදායිකත්වය නූතනත්වය හා ගළපා කවියට පීවය දුන් ලාල් හැගොඩගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනයක් | ජයවර්ධන, ආර්. ඒ. ඩී. ටී. එස්. |
| 43 | සිදත්සඟරා කතුවරයා ලිංග විග්‍රහයට දක්වා ඇති නිදර්ශන පිළිබඳ විමසුමක් | උදයංගනී කේ. ඒ. |
| 44 | සිදත්සඟරාව පද්‍යකරණය සඳහා රචිත කෘතියකි යන මතය පිළිබඳ විමසුමක් | චාන්දන, ඩබ්. |
| 45 | සිංහල පරිවර්තන සාහිත්‍යයේ මුල් නාම සහ ලේඛක නාම සම්බන්ධ තත් භාෂානුගත අධ්‍යයනයක්<br>(තෝරා ගත් රුසියානු ග්‍රන්ථ කිහිපයක් ඇසුරිනි) | ඩිල්ෂානි චතුරිකා දාබරේ, පී. |
| 46 | සිංහල භාෂාවේ හලන්ත භාවිතයේ අවගමනයට බලපෑ හේතු | කොබ්බෑකඩුව, එච්. ජී. ඒ. වී. කේ. එම්. |
| 47 | සිංහලයේ අර්ධ අනුනාසික්‍ය ශබ්ද පිළිබඳ විමර්ශනයක් | දේවානන්ද හිමි, තමාඩුවේ |
| 48 | සීගිරි කිවිඳියන්ගේ නිර්මාණ ඇසුරෙන් හෙළි වන තත්කාලීන කාන්තාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | අප්සරා සඳමාලි ආර්. පී. |
| 49 | සීගිරි ගීයේ ස්ත්‍රී-පුරුෂ අසම්මතය හා බැඳුණු මනෝ විවරණය | වරුණි වත්සලා, පී. ඩබ්. |
| 50 | සීගිරි පද්‍යයන්හි සඤ්ඤකයේ භාවිතය | කමලවීර, පී. එන්. ටී. |
| 51 | සුබ නිමිති ප්‍රකාශනයෙහි ලා හංස සන්දේශයේ අනන්‍යතාව | ලක්මාලි, ඩබ්. ජී. එස්. |
| 52 | හලාවත ප්‍රදේශයේ ධීවර සමාජය හා බැඳුණු සංස්කෘතික ගති ලක්ෂණ පිළිබඳ විමසුමක් | හිරුණිකා, ජේ. පී. පී |
| 53 | A Comparative Study on Literary Influence and Intertextuality | Wageeshani, Loku Badu Jayasuri-yage |
| 54 | Art of Writing and Letterings during Pre-Buddhist Era in Sri Lanka | Kobbekaduwe, H. G. A. V. K. M |
| 55 | Dostoevsky’s Psychology on Sinhala Cinema | Yasarathna, Hasitha Buddhini |

01

# අනුරාධපුර හා පොළොන්නරු යුගන්හි ලක්දිව පැවති නාට්‍ය කලාවේ ස්වභාවය පිළිබඳ විමසීමක්

*සුමාලි තක්ෂිලා ගුණසේකර, ඒ. පී.*[1]

මෙරට අතීතයේ පටන් විකාසනය වූ නාට්‍ය කලාවක් පැවතියේ ද යන්න විමර්ශනය කළ යුතු ප්‍රස්තුතයකි. විශේෂයෙන් ම අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි මෙරට නාට්‍ය කලාවක් පැවතියේ ද, පැවතියේ නම් එහි ස්වභාවය කෙබඳුදැයි අධ්‍යයනය වැදගත් වේ. අනුරාධපුර යුගය වන විට ලක්දිව පුරා බුදුදහම ව්‍යාප්ත ව තිබුණු අතර බෞද්ධාගමික පුදපූජා ඇසුරින් නාට්‍ය කලාවේ ප්‍රභවයට මඟ සැලසුණු අයුරු නිරීක්ෂණය කළ හැකි ය. මෙරට බෞද්ධ වන්දනාමානවල නාට්‍යමය රංගනයට ප්‍රමුඛස්ථානයක් හිමි වූ අතර මේ ඇසුරෙන් බිහි වූ නාට්‍ය කලාවේ ස්වභාවය පිළිබඳ ව අපගේ අවධානයට ලක් විය යුතු ය. අනුරාධපුර සමයේ රජ දරුවන් නාටක ජනයා පිරිවරාගෙන සිටි බවට ද කරුණු හඳුනාගත හැකි අතර කාවන්තිස්ස රජතුමා සමඟ මහා මංගල චෛත්‍යයේ ධාතු නිධානෝත්වසයට ද රුවන්මැලි සෑය නිමවන අවස්ථාවට ද නාටක ජනයාගේ සහභාගිත්වය ලැබුණු බව දක්නට ලැබේ. අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි මෙරට පැවති නාට්‍ය කලාවේ ස්වභාවය පිළිබඳ කරුණු විමසීමේ අරමුණින් සිදු කරනු ලබන මෙම පර්යේෂණයේ දී එම යුගයන් පිළිබඳ රචිත විවිධ සාහිත්‍යමය හා ඓතිහාසික කෘති ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් භාවිත කෙරුණු අතර ලක්දිව නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ රචිත කෘති ද්විතීයික මූලාශ්‍රය වශයෙන් පරිශීලනය කෙරිණි. මෙම මූලාශ්‍රය මඟින් අනාවරණය වූ පරිදි වර්තමානයේ මෙන් දියුණු වූ විදග්ධ නාට්‍ය කලාවක් එකල දක්නට නොලැබුණු බව පෙන්වා දිය හැකි ය. පුද පූජා ආශ්‍රිත ව ගොඩනැගුණු නාට්‍ය කලාවේ ආරම්භයට මං සලකුණු තනා දෙන අකාරයේ නාට්‍ය කලාවක් අනුරාධපුර පොළොන්නරු යුගයන්හි පැවති බව මෙහි දී තහවුරු වේ.

ප්‍රමුඛ පදඃ පුදපූජා, නාටක ජනයා, ලක්දිව නාට්‍ය, අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය,

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

## 02

## අලුත් සහල් මංගල්‍යය පිළිබඳ අධ්‍යයනයක්.

*දිල්හානි, එච්. පී.*[1]

ගොවි ජනතාවෝ කෙත සහ බැත සම්බන්ධ සියලු ම සුබ අවස්ථාවල දී සශ්‍රිකත්වය අපේක්ෂා කළහ. ක්‍රිස්තු පූර්ව පන්දහසකටත් පෙර පැවැති මොහෙන්දොජාරෝ හරප්පා ශිෂ්ටාචාර යුගවල දී ද මිනිසා 'ජගන්මාතා වන්දනාව' පැවැත්වූයේ ගොවිතැනේ සශ්‍රිකත්වය සහ සෞභාග්‍යය අපේක්ෂාවෙනි. සුබ දිනෙක සුබ නැකතකින් කැපූ රන්වන් ගොයමෙන් අලුත් සහල් පිළියෙල කොට අලුත් බත් පිස බුදුන් සහ දෙවියන් පිදීම අලුත් සහල් මංගල්‍යයේ දී සිදු වේ. මහින්දාගමනයත් සමග හෙළ ගොවි ජනතාව අතර පැරණි දඹදිව ගොවි ජනතාව දැක්වූ උතුම් පුද සිරිත, සිරිතක් සේ මුල් බැස ගත්තේ ය. අලුත් සහල් මංගල්‍යය විවිධ පළාත්වල කමත, විහාර, දේවාල, නිවෙස යන විවිධ ස්ථානවල සිදු කරනු ලබයි. අලුත් සහල් මංගල්‍යය එක ම ස්ථානයක සිදු නොකර කමත, විහාර, දේවාල, නිවෙස යන විවිධ ස්ථානවල පැවැත්වීමට හේතුවක් තිබිය යුතු ය. මම මෙහි දී වයඹ පළාතේ ප්‍රදේශ කිහිපයක් අධ්‍යයනය සඳහා යොදා ගත්තෙමි. විවිධ පළාත්වල අලුත් සහල් මංගල්‍යය විවිධ ස්ථානවල පවත්වන බව නිරීක්ෂණය කිරීමෙන් දැක ගත හැකි විය. එයට හේතු වූ පසුබිම සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. බෞද්ධ සංකල්පයකින් උපත ලද්දක් වුව ද අලුත් සහල් මංගල්‍යය දෙවියන් උදෙසා කෙරෙන පූජා විධියක් ලෙස ද ව්‍යාප්ත විය. ගොවියා තම කුඹුරු යායේ කිරි ඉතිරවීම සිදු කළේ ගොවිතැනේ ප්‍රධාන අංග වූ වැව හා කෙත ආරක්ෂා කර ගැනීමට දෙවියන්ගෙන් ලද ආශිර්වාදයට කෘතගුණ සැලකීමක් වශයෙනි. එමෙන් ම ගොවියෝ තම කුඹුරුවල අස්වැන්න නිවසට ගෙන ගොස් කමතේ දී ම බුදුන්වහන්සේ වෙනුවෙන් වී සහල් කර එම සහල් එකතු කොට ගමේ සියලු දෙනාගේ සහභාගීත්වයෙන් මෙම මංගල්‍යය පවත්වති. බෞද්ධ හා හින්දු දහම අනුව සෙසු පූජනීය ස්ථානවල ද වගා කන්නයෙන් කන්නයට අලුත් සහල් මංගල්‍යය පැවැත්වීමෙන් ගොවිතැනට මෙන් ම ගොවි ජනතාවට ද ආශිර්වාදයක් මෙන් ම ශාන්තියක් ද අපේක්ෂා කෙරෙන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ අලුත් සහල් මංගල්‍යය, පූජා මංගල්‍යය, ගොවි ජනතාව, අස්වැන්න, ජගන්මාතා වන්දනාව.

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*

## 03

# "ඊඩිපස් රජ" නාට්‍යය සහ "ප්‍රතිමා ගෘහය" කෙටිකතාව යන නිර්මාණ ද්වයේ අත්දැකීම ඉදිරිපත් කෙරෙන ආකාරය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

*දසනායක, ඩබ්. ඩී. එන්. එම්.*[1]

ග්‍රීක නාට්‍යකරු සොෆොක්ලිස්ගේ 'ඊඩිපස් රජ' නාට්‍යය සහ සුසන්ත මහඋල්පතගේ 'සඳකත් පවුර' කෙටිකතා සංග්‍රහයේ එන 'ප්‍රතිමා ගෘහය' කෙටිකතාව මඟින් විවරණය වන්නේ මවක සිය පුතුගෙන් මව් පදවිය ලැබීම යන සමාන අත්දැකීමකි. එය ඉදිරිපත් කර ඇති ආකාරය පිළිබඳ විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. 'ඊඩිපස්' කතුවරයාට අනුව හිත් පිත් නැති දෛවය මිනිසාට මෙවැනි දුර්දසාපන්න ඉරණමක් අත් කර දුන්න ද සහෝදරයන් වූ මව්පියන්ගේ ලේ උරුමය පවා මෙවැනි ඉරණමක් උදාකර දෙන බැව් 'ප්‍රතිමා ගෘහය' කතුවරයා විවරණය කරන ආකාරය පිළිබඳ අවධානය යොමු කෙරේ. සම්භාව්‍ය නිර්මාණකරුවෙකුගේ සහ ආධුනික ලේඛකයෙකුගේ සමාන අත්දැකීමක් වුව කෘති දෙක මඟින් ම ඒ සඳහා වූ හේතුකාරක ඉදිරිපත් වේ. පුතු අතින් මව ගැබ් ගැනීම, දෙදෙනා සෝචනීය අවසානයකට මුහුණ දීම, ආදිය මෙකී කෘති ද්වයය මඟින් නිරූපණය කෙරේ. තතු නොදත් ඊඩිපස් රජු සිය පියා මරණයට පත් කිරීම, මව හා විවාහ වී දරුවන් ලැබීම හා තතු දැන දෙදෙනා ම දුක්ඛිත අවසානයක් උරුම කර ගැනීම ආදිය දෛවයේ සරදමින් සිදු වූවකි. ඊඩිපස් කතු සියල්ල දෛවයට බාර දුන්න ද නිසි කල දරුවන්ගේ අවශ්‍යතා සපුරා නොදීම, ප්‍රකෘති සමාජය දරුවන්ට විවර නොකිරීම, මව්පිය යුතුකම් ගිලිහී යෑම මෙන් ම ලේ උරුමය පවා මෙවැනි ඉරණමක් අත් කර දෙන බැව් 'ප්‍රතිමා ගෘහය' කතුවරයා විවරණය කරයි. මෙම අධ්‍යයනය සඳහා ආරියවංශ රණවීර විසින් සිංහලයට පරිවර්තනය කරන ලද 'ඊඩිපස් රජ' නාටකය සහ සුසන්ත මහඋල්පතගේ 'ප්‍රතිමා ගෘහය' කෙටිකතාව මූලාශ්‍රය කොට ගැනේ. මෙම නිර්මාණ ද්විත්වය සංසන්දනාත්මක ව අධ්‍යයනයේ දී විශාල කාල පරාසයකට අයත් නිර්මාණරුවන් දෙදෙනෙකු සම අත්දැකීමක් පාදක කොට ගත්ත ද එකී අත්දැකීම තහවුරු කරනු වස් සමකාලීන විශ්වාස හා සමාජ විපර්යාසයන් සාධාරණ හේතු ලෙස දක්වා ඇති බව නිරීක්ෂණය කළ හැකි ය.

ප්‍රමුඛ පද : ඊඩිපස් රජ, ප්‍රතිමා ගෘහය, දෛවය, සමාජ විපර්යාසය, සමකාලීන විශ්වාස

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, සිංහල අධ්‍යයනාංශය,* nisadassanayake129@gmail.com

# 04

# 'ඊඩිපස්' හා 'රත්නාවලී' නාට්‍යද්වයෙහි ගැටුමෙහි සාදෘශ්‍යතාව හා දෘෂ්ටියෙහි විසදෘශ්‍යතාව

*උදයකුමාර, එස්. එම්. කේ. එම්.* [1]

ග්‍රීක නාට්‍යකරු සොෆෝක්ලීස්ගේ 'ඊඩිපස්', සම්භාව්‍ය අපරදිග නාට්‍ය කෘතියකි. 'රත්නාවලී' පෙරදිග සම්ප්‍රදායට අයත් හර්ෂදේවයන්ගේ දෘශ්‍යකාව්‍ය නිර්මාණයකි. රත්නාවලී නාට්‍යය, භරත මුනිවරයාගේ නාට්‍යශාස්ත්‍රීය සිද්ධාන්ත මනාව භාවිත කළ ප්‍රශස්ත නිර්මාණයකි. ඇරිස්ටෝටල් ස්වකීය කාව්‍යශාස්ත්‍රයේ අග්‍රගන්‍යතම ශෝකාන්තය ලෙස නම් කර ඇත්තේ 'ඊඩිපස්' නාට්‍යයයි. ඊඩිපස් හා රත්නාවලී තුලනාත්මක ව අධ්‍යයනයේ දී සන්දර්භය හා අභිලාෂ වශයෙන් සාදෘශ්‍ය ලක්ෂණ උසුලන බව පෙනෙයි. ඊඩිපස් රජු දෛවයෙහි සරදමින් පීඩා විඳි සානුකම්පිත චරිතයකි. දෛවය, ඉරණම, කර්මය නිසර්ගසිද්ධ උරුමයක් ද නැතහොත් අදෘශ්‍යමාන බලවත් හස්තයක අනුල්ලංඝනීය ආක්‍රමයණයක්දැයි නිර්ණය කිරීම සුකර නොවේ. යථාර්ථවාදී දෘෂ්ටි කෝණයෙන් සමස්තය නිර්ණය කිරීම අපරදිග සාහිත්‍ය නිර්මාණයන්ට පොදු ලක්ෂණයකි. දෛවය පිළිබඳ ඊඩිපස් නාට්‍ය නිර්මාණය ඔස්සේ සොෆෝක්ලීස්, සහෘදයා සුපෝෂණය කරනු ලබන්නේ යථාර්ථවාදී චින්තනයෙනි. උදේනි රජු දෛවයෙන් සන්තෘෂ්ටිය ලද භාග්‍යවන්තයෙකි. දෛවයෙහි සරදමට ගොදුරු වූ රත්නාවලී අනවරත අනපෙක්ෂිත සිද්ධි සන්තතියකින් පීඩාවට පත් වේ. එහෙත් නාට්‍යාවසානය සුඛාන්තයක් වේ. දෛවය හා ඉරණම යන සංකල්පීය ගැටුම කෙන්ද්‍රය වූ මේ නාට්‍යද්වයේ දී 'ඊඩිපස්', දුක්ඛාන්ත වීමටත් 'රත්නාවලී' සුඛාන්ත වීමටත් බල පෑ හේතු සාධක ගවේෂණය කළ යුතු වේ. 'ඊඩිපස්' නාට්‍ය නැරඹූ ප්‍රේක්ෂකයෝ සානුකම්පිත වූහ. එපමණක් නොව එමගින් ඔවුහු ජීවිතාවබෝධය ලබා ගත්තෝ ය. රත්නාවලී නාටිකාවේ ඉරණමට සමපාත සිද්ධීන්හි ආවසානික අග්‍රඵලය සුඛාන්තයකි. සහෘදයා අනන්දයෙන් ප්‍රඥාව කරා මෙහෙය වීමේ ගුණයෙන් ආඪ්‍ය වීම එහි මුඛ්‍ය ලක්ෂණයකි. යථාරූපී චින්තනය අනුගමනය කළ අපරදිග නාට්‍ය සම්ප්‍රදාය තුළ දී ඉරණම අනුව සියල්ල සිදු වේ. එහි දී නාට්‍යකරුවා ඛේදාන්තයක් නිර්මාණය කරයි. යථාරූපී බව පසෙක ලා පෙරදිග නාට්‍යකරුවා සුඛාන්තයක් නිර්මාණය කරයි. නාට්‍යද්වයෙහි අරමුණ ඒකස්වරූපී වුව ද නාට්‍යදෘෂ්ටීන්හි පවත්නේ විසදෘශ්‍යතාවකි. මේ අනුව පෙනී යන්නේ ද්විතීය සාම්ප්‍රදායික ළදරු සමාජයේ උපත ලද්දා වූ රසිකත්වය තුළ ඉරණම යනු දේව හස්තයක් බවයි. එය හුවා දැක්වීමට නාට්‍යකරුවා ස්වකීය සමකාලීන සමාජ තත්ත්වයන්ට අනුගත ව ස්වකීය නාට්‍ය නිර්මාණ බිහි කළ බව පෙනේ. මිනිසා හා අදෘශ්‍යමාන සංසිද්ධීන්හි සට්ටනය සාහිත්‍යකරුවා ස්පර්ශ කර ඇති ආකාරය ඊඩිපස් හා රත්නාවලී මඟින් ගවේෂණය කිරීම මෙහි මුඛ්‍යාභිලාෂය වේ. මේ සඳහා 'ඊඩිපස්' හා 'රත්නාවලී' නාට්‍ය පෙළ ඇතුළු ප්‍රාථමික මූලාශ්‍රයන් ද, ග්‍රීක නාට්‍ය කලාව හා තදනුබද්ධ අවශේෂ සාහිත්‍ය නිර්මාණ ද, පෙරදිග නාට්‍ය සාහිත්‍යය ද ද්විතීයික මූලාශ්‍රය ලෙස භාවිත කෙරේ.

ප්‍රමුඛ පදඃ සාදෘශ්‍යතාව, දෘෂ්ටිය, විසදෘශ්‍යතාව, සුඛාන්තය, ගැටුම

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, සිංහල අධ්‍යයනාංශය.* koshila.madushani11@gmail.com

## 05

# උම්මග්ග ජාතකයේ මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව රාජ්‍ය පාලනය කෙරෙහි පරිභාවිත ආකාරය පිළිබඳ විමසීමක්

*රුවන්ගිකා හේමමාලි දිසානායක, ජී. ඩබ්.*[1]

ජාතක පොතෙහි දක්වෙන 547ක් පමණ වූ ජාතක කථා අතර දීර්ඝතර සහ ප්‍රඥාවේ මහිමය විශද වන ජාතක කථාවක් වශයෙන් උමංදාව හඳුන්වා දිය හැකි ය. උමං කර්මාන්තයක් පිළිබඳ මෙහි සඳහන් වීම නිසා උම්මග්ග යන නාමය මෙම ජාතක කථාවට ලැබී ඇති බවට මතයක් වේ. උමංදාව මඟින් විවරණය කරනු ලබන්නේ මහෞෂධ නම් පඬිතුමාගේ ප්‍රඥා මහිමයයි. මහෞෂධයන්ගේ ප්‍රඥා මහිමයෙන් නොවිසඳිය හැකි ගැටලුවක් මිහිපිට නොවූ තරම් ය. උමංදාවෙහි මහෞෂධ චරිතයේ විවිධ පැතිකඩ ඔස්සේ ප්‍රඥාව විශද වන අවස්ථා පිළිබිඹු වේ. සමාජ අවබෝධය මඟින් ඇති වන ප්‍රඥාව හා තර්කානුකූල ප්‍රඥාව මහෞෂධ චරිතයේ නිරන්තරයෙන් දක්ක ගත හැකි වන අතර රාජ්‍ය පාලනය කෙරෙහි එම චරිතයෙන් විශද වන ප්‍රඥාව මූලික වේ. උම්මග්ග ජාතකය පිළිබඳ ලියැවුණු විචාර හා නිබන්ධ ආදිය ද ඒ හා සම්බන්ධ ප්‍රාථමික මූලාශ්‍රය ද ද්විතීයික මූලාශ්‍රය ද ඇසුරු කර ගනිමින් එකී කරුණ පිළිබඳ ව විමසීමක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මහෞෂධ පඬිතුමා රජු හා නිරන්තර සම්බන්ධ වෙමින් රාජ සභාවේ කටයුතු කළ බුද්ධිමත් පඬිවරයෙකු නිසා ඔහුගේ ප්‍රඥාව රාජ්‍ය පාලනය විෂය තුළින් බහුල ව විශද වේ. උම්මග්ග ජාතක කථාවේ අවසානයේ දී තම ප්‍රඥා මහිමය තුළින් තම රටත් රජුත් මහජනතාවත් ආරක්ෂා කර තමාත් ආරක්ෂා වන්නේ රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් ඔහු තුළ තිබූ ප්‍රඥාව මැනවින් පෙන්වා දෙමිනි. මෙම කරුණු අනුව පෙනී යන්නේ රාජ්‍ය පරිපාලනය කෙරෙහි මහෞෂධයන් තුළ තිබූ ප්‍රඥා ශක්තිය උම්මග්ග ජාතකයෙන් ඉස්මතු වී පෙනෙන බවයි.

ප්‍රමුඛ පද : උම්මග්ග ජාතකය, මහෞෂධ පඬිතුමා, ප්‍රඥාව, රාජ්‍ය පරිපාලනය, චරිත

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය.*

06

# ඌවේ යක්කාරි ශාන්තිකර්මය හා බැඳි පූජාවිධි රටාව

*ලක්මාලි, ඩබ්. ජී. ඩී. එන්.*[1]

ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත ව පවතින දේශීය ශාන්තිකර්මවලින් සශ්‍රීකත්වය, රෝග නිවාරණය හා සාඵල්‍යතාව ප්‍රධාන වශයෙන් අපේක්ෂා කෙරේ. සෞභාග්‍යය හා සශ්‍රීකත්වය අරභයා හැම වර්ෂයක් පාසා ම දිවස් අඹරාපති සහ පත්තිනි දේව මෑණියන් උදෙසා සිදු කෙරෙන යක්කාරිය ඌව පළාතට ආවේණික ප්‍රාදේශික ශාන්තිකර්මයකි. වළගම්බා රජ සමයේ පටන් ම ඌවේ ජනයාගේ දැඩි ලෙස විශ්වාසයට පාත්‍ර ව තිබූ දේව ඇදැහිල්ලක් ලෙසින් ද යක්කාරිය හැඳින්විය හැකි ය. වර්තමානය වන විට ඌවේ ජන සමාජයෙන් ක්‍රමික ව වියැකී යමින් පවතින සංස්කෘතික අංගයක් වශයෙන් යක්කාරිය හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ ශාන්තිකර්ම පිළිබඳ විවිධ විද්වතුන්ගේ අවධානය යොමු වුවත් ඌවට ම ආවේණික යක්කාරි ප්‍රාදේශික ශාන්තිකර්මය පිළිබඳ විධිමත් ගවේෂණයක් මෙතෙක් සිදු වී නොමැත. ඌව පළාතේ ස්ථාන කිහිපයක ම මේ ශාන්තිකර්මය පැවැත්වුව ද මේ ගවේෂණයේ පහසුව උදෙසා වැලිමඩ ප්‍රදේශයට අයත් ඌව පරණගම ප්‍රාදේශික ලේකම් කොට්ඨාසයේ බලගල ග්‍රාමයේ දිවස් අඹරාපති දේවාලයේ වාර්ෂික යක්කාරි ශාන්තිකර්මය පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරේ. ඒ සඳහා දේවාලයේ කපු මහතුන්, අවට විහාරස්ථානවල විහාරාධිපතිවරුන් හා ගම්වාසීන් හමු වී සිදු කරන සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි උපයෝගී කර ගැනීමටත් යක්කාරි ශාන්තිකර්මය නැරඹීමෙන් අදාළ ගවේෂණය සිදු කිරීමටත් අපේක්ෂා කෙරේ. දිගු ඉතිහාසයකට උරුමකම් කියන යක්කාරි ශාන්තිකර්මයට ආවේණික ආචාර විද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක පද්ධතිය හෙළි පෙහෙළි කිරීමත් ශ්‍රී ලංකාවේ සැඟව පවතින යක්කාරි ශාන්තිකර්මය නැමැති දේශීය සංස්කෘතික දායාදය ඉස්මතු කිරීමත් මේ පර්යේෂණයේ මූලික අරමුණයි.

ප්‍රමුඛ පදඃ ඌව, යක්කාරිය, ශාන්තිකර්මය, දේව ඇදැහිල්ල, දිවස් අඹරාපති

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* wgdnwerallagedara@gmail.com

## 07
# කතරගම දේව විශ්වාසය හා තවලම

*ලක්මාලි, ඩබ්. ජී. ඩී. එන්.*[1]

වසර 2500කට වඩා උරුමකම් කියන දෙස් විදෙස් බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ කතරගම පුදබිම ලොව ඇති එක ම සර්ව ආගමික කේන්ද්‍රස්ථානය ලෙස හැඳින් වේ. කතරගම දෙවියන් තරම් ශ්‍රී ලාංකේය ජනයාට සමීප වූ දෙවියෙකු නොමැති බැවින් කුඹුරුවලින් ලබා ගන්නා වී අස්වැන්න ඉඳුල් නොකර කතරගම දෙවියන් උදෙසා වෙන් කිරීම අතීතයේ පටන් ගැමියන් විසින් සිදු කරනු ලබන කටයුත්තකි. නවීන තාක්ෂණික දියුණුවත් සමඟ ලෝකය පුරා මහාමාර්ග හා ප්‍රවාහන පහසුකම් දිනෙන් දින වැඩි දියුණු වුව ද වසර 2244ක් පුරා අඛණ්ඩ ව කතරගම දේවාලයට අයත් නින්දගම් ඉඩම්වලින් අස්වැන්න රැගෙන එන්නේ ගොනුන් බැඳි තවලමෙනි. එසේ වීමට බලපෑ සුවිශේෂ හේතුවක් ලෙස හඳුනා ගත හැක්කේ කතරගම දේවාලය ඉදි කළ දුටුගැමුණු මහ රජතුමාගේ අණනියමයන් අදටත් එලෙසින් ම දේවාල භූමියේ ක්‍රියාත්මක වීමයි. කතරගම දෙවියන් හා කතරගම දේව විශ්වාස පිළිබඳවත් කතරගම මහ දෙවොල පිළිබඳවත් විවිධ විද්වතුන්ගේ අවධානය යොමු වුවත් කතරගම දේව විශ්වාසය හා බැඳි තවලම පිළිබඳ ව පුළුල් පර්යේෂණයක් මෙතෙක් සිදු වී නොමැති බැවින් ඒ පිළිබඳ මාගේ අවධානය යොමු විය. ඒ සඳහා කතරගම දේවාලය භාර කපු මහතුන්, කතරගම දේවාලයේ මහ බෙත්මෙ, කුඩා බෙත්මෙ, තවලම් මුහන්දිරම්වරු, දේවාලයේ අධිකාරම් නිලමේවරු හා කතරගම මාධ්‍යවේදී කේ. ඩී. දේවප්‍රිය මහතා හමු වී සිදු කළ සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මඟින් කරුණු එක් රැස් කළ අතර ම කතරගම දේවාලය සම්බන්ධ ව ලියැවුණු ඉතිහාස කෘති හා අන්තර්ජාලය හරහා දත්ත ගවේෂණය සිදු කළෙමි. දිගු ඉතිහාසයකට උරුමකම් කියන කතරගම මහ දෙවොල හා බැඳි තවලමේ ඉතිහාසයත්, ඊට ආවේණික සංස්කෘතියත් චාරිත්‍රවාරිත්‍ර හෙළිපෙහෙළි කිරීමත් අනාගත පරපුර සඳහා මෙම සංස්කෘතික දායාදය සුරක්ෂිත කිරීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණයි.

ප්‍රමුඛ පදඃ කතරගම පුදබිම, කතරගම දෙවියන්, තවලම, දුටුගැමුණු මහරජ, අණනියමයන්, දේව විශ්වාසය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* wgdnwerallagedara@gmail.com

# 08

# කර්තෘගේ මරණය හා ඩේවිඩ් කොපර්ෆීල්ඩ් නවකතාව

***කවීශ්වර, සුදේශ්.*** [1]

බටහිර සාහිත්‍ය විචාරයේ යුගානුරූපී ගලා යාම අතුරෙහි විටෙක කර්තෘ ද විටෙක පඨිතය ද සිය ඒකාධිකාරය තහවුරු කළේ ය. ව්‍යුහවාදයෙන් පසු ව මතු වූ පශ්චාත් ව්‍යුහවාදයේ දී පඨිතයෙහි අර්ථ පද්ධතිය ජනනය කිරීමට කර්තෘ නැමැති හැඟවුම්කාරකයට ඇති බලය විතැන් වී ගියේ ය. එනම් කෘතිය සම්බන්ධයෙන් කර්තෘට තිබූ හිමිකම ක්ෂය වීමයි. භාෂාත්මක ව්‍යුහය මුල් කර ගෙන, පාඨකයා කෘතියේ අර්ථ ජනනය කිරීම මෙහි මූලික ලක්ෂණයයි. ව්‍යුහවාදයේ දී හඳුනා ගත් හැඟවුම (Signifier) හා හැඟවුම්කාරකය (Signified) යන සංඥාද්වයෙහි දිගුව පශ්චාත් ව්‍යුහවාදයේ දී දක ගත හැකි වේ. එහෙත් එහි භාවිතය ව්‍යුහවාදයට වඩා වෙනස් අයුරකින් ක්‍රියාත්මක වේ. පශ්චාත් ව්‍යුහවාදී විචාරකයෙකු ලෙස රෝලන්ඩ් බාත්ට (Roland Barthes) හිමිවන්නේ විශේෂ ස්ථානයකි. පඨිතය හා පාඨකයා අතර තිබූ ඓතිහාසික සම්බන්ධය බාත් විසින් උඩුයටිකුරු කරන ලද්දේ කර්තෘගේ මරණය සනිටුහන් කරමිනි. ඔහු ප්‍රකාශ කරන්නේ "පාඨකයා උපත ලබන්නේ කර්තෘගේ අභාවය තුළින්" බවයි. සියවස් ගණනාවක් තුළ කතුවරයා නමැති පාලක හැඟවුම (Master Signifier) විසින් ගල් ගස්වන ලද පඨිතයෙහි අර්ථ පද්ධතිය ඔහුගෙන් ගලවා දැමීමට බාත්ට හැකි විය. පඨිතය කර්තෘගෙන් ගලවා දමා බාධා කිරීමෙන් හා සීමා කිරීමෙන් තොර ව කෘතියෙහි බහු අර්ථ ජනනය කිරීමට පාඨකයාට මින් ඉඩ ප්‍රස්තාව සැලසේ. යථාර්ථවාදී සාහිත්‍යයේ කැපී පෙනෙන නවකතාකරුවකු වන චාල්ස් ඩිකන්ස්ගේ ජීවිත කතාවයැයි විචාරකයන් අදහස් කරන 'ඩේවිඩ් කොපර්ෆීල්ඩ්' (David Copperfield) නවකතාව මෙහි දී විචාරයට ලක් කෙරෙයි. තත් නවකතාවේ අසංක්ෂිප්ත සිංහල පරිවර්තනයක් ඇම්. ඇම්. පියවර්ධන මහතා විසින් සිදු කරන ලද්දේ ය. බාත්ට අනුව ඩිකන්ස්ගේ නවකතාවේ ගැබ් වන කර්තෘගේ හඬ (Voice) ඝාතනය කොට පඨිතය තුළින් ම අර්ථය ජනනය කිරීම පිළිබඳ විමසීම මේ පර්යේෂණයේ අරමුණයි. මේ සඳහා මූලාශ්‍රය ලෙස සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමත් තත් විෂය හා සම්බන්ධ විද්වතුන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවනුත් උපස්තම්භක කොට ගැනේ. ඩිකන්ස්ගේ ජීවිත කතාව ලෙස නොගෙන නවකතාවේ අර්ථ මතු කළ නොහැකි ද යන්න මෙහි දී විශේෂයෙන් විමසනු ඇත. එනම් කර්තෘගේ හඬ ඉවත් කිරීම සිදු වන්නේ ය. භාෂාවේ හැඟවුම්කාරකවල බහු අර්ථ තිබීමත් පාඨකයා හුදෙක් කෘතිය අකර්මන්‍ය ලෙස කියවීමත් අර්ථ උත්පාදනයේ දී පාඨකයාගේ පරිකල්පනය කෙතරම් වැදගත් වන්නේ ද යන්නත් උක්ත නවකතාව මඟින් විමර්ශනයට ලක් කෙරේ. විශේෂයෙන් ම මෙහි දී පාඨකයාගේ නිර්මාණශීලී හැකියාව කෙලෙස කැපී පෙනෙන්නේ ද යන්න අවධානයට ලක් කරනු ඇත.

ප්‍රමුඛ පද: පශ්චාත් ව්‍යුහවාදය, හැඟවුම හා හැඟවුම්කාරකය, රෝලන්ඩ් බාත්, කර්තෘගේ හඬ, කර්තෘගේ මරණය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සාහිත්‍ය විචාරය, සිංහල අධ්‍යයනාංශය.* sdkaweeshwara@gmail.com

09

# කරුවල ගෙදර නවකතාවෙන් නිරූපිත ග්‍රාමීය සමාජ විපර්යාසය

*කෞශල්‍යා, එස්. එස්.*[1]

මාර්ටින් වික්‍රමසිංහ වර්ෂ 1963 දී රචනා කළ කරුවල ගෙදර නවකතාවට අන්තර්ග්‍රහණය කර ගෙන ඇති විෂය පථය වනුයේ ගම්පෙරළිය (1944) නවකතාවෙන් පිළිබිඹු නොකළ ග්‍රාමීය සමාජ පරිස්ථිතියයි. සමාජයේ පහළ ම තත්ත්වයේ සිටි පිරිස් වෙළඳාමට පිවිසීම හේතුවෙන් හිස එසවූ නව වාණිජ කුලය ධනපති පන්තිය නියෝජනය කළේ ය. ධනවාදයේ නැතහොත් වාණිජ කුලයේ නැගී සිටීම සමස්ත සමාජයට ම එක හා සමාන ව බලපෑ අතර එමඟින් ග්‍රාමීය වැසියන්ගේ ආර්ථික, සමාජ, දේශපාලන සහ අධ්‍යාපන යනාදී අංශයන්ගේ විශාල වශයෙන් වෙනස්කම් සිදු විය. ධනේශ්වරයේ බලපෑමෙන් සිදු වූ සමාජ විපර්යාසයේ එක්තරා පැතිකඩක් කරුවල ගෙදර මඟින් නිරූපණය කර ඇති ආකාරය විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. මාර්ටින් වික්‍රමසිංහ රචනා කරන ලද කරුවල ගෙදර නවකතාව ප්‍රාථමික මූලාශ්‍රය සහ ඒ පිළිබඳ ව ලියවුණු වෙනත් විචාර කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන මෙම අධ්‍යයනය සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මෙහි එන තිනන්ගේ චරිතයෙන් පිළිබිඹු කෙරෙනුයේ ධනේශ්වරයේ ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය ධනපති පන්තියක් උද්භවය වූ ආකාරයයි. එමෙන් ම මෙහි එන රතු හාමි, පොඩි හාමිනේ, සිරිමල්, නිමල් යනාදිහු මෙකී සමාජ විපර්යාසයට හසු වූවෝ ය. මෙහි දී ග්‍රාමීය සමාජ පරිස්ථිතිය හා මානුෂීය සබඳතාවන් සියුම් ලෙස විග්‍රහ කිරීමට වික්‍රමසිංහ කරුවල ගෙදර නවකතාවේ කතා විකාසනය සහ චරිත නිරූපණය යොදා ගෙන ඇති අයුරු ද නිරීක්ෂණය කළ හැකි ය. ග්‍රාමීය ධනපතීන්ගේ නැගී සිටීමත්, ඔවුන් ග්‍රාමීය සමාජයේ ස්ථාවරත්වයක් ඇති කර ගත් ආකාරයත්, ග්‍රාමීය ධනපතීන්ගේ දරුවන් ඉහළ ධනපති පන්තියට ඇතුළත් වීමට හා ප්‍රාදේශීය දේශපාලනයට ඇතුළත් වීමට දැරූ උත්සාහයත් කරුවල ගෙදර නවකතාවෙන් හෙළිදරව් කර ගත හැකි ය.

ප්‍රමුඛ පද : මාර්ටින් වික්‍රමසිංහ, ධනේශ්වරය, වෙළඳාම, ග්‍රාමීය ධනපතීන්, සමාජ යථාර්ථය

1 *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සාහිත්‍ය විචාරය, සිංහල අධ්‍යයනාංශය,* kaushi.uok@gmail.com

## 10

# කිරම ධම්මානන්ද හිමියන් සහ උන්වහන්සේගෙන් සිදු වූ සාහිත්‍ය සේවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

***ඉසංකා සංජීවනී, කේ.***[1]

සිංහල සාහිත්‍යය විෂයෙහි ගෙන බලන විට දී විශේෂයෙන් ම රාජධානි පැවති ආකාරය අනුව සාහිත්‍ය යුග ද හඳුන්වා දීමක් සිදු විය. එනමුදු රාජධානි අනුව මාතර යුගය නමින් වෙන ම රාජධානි යුගයක් හඳුන්වා දී නොතිබුණ ද මාතර ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ලියැවුණු සාහිත්‍යය, මාතර යුගයේ සාහිත්‍යය යනුවෙන් ඇතැම් විද්වත්හු පවසති. 18 වැනි ශතවර්ෂයේ අපර භාගයේ සිට 19 වැනි ශතවර්ෂයේ පූර්ව භාගය තෙක් ලක්දිව ධර්ම ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය මාතර නගරයයි. ඉහත කාල පරිච්ඡේදය තුළ ලංකාවේ ලියැවුණු පොතපත අතුරින් ඉතා වැඩි කොටසක් පද්‍ය සාහිත්‍ය කෘතීන් ය. ඉන් බොහෝමයක් රචනා කෙරුණේ මාතර ප්‍රදේශයෙහි උපන්නා වූ ගිහි පැවිදි උගතුන් විසිනි. සිටිනාමළුවේ ධම්මජෝති, කරතොට ධම්මාරාම, බෝවල ධම්මානන්ද, අකුරැස්සේ සුවණ්ණජෝති, ගල් ඇටඹේ පියදස්සි, සාලිඇලේ මණිරතන, මිහිරිපැන්නේ හිමි ආදි පැවිදි පිරිස ද පත්තායමේ ලේකම්, කටුවානේ දිසානායක මුදලි, තෝමස් මුහන්දිරම්, ගජමන් නෝනා, හරණ ගණිතාචාර්ය ආදි ගිහි පිරිස ද මාතර ශාස්ත්‍ර ප්‍රදීපය ඒකාලෝක කළ ද ඒ අතුරින් ද මහගු සාහිත්‍ය සේවයක් කළ පැවිදි ලේඛකයකු ලෙස කිරම ධම්මානන්ද හිමියන් හැඳින්විය හැකි ය. එනමුදු උන්වහන්සේගේ ශාස්ත්‍රීය සේවාව පිළිබඳ පුළුල් පර්යේෂණයක් මෙතෙක් සිදු වී නොමැත. එම නිසා උන්වහස්සේ විසින් රචිත සාහිත්‍ය කෘති සියල්ල අධ්‍යයනය කිරීම මාගේ අරමුණයි. ඒ සඳහා මාතර ප්‍රදේශයේ ධම්මානන්ද හිමියන් වැඩසිටි විහාරස්ථානවලට ගොස් එහි ස්වාමීන් වහන්සේලා හමු වී සිදුකරන සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මඟින් කරුණු එක්රැස් කිරීමත්, විහාරස්ථානවල පොත්ගුල්, පුස්තකාල පරිහරණයත් ඉතිහාසය, සාහිත්‍යය, ජනශ්‍රැතිය ආදි ක්ෂේත්‍ර අලළා ලියැවුණු කෘති අධ්‍යයනය කිරීමත්, අන්තර්ජාලය භාවිතය මඟින් දත්ත ගවේෂණය කිරීමත් අපේක්ෂා කරමි. මාතර යුගයේ විශිෂ්ටතම සාහිත්‍යධරයෙකු වූ කිරම ධම්මානන්ද හිමියන්ගෙන් සිදු වූ සාහිත්‍ය සේවයත්, පශ්චාත් කාලීන සාහිත්‍ය කෙරෙහි උන්වහන්සේගේ බලපෑමත් යන මාතෘකා ඔස්සේ කරුණු ගවේෂණය කිරීම මේ පර්යේෂණයේ මූලික අරමුණයි.

ප්‍රමුඛ පද: මාතර යුගය, පද්‍ය සාහිත්‍යය, කිරම ධම්මානන්ද හිමි, ශාස්ත්‍රීය සේවාව, ගිහි-පැවිදි

1 *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Isankakottage31@gmail.com

11

# ගංගාරෝහණ වර්ණනාවේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*රමණී, ඩබ්ලිව්.* [1]

මහනුවර පශ්චාත් යුගයේ (ක්‍රි. ව. 1706 - 1815) රචනා වූ අවසාන සිලෝ කාව්‍යය වන්නේ ගංගාරෝහණ වර්‍ණනාවයි. ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය අවධියට අයත් වන ක්‍රි.ව. 1806 වර්ෂයේ දී දාවිත් සරම් මුදලි නැමැත්තා විසින් නිල්වලා ගඟෙහි පවත්වන ලද ප්‍රථම ගංගාරෝහණ පූජාව වර්ණනා කිරීම මෙම කාව්‍ය නිර්මාණයේ මූලික නිමිත්ත වී ඇති අතර ඡන්දස් අලංකාර ශබ්දාර්ථ දත් කවි ජනයාගේ සිත් ගැනීම හා සත්පුරුෂ ජනයාගේ ශ්‍රද්ධාව හා සුචරිත ධර්මය වර්ධනය කිරීම කතුවරයාගේ අප්‍රධාන අරමුණු වී ඇත. මෙම කාව්‍ය බන්ධනය දොන් තෝමිස් සමරසේකර දිසානායකයන්ගේ නිර්මාණයක් වන අතර පින්කමේ නාමය මුල් කොට ගනිමින් "ගඟරු වනන" හෙවත් "ගංගාරෝහණ වර්‍ණනාව" නමින් ස්වකීය නිර්මාණය නම් කොට ඇත. මෙම සිලෝ කාව්‍ය ග්‍රන්ථය බොහෝ විචාරකයින්ගේ අවධානයට ලක් වී ඇත්තේ නිර්මාණ ලක්ෂණවලින් හීන වූ කාව්‍ය ග්‍රන්ථයක් ලෙසයි. මේ නිසා මෙම කාව්‍ය කෘතියෙහි දක්නට ලැබෙන්නේ හීන වූ ලක්ෂණ පමණක් ද? යන්න අධ්‍යයනය කිරීම මාගේ පර්යේෂණ ගැටලුවයි. සාහිත්‍ය කෘතියක සාධනීය මෙන්ම නිෂේධනීය ලක්ෂණ විමසා බැලීමේ දී එම කෘතිය රචනා වූ යුගයේ පසුබිම, යුගාවේණික සාහිත්‍ය ලක්ෂණ හා ඊට සමකාලීන සෙසු නිර්මාණාදිය පිළිබඳ මනා වූ විනිශ්චයක් තිබිය යුතු ම ය. එහෙයින් කෙතරම් විවාද පැන නැගුණ ද ගංගාරෝහණ කාව්‍ය කෘතියෙහි නිර්මාණාත්මක ලක්ෂණ ද පවතින බව ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී හඳුනා ගත හැකි ය. චිත්ත රූප මැවෙන ලෙස මනහර අවස්ථා නිරූපණය, ශබ්ද රසය ජනනය වන සාර්ථක පද්‍ය නිර්මාණ, රසවත් මෙන් ම අවස්ථාවට උචිත ස්වාධීන කාව්‍ය සංකල්ප, කවි සමයේ එන උක්තීන් උචිත ආකාරයෙන් භාවිත කිරීම ආදි වශයෙන් සාධනීය පැතිකඩක් ද අපට මෙම කාව්‍ය ග්‍රන්ථය විමර්ශනයෙන් හඳුනා ගැනීමට අවකාශය උදාවේ. මෙම පර්යේෂණ කාර්යයේ දී ගංගාරෝහණ වර්ණනාව පද්‍ය කෘතියත් ඒ සඳහා විචාරකයින් දක්වා ඇති අදහස් හා මතවාද සම්බන්ධ ලිපි ලේඛනත් අධ්‍යයනය කෙරිණි. ගංගාරෝහණ වර්ණනාව උසස් කාව්‍යයක් නොවීම කෙරෙහි හුදෙක් නිර්මාණකරුවාගේ අනවබෝධය හෝ කවි පබැඳීමේ ශක්‍යතාව හීනවීම හෝ මතු නොව, සමකාලීන සාහිත්‍යය කෙරෙහි බලපාන ලද යුගාවේණික සාහිත්‍ය ලක්ෂණ ද හේතු වී ඇති බව නිගමනය කළ හැකි ය. දුර්වල කාව්‍ය ලක්ෂණ සහිත කාව්‍ය පබැඳුමක් ලෙස ප්‍රකට වුවත් ගංගාරෝහණ වර්ණනා කාව්‍ය කෘතියෙන් නිර්මාණාත්මක ලක්ෂණ හමුවන බව මෙම පර්යේෂණයෙන් තහවුරු වේ.

ප්‍රමුඛ පදඃ සිලෝ කාව්‍ය , සාධනීය ලක්ෂණ , යුගාවේණික සාහිත්‍ය ලක්ෂණ , නිෂේධනීය ලක්ෂණ, ගංගාරෝහණ වර්ණනාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* ramaniwithanage1@gmail.com

12

# ගාර්ෂියා ලෝකාගේ (1899-1936) ග්‍රාමීය ශෝකාන්ත නාට්‍ය ත්‍රිත්වය පිළිබඳ ස්ත්‍රීවාදී කියවීමක්

*දර්ශන, කේ. ඩී.* [1]

ස්පාඤ්ඤ ජාතික නාට්‍යකරු 'ෆෙඩ්රිකෝ ගාර්ෂියා ලෝකා' (1899-1936) විරචිත නාට්‍ය අතුරින් The House of Bernada Alba, Blood Wedding, Yerma නාට්‍යත්‍රය ශෝකෝත්පාදකයේ නූතන ස්වරූපය විශද කරයි. මේ ත්‍රිකයෙන් පංති සමාජයේ ස්ත්‍රියට හිමි භූමිකාව තුන් ඉරියව්වකින් නිරූපිත ය. ලෝකාගේ උක්ත නාට්‍ය තුන ම සිංහල භාෂාවට පරිවර්තනය වී ඇති අතර ඒ The House of Bernada Alba නාට්‍යය රංජනී ඔබේසේකර විසින් 'බර්නාදාගේ සිපිරි ගෙය' (1971) නමින් ද, Blood Wedding නාට්‍යය හේමමාලි ගුණසිංහ විසින් 'තිත්ත කණේරු' (1984) නමින් ද, Yerma නාට්‍යය එදිරිවීර සරච්චන්ද්‍ර හා සුනිල් ආරියරත්න යන අය විසින් 'යෙර්මා' (1993) නමින් ද වශයෙනි. බර්නාදාගේ සිපිරි ගෙය නාට්‍යයෙන් පූර්ව වෛවාහික ස්ත්‍රිය මුහුණ දෙන අර්බුදයත්, තිත්ත කණේරු නාට්‍යයෙන් වෛවාහික ස්ත්‍රිය කෙරෙහි එල්ල වන සමාජ පීඩනයත්, යෙර්මා නාට්‍යයෙන් පශ්චාත් වෛවාහික තත්ත්වය හමුවේ ඇය මුහුණ දෙන අර්බුදයත් නිරූපිත ය. භාෂාව, සංස්කෘතිය මෙන් ම එහි උපාංග වන සාහිත්‍ය කලාවන් ද පුරුෂ නිර්මිතයන් ය යන්නත්, ඉතිහාසය පුරා ම ස්ත්‍රීත්වය නම් සංකල්පය අර්ථ විවරණය කෙරුණේ පුරුෂ අර්ථයෙන් යන්නත් සාහිත්‍යය හා සමාජය පිළිබඳ ස්ත්‍රීවාදී කියවීමේ මුඛ්‍ය අදහසයි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් උක්ත පරිවර්තන තුනත් ද්විතියික මූලාශ්‍රය වශයෙන් ඒ පිළිබඳ රචිත විචාර වියමන් මෙන් ම ස්ත්‍රීවාදය හා දේශපාලනය පිළිබඳ රචිත කෘති ද ආශ්‍රය කෙරේ. සාමූහික සමාජයක සිට පෞද්ගලික දේපොළ මත පදනම් වන සමාජයක් කරා වූ සංක්‍රාන්තියේ දී ස්ත්‍රිය දෙවැනියා වීමත්, පුරුෂයා ප්‍රමුඛයා වීමත් සිදුවුණි. එතැන් පටන් මිනිසා ලිංගික වශයෙන් තත්ත්ව නිර්ණය කෙරුණි. මේ තතු සාහිත්‍යය හා සමාජය පිළිබඳ ස්ත්‍රීවාදී කියවීම්වලට මග පෑදූ බව පෙනේ. යථෝක්ත කියවීම් පදනම් කර ගෙන ලෝකාගේ ග්‍රාමීය ශෝකාන්ත ත්‍රිත්වය, ස්ත්‍රී භූමිකාව කෙරෙහි මුඛ්‍ය අවධානය යොමු කරමින්, පුරුෂ මූලික සමාජයේ පදනම් හා ස්වභාවය ගවේෂණය කරමින් ස්ත්‍රීවාදී විමර්ෂණයකට ලක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. එම ගවේෂණයේ දී පුරුෂ මූලිකත්වය, එය නිර්මිත සමාජ පදනම හා ඒවා අතර අන්තර් සම්බන්ධය අධ්‍යයනය කරනු ලැබේ.

ප්‍රමුඛ පද : ග්‍රාමීය ශෝකාන්ත, ස්ත්‍රීවාදය, පවුල, පුරුෂෝත්තමවාදය, පංති සමාජය

*1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* kddarshanawith@gmail.com

13

# ගුත්තිල කාව්‍යයේ ගුරුගෝල ගැටුම ගුරුමුෂ්ටිය හා සම්බන්ධ වූවක් ද?

*උදේශිකා දමයන්ති, ඩී. එම්.* [1]

බුදුන්වහන්සේ බුද්ධත්වය පතා පෙරුම් පිරූ ආත්මභවයක් පිළිබඳ ව තොරතුරු කෝට්ටේ යුගයේ දී වෑත්තෑවේ හිමියන් විසින් රචනා කරන ලද ගුත්තිල කාව්‍යයෙහි අන්තර්ගත ය. උදේනි පුරයේ සිට බරණැස් පුරවරයට මූසිලයන් පැමිණෙන්නේ දෙව්ලොව පන්සිළුත් පැරදවිය හැකි අසමාන වාද්‍ය ශක්‍යතාවක් හිමි ගුත්තිල ඇදුරිඳු සොයා ගෙන ය. ඇදුරිඳු ගුරුමුෂ්ටියක් තබා නොගෙන ම ශාස්ත්‍රඥානය ලබා දුන්නේ ය. අහිංසක තරුණයා දරුණු අංගුලිමාලයෙකු වන්නේ දිසාපාමොක් ආචාර්යවරයාගේ වරදිනි. නමුදු ගුත්තිල පඬිතුමා වූ කලි ශිෂ්‍යයන් වරදට යොමු කළ අයෙකු නොවේ. සිඟාලෝවාද සූත්‍රයේ ගුරු-සිසු යුතුකම්හි සඳහන් වන ආකාරයට ගුත්තිල පඬිතුමා තමන් දන්නා සියලු ශිල්පශාස්ත්‍ර ගෝලයාට දුන් අසහාය ගුරුවරයෙකි. ගුත්තිල පඬිවරයා බේදවාචකයකට බඳුන්වන්නේ ගුරුමුෂ්ටිය නිසා ද නොඑසේ නම් ගුරු-සිසු යුතුකම්හි අඩුලුහුඬුවක් නිසා ද යන්න සෙවීම පර්යේෂණ ගැටලුවයි. මෙකී ප්‍රස්තුතය පර්යේෂණයට බඳුන් කිරීමේ දී ගුත්තිල කාව්‍යයත් ඒ ආශ්‍රයෙන් ලියවුණු ද්විතීයික හා තෘතීයික මූලාශ්‍රයනුත් ආශ්‍රය කොට ගැනේ. ගුත්තිල පඬිවරයාට සිදු වූයේ කුමක් ද යන්න සෙවීමට ගුත්තිල කාව්‍යයේ ආරම්භයේ සිට අවසානය දක්වා අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ. ගුත්තිල කාව්‍යයේ දී ගුත්තිල පඬිවරයා අසරණ වූයේ ගුරුමුෂ්ටිය තබා නොගෙන ඉගැන්වූ නිසා ය යන්න සනාථ කිරිම මගේ පර්යේෂණයේ අරමුණයි. ගුරු-සිසු යුතුකම් මැනවින් ඉටුවූයේ නම් එදා ආචාර්යවරයා අසරණ වන්නේ නැත. ගුරුවරයා ගුරුමුෂ්ටිය තබා නොගෙන දන්නා සියල්ල ගෝලයාට ලබා දෙන්නේ නම් ගෝලයාගේ යුතුකම ගුරුවරයාට ඉහළින් යාම නොව ගුරු ගෞරවය දැක්වීමයි. අතීතයට මෙන් ම වර්තමානයට ද ගුරු- සිසු යුතුකම් මැනවින් ඉටුවීම අත්‍යවශ්‍ය කරුණකි.

ප්‍රමුඛ පදඃ ගුත්තිල කාව්‍යය, ගුත්තිල පඬිවරයා, මූසිල, ගුරුමුෂ්ටිය, ගුරු- සිසු යුතුකම්,

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*

14

# ගුරුළුවතෙහි සංකේතාශ්‍රිත යථාර්ථ නිරූපණය පිළිබඳ අධ්‍යයනයක්

*සේනානායක, සසී ලවන්දි.* [1]

ගුණදාස අමරසේකරයන්ගේ කාව්‍ය නිර්මාණ අතර ගුරුළුවත කාව්‍ය සංග්‍රහය (1962) විශේෂ තැනක් ගන්නා කාව්‍ය සංග්‍රහයකි. එම කාව්‍ය සංග්‍රහය ඔස්සේ අමරසේකරයන් විෂය ලෝකයෙන් ඈත් ව මනඃකල්පිත ලෝකයක ජීවත් වන්නකුට උද්ගත විය හැකි අර්බුද නිරූපණය කර තිබෙන්නේ සාම්ප්‍රදායික ජන රීතියත්, සංකේත භාවිතයත් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමිනි. එහි දී භාවිත කළ සංකේත අතුරින් ගුරුළා කලාකරුවකුගේ සංකේතයක් වශයෙන් ද, බොල් පොළොව යථාර්ථ ලෝකයෙහි සංකේතයක් වශයෙන් ද, රනඹර කලාකරුවා විසින් ගොඩනඟා ගන්නා ලද කාල්පනික ලෝකයෙහි සංකේතයක් වශයෙන් ද, ස්ත්‍රිය යථාර්ථ ලෝකයේ ජීවත්වන පුද්ගලයකුගේ සංකේතයක් වශයෙන් ද, නාගයා හා ගින්න ලිංගික ශක්තියේ සංකේත වශයෙන් ද, රස ලෝකය කායික ස්පර්ශ ලෝකයේ සංකේතයක් වශයෙන් ද ප්‍රධාන ව හඳුනා ගැනීමට හැකි වේ. මෙම සංකේත භාවිත කිරීමේ දී ගුණදාස අමරසේකර සාර්ථක වූ බව මෙන් ම ඇතැම් අවස්ථාවන්හි දී අසාර්ථක වූ බව ද ගුරුළුවත කාව්‍යය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. නිදර්ශනයක් ලෙස ස්ත්‍රිය යන සංකේතය ගොඩ නැඟීමේ දී ඔහුගේ දුර්වල ලක්ෂණ දක ගත හැකි ය. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ගුරුළුවත කාව්‍යයත් ද්විතීයික මූලාශ්‍රය වශයෙන් විවිධ විචාර විමර්ශන අන්තර්ගත කෘති, සඟරා ලිපි හා අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ගවේෂණය කිරීමත් සිදු විය. මේ සියලු මූලාශ්‍රය ඔස්සේ සිදු කරන ලද විමර්ශනයන් අනුව ගුරුළුවත කාව්‍ය සංග්‍රහයෙහි සංකේත භාවිතයෙන් භෞතික ලෝකය අබිබවා මනෝ ලෝකයක අතරමං වූවකුගේ ජීවන යථාර්ථය නිරූපණය කිරීමේ දී ගුණදාස අමරසේකර සම්පූර්ණයෙන් ම සාර්ථක නොවූ බැව් නිගමනය කළ හැකි වේ.

ප්‍රමුඛ පදඃ ගුරුළුවත, සංකේත, යථාර්ථ නිරූපණය, රනඹර, බොල් පොළොව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Sasisenanayakeuok@gmail.com

15

# ගෝරා නවකතාවෙන් හෙළි වන නූතනත්වයේ හා සම්ප්‍රදායේ මත ගැටුම පිළිබඳ විමර්ශනයක්.

*දම්මිකා කුමාරි, ජී.* [1]

දහනව වැනි සියවස අග හා විසි වැනි සියවසේ මුල් භාගය වන විට භාරතීය සමාජය වටා ගොඩනැඟී තිබූ සමාජ, දේශපාලනික, සංස්කෘතික පසුබිම තත්ත්වාකාරයෙන් රූපණය වූ නවකතාවන් අතුරින් රවින්ද්‍රනාථ ඨාකුර් විසින් විරචිත "ගෝරා" නවකතාව ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකේ. නූතන ඉන්දියාවේ බුද්ධිමය නවෝදයක් ඇති වූ යුගයක බිහි වූ "ගෝරා" නවකතාවෙන්, යටත්විජිත පාලන සමයේ ඉන්දීය සමාජයේ පැවති සම්ප්‍රදාය හා නූතනත්වය අතර ප්‍රතිවිරෝධී ආකල්ප සට්ටනය නිරූපණය කිරීමට යත්න දරා ඇත. "ගෝරා" නවකතාව සහ ඒ පිළිබඳ ලියවුණු වෙනත් විචාර කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන කතුවරයා උක්ත නවකතාවෙන් සාම්ප්‍රදායික සමාජය හා නූතනත්වය අතර ඇති වූ සට්ටනය නිරූපණය කළ ආකාරය විමසුමට ලක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. තත් යුගයේ ඇති වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරවල ප්‍රතිඵල ලෙස ආර්ය සමාජ්, බ්‍රහ්ම සමාජ් ආදි සංවිධාන හඳුනාගත හැකි ය. ඨාකුර්ට ද එම සමාජ පදනම නවකතාව ලිවීමෙහි ලා උපකාරී වී ඇත. ජාතිකත්ව සංකල්පය ගොඩනැඟීමත් සමඟ ම සමාජ සංස්ථාහි පැවති සමාජ ප්‍රගතියට බාධා පමුණුවන ආචීර්ණ කල්පික මතවාද මෙන් ම නූතන අදහස් සට්ටනය වීම නොවැළැක්විය හැකි බැව් මෙහි දී විශද වේ. එහි දී පුහු මතවාද, චාරිත්‍රවලට වඩා මානව හිතවාදීත්වය සමාජය ඉක්මවා නැඟී සිටීමක් සිදු වන බව කතුවරයා අවසානයේ සමස්තාර්ථය තුළින් කලාත්මක ව ප්‍රතිනිර්මාණය කිරීමට සමත් ය. 'සියලු භෞතික ගැටීම් පසෙක ලා මිනිසා, මිනිසා වෙනුවෙන් කටයුතු කිරීම අගනේ ය' යන සදාතනික සත්‍යය මෙහි දී "ගෝරා" නවකතාවෙන් ප්‍රතීයමාන වීම එය උසස් නවකතාවක් බවට පත් කරයි.

ප්‍රමුඛ පදඃ ගෝරා, ඨාකුර්, සම්ප්‍රදාය, නූතනත්වය, සට්ටනය

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* gdkumari.gamage@gmail.com

## 16

# චරිකතා කාව්‍යයක් වශයෙන් යසෝදරාවතෙහි පවත්නා අගය පිළිබඳ විමර්ශනයක්

*මදූෂානි, ඩී. එම්. එච්. එම්.* [1]

ලාංකේය සාහිත්‍ය ඉතිහාසයේ හමුවන ප්‍රථම ස්ත්‍රී චරිතාපදානය වන 'යසෝදරාවත' මහනුවර යුගයේ දී රචනා වූ චූල සම්ප්‍රදායේ ජන කාව්‍යයක් වන අතර කර්තෘ අඥාත ය. නමුත් උඩුගම්පොළ කුමාරිහාමිගේ නිර්මාණයක් බවට ද මතයක් පවතී. කෝට්ටේ යුගයේ දී මුලින් ම චරිතකතා කාව්‍යයක් ලෙස 'පැරකුම්බාසිරිත' රචනා වුව ද එය ප්‍රශස්තියකි. එලෙස ඇරඹෙන චරිතකතා පද්‍ය සාහිත්‍යයේ යසෝදරාවතට විශේෂ ස්ථානයක් හිමි වී තිබේ. එයට හේතු සාධකය වන්නේ පරිහානිකර යුගයක මෙය රචනා වීමයි. මෙරට රාජ්‍ය පාලන බලය සිංහල බෞද්ධ පාලකයාගෙන් ගිලිහී නායක්කාර් වංශික රජුන්ට හිමි වීමත්, විදේශාක්‍රමණත් හේතුවෙන් මහනුවර යුගයේ දී රාජ්‍ය පාලන තන්ත්‍රය අරාජික විය. එහි බලපෑමෙන් ආර්ථිකය, සමාජය, ආගමික, සාහිත්‍යය යන සියලු ක්ෂේත්‍රයන් ද බිඳ වැටිණ. එනිසා මහනුවර යුගයේ ජන ජීවිතය ද ව්‍යාකුල විය. සමාජ සංස්ථාවේ කුඩා ම ඒකකය වූ පවුල තුළ අඹු-සැමි සබඳතාවේ දෘඪ බව වියැකිණ. එකල පාලකයන්ගේ ප්‍රීණනය උදෙසා බිරිඳ හෝ දියණිය පිරිනමා අත්ථි සංග්‍රහ කළ පුරුෂයන් නිසා කාන්තාවන්ගේ ලිංගික ජීවිතය, විවාහය වැනි සබඳතා සරල විය. එකගෙයිකෑම වැනි විවාහ චාරිත්‍ර ක්‍රියාත්මක වූ එම සමාජයේ ස්ත්‍රිය, ලිංගික වහලියක සහ තම පරපුර ඉදිරියට ගෙන යාමට පුතකු ලබා දෙන සහායිකාවක පමණක් විය. එනිසා කාන්තාවන්ගේ ගුණධර්ම පිරිහී පතිභක්තිය අගය නොකළ ලිහිල් දිවියකට ඔවුහු අනුගත වූහ. මෙනිසා පරිහානිකර යුගයක ස්ත්‍රියගේ දුරාචාරයන් වළක්වනු පිණිස ඇයට සදුපදේශයන් ලබා දීමට අරමුණු කළ අප කවියාට යසෝදරාවගේ චරිතය තරම් ආදර්ශමත් තවත් චරිතයක් නොවී ය. බෞද්ධාගමික පරිසරයෙන් ඔපවත් වූ බෞද්ධ සංස්කෘතියේ ගෞරවණීය චරිතය වන යසෝදරාවගේ ගුණ කදම්බයෙන් මෙකල ස්ත්‍රියට සදුපදේශ ලබා දීමට මෙම කාව්‍යය රචනා විය. විශේෂයෙන් ම 'පෙදෙන් බුදුසිරිතැ' යන නියමය ගුරු කොට සැලකූ පසුබිමක 'යසෝදරාවත' වැනි චරිතකතා කාව්‍යයක් රචනා වීමෙන් එහි සමාජ අවශ්‍යතාව ස්ඵුට වේ. මෙම කාව්‍යයෙන් චූල සම්ප්‍රදායේ ජනකාව්‍යයක විද්‍යමාන වන පුනරුක්තිය වැනි දෝෂයන් දිස්වුව ද කවියාගේ දූෂණය භූෂණයක් ම ය. මක්නිසා ද නූගත් ජනකවියාගේ දොස සෑම කල්හි ම ප්‍රතිභාව මඟින් වසාලයි. 'යසෝදරාවත' ජනකාව්‍යයක් වුව ද එහි සාහිත්‍යයමය සහ සමාජීය අගය සුවිසල් ය. මෙහි ඉතා සියුම් මානව හැඟීම් ඉතා උසස් ලෙස කවියට නඟා ඇත. මෙම අධ්‍යයනයෙන් 'යසෝදරාවත' කාව්‍යය, සාහිත්‍ය මූලාශ්‍රයයක් ලෙස භාවිත කොට චරිතකතා කාව්‍යයක් වශයෙන් එහි අගය පිළිබඳ විමර්ශනය කිරීමට අපේක්ෂිත ය. මෙම කාව්‍යය සියුම් ලෙස අධ්‍යයනයේ දී තත්කාලීන ස්ත්‍රියට සදුපදේශ ලබා දීමට තරම් ස්ත්‍රී ගුණධර්ම පිරිහී තිබූ බවත් එයට මහනුවර යුගයේ පරිහානිකර සමාජාර්ථික පසුබිම හේතු වූ බවත් විද්‍යමාන ය. එනිසා චරිතකතා කාව්‍යයක් ලෙස යසෝදරාවතෙහි අගය සාර්වත්‍රික, සර්වකාලීන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : යසෝදරාවත, චරිතකතා කාව්‍ය, මහනුවර යුගයේ ස්ත්‍රිය, චරිතය, කාව්‍යෝක්ති

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය.*

17

# ජනකවියෙන් පිළිබිඹු වන යෞවන ප්‍රේමය

*දොරකුඹුර, ආර්.පී.එස්.සී.එච්.*[1]

මිනිසා විසින් අදහස් හුවමාරු කර ගැනීමට භාෂාව යම් අවධියක උපයෝගි කර ගනු ලැබුවේ ද එම අවධියෙහි ම ජනශ්‍රැතියේ ආරම්භය ද සිදු වී ඇති බව සැලකේ. ජනශ්‍රැතියේ විවිධ අංග අතර ජනකවියට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ගැමි ජනතාවගේ සිතුම්-පැතුම්, ජීවන ගැටලු හා අධ්‍යාත්මික ගැටලු මෙන් ම භෞතික පරිවර්තනයන්, දුක්වේදනා, සමාජ සබඳතා, සිරිත්-විරිත් කේන්ද්‍රීය ජීවන දෘෂ්ටිය ජනකවියෙන් ප්‍රකාශ කෙරේ. ජනකවියෙන් ආවරණය වන විවිධ ක්ෂේත්‍ර පිළිබඳව විද්වතුන් විසින් විශ්ලේෂණාත්මක විවරණ ඉදිරිපත් කරනු ලැබ තිබුණ ද එහි අන්තර්ගත ප්‍රේමය පිළිබඳව මෙතෙක් ප්‍රාමාණික වූ අධ්‍යයනයක් සිදු වී ඇති බව නො පෙනේ. මේ නිසා ම ජනකවියෙන් නිරූපණය වන යෞවන ප්‍රේමය පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් සිදු කිරීම ජනශ්‍රැතිය අධ්‍යයනයේ දී අත්‍යවශ්‍ය සාධකයක් වීම මේ පර්යේෂණය සඳහා යොමු වීමට හේතු විය. ජනකවියේ අන්තර්ගත ප්‍රේමය මාතෘ ප්‍රේමය, පිතෘ ප්‍රේමය, දාරක ප්‍රේමය, අඹු-සැමි ප්‍රේමය, දේශප්‍රේමය ආදි වශයෙන් පෘථුල පරාසයක් ඔස්සේ හඳුනා ගත හැකි වුවත් මෙම අධ්‍යයනය ජනකවියෙන් පිළිබිඹු වන යෞවන ප්‍රේමය පිළිබඳව පමණක් කේන්ද්‍රීය අවධානයෙන් යුක්ත ව සිදු කෙරිණි. ජනශ්‍රැතියේ වැදගත් මූලිකාංග යක් වන ජනකවිය හඳුනා ගැනීමත් ඒ මඟින් ආවරණය වන ව්‍යාප්ත ප්‍රස්තුත අතුරින් යෞවන ප්‍රේමය පදනම් වූ ජනකවියේ නිරූපිත ප්‍රේමය හා විරහව පිළිබඳවත් මේ මනෝභාව සිංහල ගීත සාහිත්‍යයට පදනම් ව ඇති ආකාරයත් අධ්‍යයනය කිරීම මේ පර්යේෂණයේ අරමුණයි. මේ සඳහා භාවිත කරන ලද අධ්‍යයන ක්‍රමවේදය වූයේ පර්යේෂණයට අදාළ සාහිත්‍ය මූලාශ්‍රය ගැඹුරින් අධ්‍යයනය කිරීම සහ ඒ පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ඇති පුද්ගලයින්ගෙන් තොරතුරු සපයා ගැනීම ය. මේ විශ්ලේෂණය තුළින් ජනකවියා යෞවන ප්‍රේමය සංයමයෙන් මෙන්ම දැඩි ශෘංගාරයෙන් යුතු ව ප්‍රකාශ කර ඇති ආකාරයත් එය නූතන ගීතය කෙරෙහි බලපා ඇති ආකාරයත් හඳුනා ගත හැකි විය.

ප්‍රමුඛ පදඃ ජනශ්‍රැතිය, ජනකවිය, ප්‍රේමය, යෞවන ප්‍රේමය, ගීතය

1 *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, shalini343811@gmail.com*

18

# ජාතක කතා සාහිත්‍යයෙන් නිරූපිත දිසාපාමොක් ගුරු භූමිකාව පිළිබඳ විමසුමක්

*චාරංගා, ජේ. එම්. එන්. එම්.*[1]

අධ්‍යාපන ක්ෂේත්‍රය අතුරෙහි ගුරු භූමිකාවට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මේ පිළිබඳ ව පෙරදිග සාහිත්‍යයේ මෙන් ම අපරදිග සාහිත්‍යයේ ද විමසුමට බඳුන් වී ඇත. පෙරදිග සාහිත්‍යය හා සම්බන්ධ ජාතක කතාවලින් ගුරු භූමිකාව පිළිබඳ කරුණු අනාවරණය කර ගත හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණයෙන් ජාතක කතා සාහිත්‍යයෙහි නිරූපිත දිසාපාමොක් ආචාර්යවරයාගේ භූමිකාව අධ්‍යයනයට ලක් කෙරේ. භාරතයේ ප්‍රමුඛ අධ්‍යාපන මධ්‍යස්ථානයක් වන තක්සලාව හා එහි අධිපතිත්වය දැරූ දිසාපාමොක් ආචාර්යවරයාගෙන් ශිල්ප ඉගෙන ගන්නා බෝසතුන් පිළිබඳ පැවසෙන ජාතක කතා ගණනාවක් ම හමුවන අතර බෝසතුන් දිසාපාමොක් ආචාරීන් වශයෙන් සිටි බව කියැවෙන ජාතක කතා ද කිහිපයකි. විශේෂයෙන් ම පැරණි අධ්‍යාපනය, ආර්ථික ක්ෂේත්‍රයට වඩා සදාචාර හා ආධ්‍යාත්මික වර්ධනයට යොමු වූ බවක් ජාතක කතා අධ්‍යයනයෙන් ගම්‍යමාන වේ. බරණැස් නුවර සිට තක්සලාව දක්වා වූ ගමන් මාර්ගය දීර්ඝ වුව ද කාලයට උචිත අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණින් ප්‍රභූවරු තම දරුවන් යුහුසුලු ව ඒ සඳහා යොමු කරන්නට වූහ. දිසාපාමොක් ආචාර්යවරයාගේ ආකර්ෂණීය ඉගැන්වීම් රටාව, ස්ථානෝචිත ප්‍රඥාව, උපායශීලීත්වය, මන්ත්‍ර ශාස්ත්‍රයේ පාරප්‍රාප්ත වීම ආදි වූ අත්‍යුදාර ගති ලක්ෂණ රැසක් මෙන් ම දුර්ගුණ කිහිපයක් ද ජාතක කතාවල පිළිබිඹු වී ඇත. මෙම අධ්‍යයනය එම ජාතක කතා අතුරින් 'අකාලරාවී ජාතකය, තිලමුට්ඨි ජාතකය, බ්‍රහ්මදත්ත ජාතකය, සීලවිමංසන ජාතකය, චුල්ල ධනුග්ගහ ජාතකය, දරිමුඛ ජාතකය, අසාතමන්ත ජාතකය, වාරණ ජාතකය, නාමසිද්ධි ජාතකය, අසදිස ජාතකය, අනභිරති ජාතකය, සාධුසීල ජාතකය හා මූලපරියාය ජාතකය' යන කතාවන්ට පමණක් සීමා වේ. මේ සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය උපයෝගී කර ගැනෙන අතර කරුණු සන්සන්දනය සඳහා අදාළ අවස්ථාවන්හි ජාතක අට්ඨ කතාව ද ආශ්‍රය කෙරේ. ඒ අනුව දිසාපාමොක් ආචාර්යවරයාගේ ගුරු භූමිකාව කෙසේ නිරූපණය වන්නේ ද යන්න සාධක සහිත ව අධ්‍යයනය කිරීම මෙහි දී සිදු වේ.

ප්‍රමුඛ පද : ගුරු භූමිකාව, ජාතක අටුවාව, ජාතක කතා, දිසාපාමොක්, ගුරු භූමිකාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* nisharacharanga@gmail.com

19

# ජාතක පොතෙන් ප්‍රතීත වන මනෝරෝග චිකිත්සක ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් මාතෘකා කිහිපයක් ඇසුරෙනි)

**ජයකොඩි, ජේ. ඒ. එස්. එස්.** [1]

**විමලතිස්ස හිමි, වහරක.** [2]

පාලි ජාතක අට්ඨකථා ඇසුරින් කුරුණෑගල යුගයේ දී රචිත සිංහල ජාතක පොතේ ඇතුළත් ජාතක කතා කිහිපයක් ඇසුරින් මනෝරෝග සහ මනෝරෝග චිකිත්සාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විමර්ශනය කිරීම මෙහි අරමුණයි. මිනිසාට වැළඳෙන රෝග දෙයාකාරයකි. එනම් කායික හා මානසික රෝග වශයෙනි. කායික රෝග ඖෂධ මඟින් ද මානසික රෝග උපදේශනය මඟින් ද සුවපත් කර ගත හැකි බව පිළිගැනීමයි. බුදුසමය මනස මුල් කරගත් දර්ශනයක් හෙයින් සමාජ ගැටලු සියල්ලට ම මුල මානසික ගැටලු බව එම දහම මඟින් පැහැදිලි කෙරේ. ඒවාට ප්‍රතිකාර කිරීම පිළිබඳ චිකිත්සක ක්‍රමවේදයක් අන්තර්ගත වන ජාතක කතා ඇසුරින් බෞද්ධ මනෝරෝග චිකිත්සනය පිළිබඳ විමර්ශනයකට අවකාශ පවතී. ඒ පිළිබඳ විධිමත් අධ්‍යනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ ජාතක පොත මඟින් මනෝචිකිත්සාවක් සිදුවේ ද යන්නයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ආශ්‍රයෙන් පර්යේෂණය සිදු කිරීමයි. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස තෝරා ගත් ජාතක කතා කිහිපයකුත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස මේ පිළිබඳ රචනා වී ඇති විචාර ග්‍රන්ථත් භාවිත කෙරේ. මෙම පර්යේෂණයේ ප්‍රතිඵලය අනුව ජාතක පොතේ ඇතුළත් කතා මඟින් මනෝරෝග පිළිබඳ කරුණු සාකච්ඡා වන බව හඳුනා ගත හැකි විය. මෙම පර්යේෂණයේ නිගමනය වන්නේ ජාතක පොත මනෝරෝග චිකිත්සක ක්‍රමවේද පිළිබඳ කරුණු ඇතුළත් කෘතියක් ලෙස හඳුනා ගත හැකි බවයි.

ප්‍රමුඛ පදඃ ජාතක පොත, මනෝරෝග චිකිත්සාව, මනෝරෝග, බුදුදහම, උපදේශනය

*1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*

*2 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*

# 20
# දෙවනපිය යෙදුම විග්‍රහ කරන සිංහල නිරුක්ති;
# (ක්‍රි.ව. 10-15 සෙල්ලිපි ඇසුරිනි)

*චාමර, එච්.එන්.* [1]

භාෂා සාහිත්‍යයේ ඉතිහාසය විමසීමේ දී සෙල්ලිපි බොහෝ වැදගත් මූලාශ්‍රයයක් වේ. මෙහි දී සෙල් ලිපිවල සඳහන් වන දෙවනපිය යන විරුද නාමයට සෙල්ලිපි අර්ථ දක්වූවන් සැපයූ නිරුක්ති පිළිබඳ ව අධ්‍යයනය කෙරෙයි. එම නිරුක්ති විවිධ වෙනස්කම් සහිත ව ඉදිරිපත් වී ඇති හෙයින් ඒ පිළිබඳව ද එසේ වීමට බලපෑ සාධක පිළිබඳ ව ද මෙහි දී මූලික අධ්‍යයනය යොමු වෙයි. එම අධ්‍යයනයේ දී ක්‍රි. ව. 10-15 සියවස්වලට අයත් සෙල්ලිපි පමණක් පදනම් කර ගැනෙයි. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රය ඇසුරු කර ගැණෙන අතර ප්‍රාථමික මූලාශ්‍රයවල දක්වෙන කරුණු සනාථ කර ගැනීමේ දී ද්විතීයික මූලාශ්‍රය හා ඒ පිළිබඳ ව අදහස් දක්වන උගතුන්ගේ මතවාද සැලකිල්ලට ගැනෙයි. ඒ අනුව සාධක සහිත ව නිශ්චය කළ හැකි මතවාදය/මතවාද ශාස්ත්‍රීය ව සාකච්ඡාවට ලක් කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පදඃ දෙවනපිය, සෙල්ලිපි, මූලාශ්‍රය, නිරුක්ති, මතවාද

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* chamaranuwan65@gmail.com

## 21
# නූතන සිංහල නවකතාවෙහි 71 කැරැල්ල නිරූපිත ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (තෝරා ගත් නවකතා ඇසුරෙන්)

*නිරෝෂිකා, යූ. එන්.*[1]

මෙම අධ්‍යයනයේ දී සිදු කෙරෙනුයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත 'හෙට එච්චර කළුවර නෑ' (1975) හා ගුණසේන විතාන විසින් රචිත 'විප්ලවයේ කැරලිකාරයෝ' (1979) යන කෘතීන් දෙකෙහි 71 කැරැල්ල පිළිබිඹු වන ආකාරය පිළිබඳ සන්සන්දනාත්මක විමර්ශනයකි. 'හෙට එච්චර කළුවර නෑ' නවකතාවෙහි කථානායකයා වන අමරදාස නම් ආචාර්යවරයා සහ 'විප්ලවයේ කැරලිකාරයෝ' නවකතාවෙහි නිමල් යන චරිතවල ක්‍රියාකාරිත්වය මෙහිදී විමර්ශනයට භාජනය කෙරේ. 'හෙට එච්චර කළුවර නෑ' නවකතාවෙහි දුර සිට කැරැල්ල දෙස හෙළන දෘෂ්ටියකින් කැරැල්ල නිරූපිත බවත් විප්ලවයේ කැරලිකාරයෝ නවකතාවෙහි කැරැල්ල දෙසට යොමු කරනුයේ සමීප දෘෂ්ටියක් බවත් පෙනේ. මෙහි දී ඉහත ග්‍රන්ථද්වය ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද 71 කැරැල්ල පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ වන වෛද්‍ය රුවන් එම්. ජයතුංග විසින් රචිත 71 කැරැල්ල ආරම්භයේ සිට අවසානය දක්වා පූර්ණ සමාලෝචනයක් (2011)  ග්‍රන්ථය, අධිනීතිඥ යසවර්ධන අබේපාල විරචිත 71 කැරැල්ල සහ අපි (2016) යන කෘතිය හා සරත් විජේසූරිය විරචිත නිර්මාණකරණය සහ දේශපාලනය යන කෘතීන් ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන පුස්තකාල පරිශීලන ක්‍රමවේදයෙන් මෙම පර්යේෂණය සිදු කෙරේ. මෙහි දී අමරදාස යනු කැරැල්ලට ඍජු ව දායක වන හෝ ඊට පසුබිම් වන සමාජ පරිස්ථිතිය හමුවේ වැඩි පීඩාවට පත් නොවන අයෙකු ලෙස නිරූපිත ය. ඔහුට කැරැල්ල දූරස්ථ ය. එහෙත් නිමල් යනු කැරැල්ලෙහි සක්‍රීය දායකයෙකු වන අතර ඔහුගේ උපත සිදු වන්නේ ද සමාජ අසාධාරණයක ප්‍රතිඵලයක් ලෙසිනි. එබැවින් ඔහුට කැරැල්ල සමීප ය. මෙම පදනමෙහි සිට තත් කෘතීන් දෙකෙහි 71 කැරැල්ල නිරූපිත අයුරු තුලනාත්මක ව විමසන විට දූරස්ථ රූපකය හා සමීප රූපය වශයෙන් නිර්මාණක්ෂියෙහි වෙනසක් දැකිය හැකි ය. එනිසා මෙම කෘතීන් 71 කැරැල්ල පිළිබඳ ව එකිනෙකට වෙනස් අර්ථකථනයන් ඉදිරිපත් කරන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ 71 කැරැල්ල, සමාජමය පරිස්ථිතිය, දූරස්ථ රූපකය, සමීප රූපය, දෘෂ්ටිය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* nimaliniroshika@gmail.com

## 22

# ප්‍රවාස විප්‍රලම්භ ශෘංගාරය සීගිරි ගීවලින් ප්‍රතීයමාන වන ආකාරය

*ගයානි මධූෂා කුමාරි, එස්. පී.*[1]

සංස්කෘත සාහිත්‍ය විග්‍රහයන්ට අනුව විප්‍රලම්භ ශෘංගාරය; පූර්වානුරාගාත්මක විප්‍රලම්භය, මානාත්මක විප්‍රලම්භය, ප්‍රවාසාත්මක විප්‍රලම්භය හා කරුණ විප්‍රලම්භය යනුවෙන් ප්‍රභේද සතරකි. ප්‍රේමාභිලාෂී ස්ත්‍රී පුරුෂ දෙපළ අතරින් එක් අයකු විදෙස්ගත වීම්, රැකීරක්ෂා ආදි කරුණු හේතුවෙන් තාවකාලික ව දුරස් වීම නිසා ඔවුනොවුන්ගේ චිත්ත සන්තානයේ ජනනය වන විරහව ප්‍රවාස විප්‍රලම්භය යනුවෙන් අර්ථ ගැන්වේ. සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථවල ද චිරන්තන හා අද්‍යතන සිංහල සාහිත්‍ය ග්‍රන්ථවල ද ප්‍රවාස විප්‍රලම්භය යෙදුණු අවස්ථා විද්‍යමාන වේ. සංස්කෘත විචාරකයන් විසින් දක්වන ලද ප්‍රවාස විප්‍රලම්භය පිළිබඳ සංකල්පය පදනම් කර ගෙන එය සීගිරි ගීවල කෙසේ පිළිබිඹු වන්නේ ද යන්න මෙහි දී අධ්‍යයනය කෙරේ. පර්යේෂණයේ සීමාකර ගැනීම් වශයෙන් සිතුවම්වල දෘශ්‍යමාන නානාවිධ භාව නිරූපණ පදනම් කර ගෙන විවිධ ජනයා විසින් පබඳින ලද සීගිරි ගී පමණක් මෙහි දී උපයෝගී කර ගැනේ. මේ පිළිබඳ ලියවී ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මත පදනම් ව කෙරෙන මෙම අධ්‍යයනයේ දී සංස්කෘත විචාරකයන් විසින් දක්වන ලද උක්ත සංකල්පය සීගිරි ගී මඟින් පිළිබිඹු කෙරෙන අයුරු තුලනාත්මක ව විමර්ශනයට ලක් කෙරෙයි. එසේ විමර්ශනයට ලක් කිරීමෙන් තත් සංකල්පය සීගිරි ගීවල ප්‍රතීයමාන වන ආකාරය සාධක සහිත ව විමසීමට අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පදඃ ප්‍රවාස විප්‍රලම්භය, සීගිරි ගී, භාව නිරූපණ, ශෘංගාරය, සංස්කෘත විචාර මූලධර්ම.

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

23

# පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ මුල් කාලීන කාව්‍ය නිර්මාණ හා දෘෂ්ටිවාද ප්‍රකාශනය පිළිබඳ විමර්ශනයක්

*චිත්‍රා කුමාරි සිල්වා, එස්. එම්.*[1]

පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ මුල් කාලීන නිර්මාණ මඟින් ප්‍රකට කෙරෙන දෘෂ්ටිවාදී ප්‍රකාශනය කෙරෙහි විමර්ශනාක්ෂිය යොමු කිරීම මේ පර්යේෂයේ අරමුණයි. කවියා තමා වටා පවතින හා ගොඩනැගෙන සමාජ ප්‍රපංච උදෙසා ස්වකීය කියවීම් වශයෙන් ඇති කර ගන්නා ප්‍රතිවිරෝධයන් ප්‍රකාශන වශයෙන් ඉදිරිපත් කිරීම දෘෂ්ටිවාද ප්‍රකාශ වශයෙන් හැඳින්විය හැකි ය. ඍජු වාගුක්තීන් භාවිතය, සටන් පාඨ, විරෝධාත්මක ප්‍රකාශන ඒ අතර වෙයි. අත්දැකීම් අතින් පටු මාවතක ගමන් කළ සිංහල කවියේ ගමන් මඟ වෙනත් දිශාවකට යොමු වූ අතර ඒ මඟ ඔස්සේ සමාජ යථාර්ථය ධ්වනිත විය. 1950 - 60 දශකයන්හි නිර්මාණය වූ සිංහල කවියට පුද්ගලානුබද්ධ විෂය භූමියක් අන්තර්ගත වීමට එවක පැවති ආර්ථික පදනම මහත් වූ උත්තේජනයක් සපයන්නට විය. එකල ලාංකේය මධ්‍යම පන්තිය තාවකාලික මූල්‍යමය ස්ථාවරය භුක්ති විඳීමත්, ඒ ව්‍යාජ මූල්‍ය ශක්තියෙන් සාහිත්‍යකරුවන් අන්තරාවර්තී මනසකින් ස්වකීය ආත්මීය ඌනතා ගවේෂණයේ නිමග්න වීමත් සිදු විය. 1956 දී විවර වූ නිදහස් අධ්‍යාපන දොරටුවෙන් සරසවියට පිවිස උසස් අධ්‍යාපනය භුක්ති විඳි ගැමි තරුණ පිරිස විරැකියාවෙන් පීඩිත පිරිසක් බවට පත්වීම පමණක් නොව එකල සමාජයෙහි ධන-නිර්ධන පන්ති භේදය ද උත්සන්න විය. මෙවන් පසුබිමක් තුළ මධ්‍යම පාන්තික බුද්ධිමතුන්ගේ මානසික තත්ත්වයන් විශාල වෙනසකට බඳුන් විය. සමාජයේ වූ ආර්ථික බිඳවැටීම් අබිමුව සමාජ, සංස්කෘතික ආදි අංශයන්හි ද විෂමතාවක් ඇති විය. මේ සියල්ල කුළු ගන්වමින් ජනතා විමුක්ති පෙරමුණේ ආශිර්වාදයෙන් 1971 දී තරුණ කැරැල්ලක් ඇති විය. සෝවියට් සාහිත්‍යයේ ආභාසය ප්‍රමුඛ කොට ගත් ජනතාවාදී කලාවක් කෙරෙහි සිංහල මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලැබූ දේශීය තරුණ ප්‍රජාවගේ අවධානය යොමු වෙමින් කලාව ජනතාව සඳහා ය යන ජනතාවාදී දෘෂ්ටිය සුපෝෂණය වන්නට විය. මේ අධ්‍යයනයේ සීමාව වශයෙන් මෙම කාල වකවානුවේ කාව්‍යකරණයට බට පරාක්‍රම කොඩිතුවක්කුගේ 'පොඩිමල්ලියෙ', 'අකීකරු පුත්‍රයෙකුගේ ලෝකය' හා 'අලුත් මිනිහෙක් ඇවිත්' යන කාව්‍ය සංග්‍රහ මූලාශ්‍රය කොට ගැනේ. පරාක්‍රම කොඩිතුවක්කුගේ මෙම නිර්මාණයන් කෙරෙන් ප්‍රකට වන්නේ එකී සමාජ සංස්ථාවන්ට එරෙහි ව මතු වන විරෝධාකල්පයන් ය. විටෙක සම්ප්‍රදාය විරෝධී ස්වරූපයෙන් ද තවත් විටෙක දෘෂ්ටිවාදාත්මක ප්‍රකාශන වශයෙන් ද ඔහුගේ කාව්‍ය නිර්මාණ ඉදිරිපත් වෙයි. එහි ලා අලංකාරවලින් විනිර්මුක්ත ව නග්න වූ රළු කාව්‍ය භාෂාවකින් කේවල හා සමාජ ප්‍රශ්න දෙස සිය දෘෂ්ටිය හෙළීමට පරාක්‍රම කොඩිතුවක්කු කවියා සමත් වී ඇති බැව් නිරීක්ෂණය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ දෘෂ්ටිවාද ප්‍රකාශනය, සමාජ යථාර්ථය, උත්තේජනය, අන්තරාවර්තී, විනිර්මුක්ත

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය.* chithrakumari40@gmail.com

# 24
# v වැනි කාශ්‍යප රජුගේ ( ක්‍රි.ව. 914-923 ) පුවරු ලිපියෙන් හෙළි වන අධිකරණ ක්‍රමය

*පුෂ්ප කුමාර, ජී. ජී. එස්. සී.*[1]

ලෝකයේ කිසියම් රටක හෝ සංස්කෘතියක ඓතිහාසිකමය තොරතුරු අනාවරණය කර ගැනීමෙහි ලා ප්‍රාමාණික වන ප්‍රධානතම මූලාශ්‍රයයක් ලෙස ශිලා ලේඛන නම් කළ හැකි වේ. එසේ නම් කළ හැකි ශිලා ලිපියක් ලෙස v වැනි කාශ්‍යප රජුගේ පුවරු ලිපිය හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනයෙන් v වැනි කාශ්‍යප රජුගේ පුවරු ලිපියෙන් හෙළි වන අධිකරණ ක්‍රමය පිළිබඳ විමර්ශනය කෙරේ. මූලික වශයෙන් භික්ෂූන් වහන්සේ, රාජ්‍ය නිලධාරීන් සහ විහාරස්ථානවල සේවක නිලධාරීන් අනුගමනය කළ යුතු නීති රීති පද්ධතියක් මෙහි ඇතුළත් වී ඇත. මෙම අධ්‍යයනයේ දී අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනය හා සම්බන්ධ ව පැවති ප්‍රධාන ආයතනයක් වන අධිකරණය, කෙසේ ක්‍රියාත්මක වූයේ ද, එහි ක්‍රියාකාරීත්වය කෙබඳු වී ද යන්න අධ්‍යයනය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ශිලා ලේඛන සංග්‍රහයන් ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන වෙනත් කෘති ද යොදා ගැනෙයි. ඒ අනුව මෙම පුවරු ලිපියෙන් හෙළි වන අධිකරණ ක්‍රමය පිළිබඳ කරුණු සාකච්ඡා කෙරෙන අතර නිශ්චිත වශයෙන් නිගමනය කිරීමට සාධක ඇති කරුණු නිශ්චිත නිගමනයන් සහිත ව ද විවාදපන්න කරුණු නිශ්චිත නිගමනයකට එළඹීමකින් තොරව ද දක්වෙයි. විවිධ මතවාද සහිත කරුණු සන්සන්දනාත්මක ව විමසා වඩාත් ම පිළිගත හැකි මතය ඉදිරිපත් කිරීමට මෙහි දී අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පදඃ v වැනි කාශ්‍යප රජු, අධිකරණ ක්‍රමය, ශිලා ලේඛන, අනුරාධපුර, මූලාශ්‍රය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, sahanchathuranga102@gmail.com*

# 25
# පුද්ගලානුබද්ධ අත්දැකීම් නිර්මාණකරණය සඳහා උපයෝගී වන ආකාරය (ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග්ගේ පීතෘ නාට්‍යය ඇසුරින්)

*නිමල් අබේසූරිය, ආර්. ඩී.*[1]
*සරණකිත්ති හිමි, බෙරලිහෙළ*[2]

මෙම අධ්‍යයනයෙන් අප අපේක්ෂා කරන්නේ පුද්ගලානුබද්ධ අත්දැකීම් නිර්මාණකරණය සඳහා උපයෝගී වන ආකාරය ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග්ගේ පීතෘ නාට්‍යය (1887) ඇසුරෙන් විමසීමටයි. ස්වීඩන් ජාතික ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් මේ සඳහා විශේෂයෙන් තෝරා ගන්නේ ඔහු කුඩා කල සිට විඳි ජීවිත අත්දැකීම් ඍජු ව ම නාට්‍ය නිර්මාණ ඔස්සේ ඉදිරිපත් කළ බැවිනි. එසේ ම ඒවා කොතෙක් දුරට නාට්‍යකරණය සඳහා දායක වූවා ද යන්නත් විමසීම මෙහි අරමුණයි. අධ්‍යයනයේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ස්ට්‍රින්ඩ්බර්ග්ගේ 'ද ෆාදර්' නාට්‍යයෙහි ප්‍රේමරංජිත් තිලකරත්න විසින් 'පීතෘ' නමින් කළ පරිවර්තනය යොදා ගැනෙයි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් අත්දැකීම හා නිර්මාණකරණය පිළිබඳ ලියැවී ඇති ග්‍රන්ථ, තෘතීයික මූලාශ්‍රය වශයෙන් අන්තර්ජාලයෙන් ලබා ගත් ලිපිත් භාවිත වේ. එසේ භාවිත කරමින් පුද්ගලානුබද්ධ අත්දැකීම් නිර්මාණකරණය සඳහා උපයෝගී කර ගන්නා ආකාරය විමර්ශනය කෙරෙයි.

ප්‍රමුඛ පදඃ  ස්ට්‍රින්ඩ්බර්ග්, පීතෘ, අත්දැකීම, නාට්‍යකරණය, පුද්ගලානුබද්ධ අත්දැකීම්

*1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*
*2 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*

## 26

# පූජ්‍ය බටුවන්ගල රාහුල හිමියන්ගේ "උපන් ලපය" කෙටිකතා සංග්‍රහයෙහි විද්‍යමාන ලිබරල් මානවවාදී ලක්‍ෂණ පිළිබඳ විමසුමක්

*ප්‍රේමකුමාර, සසින්ද ගිම්හාන්.*[1]

අද්‍යතන සාහිත්‍ය කලා නිර්මාණ ක්ෂේත්‍රය ආශ්‍රිත ව බහුජන ප්‍රසාදයට පාත්‍ර වූ ප්‍රබුද්ධ නවකතාකරුවකු මෙන් ම කෙටිකතාකරුවකු වශයෙන් පූජ්‍ය බටුවන්ගල රාහුල හිමියන් හැඳින්විය හැකි ය. එහිමියන් විසින් රචනා කරන ලද "උපන් ලපය" කෙටිකතා සංග්‍රහය (2003) මානව හා සමාජ ජීවිතය පිළිබඳ අර්ථවත් වූත්, ගැඹුරු වූත් දෘෂ්ටියක් සහිත ව කලාත්මක පරිසමාප්තියකින් යුතු ව රචනා වූවකි. මෙම කෙටිකතා සංග්‍රහයට කතා වස්තු දහතුනක් ඇතුළත් වන අතර ඒවායින් බහුතරයක් ගැමි සමාජ ජීවන යථාර්ථය ගැඹුරින් විමංසනයට ලක් කිරීම උදෙසා රචනා විය. රාහුල හිමියන් තත් කෘතිය සම්පාදනය කිරීමේ දී බටහිර රටවල ව්‍යාප්ත වූ විවිධ සාහිත්‍යික චින්තනයන්ගෙන් ලබා ගත් ආලෝකය කෙබඳුදැයි යන්න විමසීම මෙම පර්යේෂණයෙහි අරමුණ යි. රාහුල හිමියන්ගේ "උපන් ලපය" කෙටිකතා සංග්‍රහය ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ද බටහිර විචාර කලාව ආශ්‍රිත ව රචිත න්‍යාය ග්‍රන්ථ ද්විතීයික මූලාශ්‍රය ලෙස ද ගනිමින් අප සිදු කරන මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි, දාහත් වැනි සියවසේ බටහිර රටවල ව්‍යාප්ත වූ ලිබරල්වාදී චින්තනයත්, මානවවාදී චින්තනයත් ඒකාබද්ධ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාප්ත වූ ලිබරල් මානවවාදි ලක්‍ෂණ කිහිපයක් ම "උපන් ලපය" කෙටිකතා සංග්‍රහයෙහි පවතින බව නිරීක්‍ෂණයට හසු විය. ඒ අනුව දේශ, කාල සීමාවන්ගෙන් ඔබ්බට විහිදී යන සදාතනික අගයක් පැවතීම, කෘතියෙහි පොදු මානුෂිකත්වයක් පළ වීම, කතුවරයා මිනිසාගේ ස්වාධීනත්වය සහ අනන්‍යතාවය ගරු කොට සැලකීම සහ නිර්මාණයෙන් මානව සාරධර්ම පිළිබඳ කෙරෙන ආමන්ත්‍රණය යනාදි ලිබරල් මානවවාදී ලක්ෂණ මෙම කෙටිකතා සංග්‍රහයෙන් විද්‍යමාන වේ.

ප්‍රමුඛ පද : බටුවන්ගල රාහුල හිමි, 'උපන් ලපය' කෙටිකතා සංග්‍රහය, ලිබරල්වාදය, මානවවාදය, ලිබරල් මානවවාදී ලක්‍ෂණ

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Sasindagimhan@gmail.com

27

# ‘පෙමතො ජායතී සොකො’ නාට්‍යයෙහි නිරූපිත ශෝකෝත්පාදක ලක්‍ෂණ

*ගොඩකන්ද ආරච්චි, එරංග කෞශල්‍ය.*[1]

එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය නිර්මාණ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේ දී පෙර’පර දෙදිග නාට්‍ය ලක්‍ෂණ දැකිය හැකි ය. ඔහුගේ නාට්‍යයන්හි සුඛාත්මක මෙන් ම ශෝකාත්මක ලක්‍ෂණ ද ප්‍රකට ව පවතී. 1969 දී නිෂ්පාදනය වූ “පෙමතො ජායතී සොකො” නාට්‍යයට සද්ධර්මාලංකාරයෙහි අන්තර්ගත “ස්වර්ණතිලකා වස්තුව” විෂය වී ඇත. ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති පරිදි ශෝකෝත්පාදක නාට්‍ය ලක්‍ෂණ “පෙමතො ජායතී සොකො” නාට්‍යයෙහි අන්තර්ගත වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. පෙරදිග නාට්‍ය සම්ප්‍රදායට අනුගත වී නිර්මිත ගීත නාට්‍යයක් වුව ද එහි අපරදිග ශෝකාත්මක ලක්‍ෂණ දක්නට ලැබෙයි. මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ “ පෙමතො ජායතී සොකො” නාට්‍යයෙහි ශෝකෝත්පාදක ලක්‍ෂණ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමට හැකි වීමයි. ඒ. වී. සුරවීර පරිවර්තනය කොට ඇති ඇරිස්ටෝටල් කාව්‍යශාස්ත්‍රයෙහි අඩංගු ශෝකෝත්පාදක ලක්‍ෂණ හා පැරණි ග්‍රීක ශෝකාන්ත නාට්‍යයන්හි දක්නට ලැබෙන ශෝකෝත්පාදක ලක්‍ෂණ “පෙමතො ජායතී සොකො” නාට්‍යයෙහි කෙතෙක් දුරට නිරූපණය වී ඇතිදැයි යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කෙරේ. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සරච්චන්ද්‍රගේ “පෙමතො ජායතී සොකො” නාට්‍යයත්, ශෝකාත්මක නාට්‍ය ලක්‍ෂණ සහිත වෙනත් කෘතිත්, ද්විතීයික මුලාශ්‍රය ග්‍රන්ථ ලෙස ඒ පිළිබඳ ලියවුණු විචාර ග්‍රන්ථත් භාවිත කෙරේ. කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති ශෝකාත්මක ලක්‍ෂණ ‘පෙමතො ජායතී සොකො’ නාට්‍යයේ අන්තර්ගත වී ඇති අයුරු දක්නට ලැබුණ ද, සරච්චන්ද්‍ර ශෝකාත්මක න්‍යායට වහල් නොවී තම ස්වාධීනත්වය ආරක්‍ෂා කර ගත් ආකාරය හඳුනා ගැනීමට ලැබීම මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස දැක්විය හැකි ය. මේ අනුව සරච්චන්ද්‍රගේ “පෙමතො ජායතී සොකො” නාට්‍යය ශෝකාත්මක නාට්‍යයක ලක්ෂණ විද්‍යමාන කරන්නක් ලෙස නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ ශෝකාත්මක, සුඛාත්මක, ග්‍රීක නාට්‍ය, සම්ප්‍රදාය, පෙර’පර දෙදිග

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* erangakaushalya92@gmail.com

## 28

# මහනුවර යුගයේ පද්‍ය කෙරෙහි පතිත වූ ද්‍රවිඩ ආභාසය

*වන්නිනායක, ඩබ්. එම්. ඩී. යූ.*[1]

ක්‍රි. ව. 1480 - 1815ට අයත් කාලය මහනුවර යුගයයි. අනුරාධපුර යුගයේ සිට ම සිංහල භාෂා සාහිත්‍යය හා සංස්කෘතිය කෙරෙහි දක්ෂිණ භාරතීය බලපෑම දක්නට ලැබුණු බව ඉතා ප්‍රකට ය. මේ කාලය දේශපාලනික වශයෙන් පමණක් නොව ආර්ථික, සාමාජික හා සංස්කෘතික අංශවල ද අවුල්වියවුල් බහුල වූ කාලයකි. මෙම ප්‍රවණතාව මහනුවර යුගයේ දී අන් කවරදාකටත් වඩා ප්‍රබල ව දක්නට ලැබුණි. ද්‍රවිඩ ආභාසය ගද්‍ය, පද්‍ය, නාට්‍ය යනාදි සියලු සාහිත්‍යාංග කෙරෙහි බලපා තිබුණ ද මෙහි දී මහනුවර යුගයේ පද්‍ය සාහිත්‍යය කෙරෙහි පමණක් අවධානය යොමු කෙරේ. මේ පිළිබඳ ව උගතුන් විසින් විවිධ මත පළ කරනු ලැබුව ද ඒ පිළිබඳ විධිමත් පර්යේෂණයක් මෙතෙක් සිදු වී නොමැති හෙයින් මහනුවර යුගයේ පද්‍ය සාහිත්‍යය කෙරෙහි වූ ද්‍රවිඩ බලපෑම පිළිබඳ ව පර්යේෂණාත්මක අධ්‍යයනයක යෙදීම මෙහි අරමුණයි. පුස්තකාල, ලේඛනාරක්ෂක ලියවිලි හා ව්‍යවහාරයේ ඇති ද්‍රවිඩ වදන් යෙදුණු ආකාරය පරීක්ෂා කරමින් යුගයේ නිර්මාණ විමසීමට වෙනත් ලේඛකයන්ගේ විමර්ශනාත්මක ලිපිලේඛන, අන්තර්ජාලය හා තත් විෂයානුබද්ධ කෘති පරිශීලනය මඟින් දත්ත රැස් කිරීම සිදු විය. මහාසම්ප්‍රදාය බිඳවැටී සීතාවකින් ආරම්භ වන චූල සම්ප්‍රදායයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ හෙළ බසින් බොහෝ දුරට දුරස් වෙමින් සමකාලීන කතා ව්‍යවහාරයට සමීප වූ සරල ව්‍යවහාරයකට නැඹුරු වීමයි. එහි දී මහනුවර යුගයේ පැවති දෙමළ භාෂාවේ බලපෑම කථා ව්‍යවහාරයට පමණක් නොව සාහිත්‍ය නිර්මාණවලට ද බලපෑ අයුරු පරීක්ෂා කිරීමත් ද්‍රවිඩ සාහිත්‍යයේ ඇතැම් ශිල්ප ධර්ම සිංහල සාහිත්‍යයට ඇතුළු වීමත් පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි.

ප්‍රමුඛ පදඃ මහනුවර යුගය, ද්‍රවිඩ සාහිත්‍යය, පද්‍ය සාහිත්‍යය, මහා සම්ප්‍රදාය, චූල සම්ප්‍රදාය

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

## 29

# මහනුවර යුගයේ සමාජ විපර්යාසය සාම්ප්‍රදායික චිත්‍ර කලාව කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (දූල්වල අලංකාරේ නවකතාව ඇසුරිනි)

***සුභාෂිණී වේරගොඩ, ඩබ්. ඒ. ඩබ්.***[1]

ලක්දිව යටත්විජිත රාජ්‍යයක් බවට පත් වීමෙන් පසු ව මෙරට සමාජ, ආර්ථික, දේශපාලන ආදි වූ සෑම අංගයක ම මෙන් ම චිත්‍ර කලාවේ ද පුළුල් වෙනසක් ඇති වූ නිසා ලක්දිව සාම්ප්‍රදායික චිත්‍ර කලාව ශීඝ්‍රයෙන් පරිහානියට පත්වන්නට විය. අනුරාධපුර යුගයෙන් ආරම්භ වූ ඒ සාම්ප්‍රදායික චිත්‍ර කලාව මහනුවර යුගය වන විට විවිධ වෙනස්කම්වලට භාජන වීමට ප්‍රබල ලෙස බලපෑ හේතුව නම් දහනව වන සියවසේ මෙරට සමාජයේ ප්‍රබල වෙනස්කම් ඇති කළ සාධක වූ මුඩුබිම් පනත, විහාර දේවාලගම් පනත හා යුරෝපීය සංස්කෘතියේ සෘජු බලපෑමයි. 1815න් පසු ව ඇති වූ මෙම සමාජ විපර්යාසයේ වේගය මෙන් ම ප්‍රතිඵලය ද බොහෝ රටවැසියන්ට ඔරොත්තු නොදුන්නේ ය. 2016 වර්ෂයේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උලෙළේ දී හොඳ ම නවකතාවට හිමි සම්මානයෙන් පිදුම් ලද සුමුදු නිරාගී සෙනෙවිරත්නගේ දූල්වල අලංකාරේ නවකතාවට පසුබිම් වූයේ මෙකී සමාජ තත්ත්වයයි. දේශීය චිත්‍ර කලාව හා සම්බන්ධ පාරම්පරික චිත්‍ර ශිල්පියෙකු වන මෙම නවකතාවේ කථානායකයාට මෙන් ම ඔහුගේ සමකාලීනයන්ට ද මෙම සමාජ විපර්යාසය හේතුවෙන් කලාව රැක ගැනීමත් ජීවන අරගලයත් යන ගැටලු දෙක ම සඳහා සටන් වදින්නට සිදු විය. සිය පාරම්පරික ශිල්ප ඥානය රකින්නට උත්සාහ කළ සෑම ශිල්පයෙකු ම, නව ධනෝපායන මාර්ග සොයා යෑම හා යුරෝපීය කලා ශිල්ප කෙමෙන් ස්ථාපිත වීම යන අභියෝගවලට මුහුණ දී ඇත. මේ සඳහා දූල්වල අලංකාරේ නවකතාව පිළිබඳ අධ්‍යයනයක් කොට එහි ප්‍රතිඵල ලෙස මෙරට සාම්ප්‍රදායික සිතුවම් ආර යටපත් වී යුරෝපීය ආභාසය සහිත ස්වාභාවිකවාදී සිතුවම් කලාවක් ස්ථාපිත වූ ආකාරය දූල්වල අලංකාරේ නවකතාවෙන් කෙතෙක් දුරට නිරූපණය වන්නේ ද යන්න පිළිබඳ ව ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

ප්‍රමුඛ පදඃ දූල්වල අලංකාරේ, සමාජ විපර්යාසය, චිත්‍ර කලාව, පාරම්පරික ශිල්ප ඥානය, ස්වාභාවිකවාදී සිතුවම් කලාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*

30

# මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ කාව්‍යකරණයෙහි මතුවන විරෝධාකල්පය පිළිබඳ විමසුමක්

*ප්‍රේමකුමාර, සසින්ද ගිම්හාන්*[1]

නූතන නිර්මාණ සාහිත්‍යයෙහි කැපී පෙනෙන ලේඛකයෙකු වශයෙන් මහින්ද ප්‍රසාද් මස්ඉඹුල හැඳින්විය හැකි ය. ගැඹුරු සමාජ දෘෂ්ටියක පිහිටා සිය නිර්මාණකරණය මෙහෙයවන මොහු සමාජගත දුර්වලතා පිළබඳ ව සිය විරෝධාකල්පය දක්වන්නේ ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයෙහි අරමුණයි. ඒ අනුව ඔහුගේ 'හිරුත් හිම පියල්ලක' (2010) සහ 'ඇහි පියන් ඇහැරිලා' (2012) නමැති කාව්‍ය සංග්‍රහ ද්විත්වය මූලාශ්‍රය ලෙස ගනිමින් අප සිදු කළා වූ මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි, මස්ඉඹුල කවියා සිය කාව්‍යකරණයෙන් සමාජගත දුර්වලතා වන දේශපාලන බල අරගලය, කුල භේදය, වර්ගවාදය, ආර්ථික දරිද්‍රතාව, විරැකියාව, ස්ත්‍රියට සිදු වන කායික, මානසික පීඩාව සහ පුද්ගල විෂමාචාර ක්‍රියා යනාදිය කෙරෙහි දැඩි විරෝධයක් එල්ල කර තිබේ. මෙලෙස කාලීන අවශ්‍යතාව මත සිය කවිය මෙහෙය වූ මහින්ද ප්‍රසාද් මස්ඉඹුල කවියා සහෘදයන් අතර වඩාත් කතාබහට ලක් වූයේ කලාත්මක සංයමයෙන් යුතු ව සමාජයේ පවතින දුර්වලතා වැළැක්වීම සඳහා මහත් පරිශ්‍රමයක් දරන කවියෙකු වශයෙනි.

ප්‍රමුඛ පදඃ මහින්ද ප්‍රසාද් මස්ඉඹුල, සමාජ දෘෂ්ටිය, සමාජගත දුර්වලතා, විරෝධාකල්පය

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* Sasindagimhan@gmail.com

## 31

# මළගිය ඇත්තෝ නවකතාවේ දෙවොන්දරා සං හා මිනිස් සිතේ ගූඪත්වය

*දහනායක, එච්. ටී.*[1]

එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'මළගිය ඇත්තෝ' නවකතාවේ දෙවොන්දරා සංගේ චරිතයෙන් පුහුදුන් මිනිස් සන්තානයේ ගූඪත්වය විශද කෙරෙන ආකාරය විමර්ශනයට ලක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙම පර්යේෂණයේ දී වැදගත් වන්නේ මළගිය ඇත්තෝ නවකතාවේ ඇතුළත් දෙවොන්දරා සංගේ චරිතයෙහි පවත්නා ගූඪත්වය අනාවරණය කර ගැනීමයි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ දෙවොන්දරා සංගේ චරිතය ගූඪ ලක්ෂණ සහිත වූවක් ද යන්නයි. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් සරච්චන්ද්‍රගේ මළගිය ඇත්තෝ නවකතාව ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස ඒ පිළිබඳ ප්‍රාමාණික උගතුන් විසින් සම්පාදනය කරන ලද පර්යේෂණ ග්‍රන්ථයනුත් ඇසුරු කෙරේ. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස නොරිකො සං නම් ජපන් යුවතිය කෙරෙහි ඔහු සිතෙහි හට ගන්නා අප්‍රකාශිත ප්‍රේමය නවකතාව මඟින් පාඨක ප්‍රජාවට අවබෝධ කර ගත හැකි ය. විවිධ විපර්යාසයන්ට තුඩු දෙන දෙවොන්දරා සංගේ චෛතසිකය, ඔහු මරණය දක්වා ම කැඳවා ගෙන යන ප්‍රේමය, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථය, කෝපය ආදි ආවේග හමුවේ කියාත්මක වන්නේ පෘථග්ජන මිනිසාගේ සිතේ ස්වභාවයෙහි පවතින විචලනය ගම්‍යමාන කරමිනි. ඒ මඟින් ගොඩනැගෙන සමාජ දේහයේ ක්‍රියාකාරිත්වය නැවතත් පුද්ගලයා කෙරෙහි බලපවත් වන ආකාරය ද මේ කෘතිය මඟින් ප්‍රකට කෙරේ. එසේ ම පුද්ගල සිතුවිලිවල පවතින භව්‍ය අභව්‍ය රූපණය අවසාන වශයෙන් මිනිසාගේ අභ්‍යන්තර ජීවිතය ප්‍රතිපෝෂණය කිරීම කෙරෙහි සිදු කරන බලපෑම ද දෙවොන්දරා සංගේ චරිතය මඟින් නිරීක්ෂණය කළ හැකි ය. අවස්ථාවෙන් අවස්ථාවට දෙවොන්දරා සංගේ චිත්ත සන්තානයෙහි පැනනඟින ආවේග, මිනිසාගේ සැඟවුණු ජීවිත යථාර්ථය පසක් කරන්නේ කවර පදනමකින්දැයි යන්න මෙහි දී හඳුනාගත හැකි ය. මේ අනුව බලන විට මෙම පර්යේෂණයේ නිගමනය ලෙස මළගිය ඇත්තෝ නවකතාවේ දෙවොන්දරා සංගේ චරිතය නිෂ්ක්‍රීය වූවක් නොව මිනිස් දහමට පොදු සිතුම් පැතුම් සහිත ඇතුළු හදට නැඹුරු වූ පුද්ගල චරිතයක් බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ  මළගිය ඇත්තෝ, දෙවොන්දරා සං, නොරිකො සං, ගූඪත්වය, සරච්චන්ද්‍ර

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, සිංහල අධ්‍යයනාංශය.*

32

# මීනා නවකතාවෙන් මතුවන කතුවරයාගේ ස්වාධීනත්වය

***ප්‍රියදර්ශනී, ඩී. එච්. සී. ඒ.***[1]

ප්‍රථම සිංහල නවකතාව ලෙස බොහෝ පාඨකයන් විසින් සලකනු ලබන මීනා නවකතාව 1905 දී අලුත්ගමගේ සයිමන් ද සිල්වා විසින් රචනා කරන ලද්දකි. රසවත් කතාන්දරයක් සහිත මෙම දීර්ඝ වෘත්තාන්තය තුළ කතුවරයාගේ දක්ෂතා මැනවින් ප්‍රකට කෙරේ. මීනා නවකතාවට පූර්ව යුගයේ ලියැවුණු අයිසැක් ද සිල්වා පියතුමාගේ වාසනාවන්ත පවුල හා කාලකන්නි පවුල (1888), බෙන්තොට ඇල්බට් ද සිල්වාගේ විමලා (1892), ආදරහසුන (1892), සිරිබරී (1894), හා වෙසක් දූතයා (1894) පියදාස සිරිසේනගේ ජයතිස්ස හා රොසලින් (1904), යන නවකතා හා සසඳන විට මීනා නවකතාවේ ස්වාධීන ලක්ෂණ හඳුනා ගැනීමට ප්‍රයත්න දැරීම මේ පර්යේෂණයේ අරමුණ වේ මේ සඳහා ප්‍රාථමික මුලාශ්‍රය ලෙස මීනා නවකතාව ගනු ලබන අතර වාසනාවන්ත පවුල හා කාලකන්නි පවුල, විමලා, ආදර හසුන, සිරිබරී, වෙසක් දූතයා, ජයතිස්ස හා රොසලින් යන සිංහල නවකතා ද්විතීයික මූලාශ්‍රය කොට ගනිමින් මීනා නවකතාකරුවාගේ නිර්මාණ කුශලතා පුස්තකාල ඇසුරින් දත්ත ලබා ගැනීම මාගේ පර්යේෂණයේ ක්‍රමවේදය වේ. උචිත ව්‍යවහාර භාෂාවක් හා චරිත චරිත නිරූපණයෙන් බැහැරව කාව්‍ය ගුණයෙන් අනූන සාර්ථක අවස්ථා, සිද්ධි නිරූපණය හා ස්ත්‍රිය කෙරෙහි ප්‍රගතිශීලී දෘෂ්ටියකින් බැලීමට නවකතාකරුවා දක්වා ඇති අවධානය මේ පර්යේෂණය මඟින් නිරීක්ෂණය කෙරේ. සමකාලීන කතුවරයන් ධර්ම ප්‍රචාරය සමාජ, සංශෝධනය හා දේශ වාත්සල්‍යය ආදි සමාජ ගත අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ම ප්‍රබන්ධ රචනා කොට ඇති අතර අලුත්ගමගේ සයිමන් ද සිල්වා එසේ නොවී තම ස්වාධීනත්වය පෙරටුකොට ගනිමින් ප්‍රබන්ධකරණයේ යම් බඳු ප්‍රබලතාවක් ප්‍රකට කර ඇති බව හඳුනා ගැනීම මේ පර්යේෂණයේ ප්‍රතිඵලය වේ.

ප්‍රමුඛ පදඃ අලුත්ගමගේ සයිමන් ද සිල්වා, කතුවරයා, ප්‍රබන්ධ, මීනා, ස්වාධීනත්වය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

33

# මුවදෙව්දාවත කෙරෙහි පූර්ව සංස්කෘත කාව්‍යයන් බලපා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

*දිසානායක, ඩී. එම්. ඩී එම්.*[1]

පොලොන්නරු යුගයෙහි විරචිත හෙළ ගී කාව්‍ය අතර ආරම්භක කාව්‍ය කෘතියක් වන මුවදෙව්දාවත බුදුන්වහන්සේගේ ගුණ මහිමයන් දැක්වීම සඳහා රචිත ය. කර්තෘ අඥාත කෘතියක් වන මෙය ගී එකසිය හැට හතරකින් සමන්විත ය. මෙයට මූලාශ්‍රය වූයේ ජාතාවේ අපණ්ණක වර්ගයෙහි නවවැන්න වන මඛාදේව ජාතකයයි. මුවදෙව්දාවත රචිත පොලොන්නරු සමයේ ආරම්භක භාගයේ බෙහෙවින් සම්භාවිත කාව්‍ය ක්‍රමය වූයේ සංස්කෘත කාව්‍ය සම්ප්‍රදායයි. ඒ අනුව මේ පර්යේෂණයේ අරමුණ වනුයේ මුවදෙව්දාවත කර්තෘට සිය කාව්‍යය රචනා කිරීමේ දී පූර්ව සංස්කෘත කාව්‍යයන්ගේ ආභාසය කෙතෙක් දුරට බලපා තිබේ ද යන්න විමසීමයි. එහි දී කාලිදාසයන්ගේ රඝුවංසය හා කුමාරදාසයන්ගේ ජානකීහරණය ආශ්‍රයෙන් නිදර්ශන දැක්වීමත් වෙනත් සංස්කෘත කාව්‍ය බලපා තිබෙන ආකාරය අධ්‍යයනය කිරීමත් මෙහි අරමුණයි. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් මුවදෙව්දාවත, රඝුවංසය, ජානකීහරණය යනාදිය ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මුවදෙව්දාවත පිළිබඳ විස්තර සහිත ලිපි ඇතුළත් ග්‍රන්ථ, වාරසඟරා හා පුවත්පත් ද යොදාගෙන තිබේ. ඒ අනුව මුවදෙව්දාවත රචනා කිරීමේ දී සංස්කෘත කාව්‍යයන්හි අන්තර්ගත අදහස් ඒ අයුරින් ම යොදාගෙන තිබීමෙනුත් සංස්කෘත කවීන් අනුදත් වැනුම් සිය කාව්‍යයට එක්කර තිබීම තුළිනුත් මුවදෙව්දාවත කෙරෙහි පූර්ව සංස්කෘත කාව්‍යයන් බොහෝ දුරට බලපා තිබෙන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ මුවදෙව්දාවත, මඛාදේව ජාතකය, රඝුවංසය, ජානකීහරණය, පොලොන්නරු යුගය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* dilkadissanayaka1993@gmail.com

## 34

## මුවදෙව්දාවත රචනා වීමට බලපෑ දේශපාලනික පසුබිම පිළිබඳ විවරණයක්

*විස්නා ලක්මාලි, එල්. ජී.*[1]

සිංහල පද්‍ය සාහිත්‍යයේ දැනට හමුවන පැරණිතම පද්‍ය ග්‍රන්ථය ලෙස හඳුනාගත හැකි ය. අනුචිත වර්ණනාවලින් යුතු කාව්‍ය ග්‍රන්ථයක් ලෙස බොහෝ දෙනාගේ විවේචනයට බඳුන් වුව ද, පාලන තන්ත්‍රය පිළිබඳ මෙහි යටින් දිවෙන අදහස අගය කළ යුත්තකි. මුවදෙව්දාවත මඟින් කතුවරයා මඛාදේව ජාතකයේ එන මඛාදේව රජුගේ බෝසත් ගුණ වර්ණනා කිරීමට පෙලඹී ඇත. නමුත් කතුවරයාගේ මුඛ්‍ය අරමුණ වූයේ මෙය ම දැයි සැකයක් පවතී. තත්කාලීන පාලක පන්තියේ බලලෝභී පාලනයට විරුද්ධ ව පහර එල්ල කිරීමට මෙම කෘතිය රචනා කරන්නට ඇත. මෙසේ සිය කෘතිය රචනා කිරීමේ දී ඔහුට බලපෑ දේශපාලන පසුබිම කවරේ ද යන්න පිළිබඳ විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණ වේ. මේ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය නම් ප්‍රාථමික මූලාශ්‍රය පාදක කොට ගැනීමයි. මුවදෙව්දාවත ලියැවුණු අවධියේ හා ඊට පෙර අවධිවල මෙරට පාලන තන්ත්‍රය අවුල් වියවුල් ස්වභාවයක් ගත් ආකාරය ඉතිහාසය පරීක්ෂාකර බැලීමේ දී පැහැදිලි වේ. පාලක පන්තියේ බල තණ්හාව ඊට ප්‍රධාන හේතුව විය. මෙහි ප්‍රතිඵලය වූයේ රජවරුන්ට, ඇමැති-ඇමතිවරුන්ට, යුද භටයන්ට මෙන්ම සාමාන්‍ය ජනයාට ද මරණය අත් වීමයි. මේ සඳහා විසඳුම් වන්නේ පාලක පන්තිය සිය ආත්මාර්ථකාමීත්වය අතැර පරාර්ථකාමීත්වයෙන් යුතු ව කටයුතු කිරීමයි. මෙම යුගයේ පාලන කටයුතු ගෙනගිය පාලක පන්තියට පහර ගැසීම සිය මූලික අරමුණ කරගත් නිසා මහා කාව්‍යයක් සතු විය යුතු අංග බොහෝමයක් කතුවරයා අතින් ගිලිහෙන්නට ඇත. මේ අනුව පැහැදිලි වන්නේ මුවදෙව්දාවත තත්කාලීන යුගයේ දේශපාලනික සිදුවීම් මුල්කොට ගනිමින් රචනා වූ කාව්‍ය ග්‍රන්ථයක් බවයි.

ප්‍රමුඛ පදඃ දේශපාලනය, පාලක පන්තිය, පාලන තන්ත්‍රය, මඛාදේව, මුවදෙව්දාවත

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*

35

# මුහුණුපොතෙන් සිංහල භාෂාවට එක් වූ නව්‍ය ව්‍යවහාරයන්හි බලපෑම

ලක්මාලි, ජී. ඩී. ඩබ්.[1]

වර්තමානයේ සන්නිවේදනයේ දී විවිධ සමාජ මාධ්‍ය භාවිත කරන ආකාරය හඳුනා ගත හැකි ය. YOUTUBE, TWITTER, GOOGLE PLUS වැනි සමාජ මාධ්‍ය අතර බොහෝ පිරිසක් භාවිත කරන සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් මුහුණුපොත හැඳින්විය හැකි ය. විශේෂයෙන් ම තරුණ පරපුර අතර මෙම මාධ්‍ය බහුල වශයෙන් භාවිත වන ආකාරය දැකගත හැකි ය. දිනෙන් දින මුහුණපොත භාවිත කරන පිරිස් ඉහළ යෑමක් දැකගත හැකිවන්නා සේ ම එමගින් භාෂාවට එක්වන නව්‍ය ව්‍යවහාර ද වැඩි වී ඇති අයුරු ද හඳුනා ගත හැකි ය. මෙලෙස එක්වන නව්‍ය ව්‍යවහාර හේතුවෙන් භාෂාව පරිහානියට පත්වන බව බොහෝ පිරිසකගේ මතය වේ. එසේ වුව ද මුහුණුපොත මගින් සිංහල භාෂාවට එක්වන මෙම නව්‍ය ව්‍යවහාර භාෂාවේ උන්නතිය කෙරෙහි ද බලපාන බව පැවසිය හැකි ය. ඒ අනුව මුහුණුපොත මගින් සිංහල භාෂාවට එක්වන මෙම නව්‍ය ව්‍යවහාර භාෂාවේ උන්නතිය කෙරෙහි මෙන් ම අවනතිය කෙරෙහි කෙසේ බලපා තිබේ ද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම පර්යේෂණය සම්මුඛ සාකච්ඡා ඇසුරින් කරන ලද අධ්‍යයනයකි. එහි දී 2016 ජනවාරි මාසයේ සිට නොවැම්බර් දක්වා කාල පරාසය තුළ මුහුණුපොත භාවිත කරනු ලැබූ පුද්ගලයින් පිරිසක් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් තොරතුරු රැස් කරන ලදි. මෙහි දී පුවත්පත්, සඟරා, අන්තර්ජාලය මගින් තොරතුරු රැස් කිරීම සිදු විය. එහි දී මුහුණුපොත මගින් සිංහල භාෂාවට එක්වන නව ව්‍යවහාර භාෂාව කෙරෙහි බලපාන ආකාරය සාධක ඇසුරින් විධිමත් අධ්‍යයනයකට ලක් කෙරෙයි.

ප්‍රමුඛ පද: අවනතිය, උන්නතිය, නව ව්‍යවහාර, මුහුණුපොත, සිංහල භාෂාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

36

## මුහුණු පොතේ බලපෑම නිසා සිදු වන භාෂා ගතිකත්වය පිළිබඳ විමසීමක්

*සෙව්වන්දි මනෝරත්න, ඒ.*[1]

මනුෂ්‍ය භාෂාව යනු හැඟීම්, අදහස් හා අභිලාෂයන් තවත් පුද්ගලයෙකුට සන්නිවේදනය කිරීම සඳහා මිනිසා විසින් ම නිෂ්පාදනය කර ගන්නා ලද්දකි. එකිනෙකට වෙනස් සමාජ සංස්කෘතිවලට අනුකූල ව හැඩ ගැසුණු භාෂාව සමාජ සම්මතයකි. භාෂාවේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස ගතිකත්වය දැක්විය හැකි ය. භාෂාවේ ගතිකත්වය කෙරෙහි බලපාන සාධක බොහොමයක් දක්නට ලැබේ. එයින් එක් නවතම සාධකයක් ලෙස මුහුණු පොත (Facebook) දැක්විය හැකි ද යනුවෙන් මතු වූ සංශය නිසා මුහුණු පොත, අද්‍යතන සිංහල භාෂාවේ ගතිකත්වය කෙරෙහි බලපාන්නේ කෙසේ ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. දිනෙන් දින මුහුණු පොත මගින් හාස්‍යය, උපහාසය, අපහාසය, දැනුම හා ධර්ම කරුණු ඇතුළත් පළ කිරීම් (Posts) ද විවිධ සමාජ සංසිද්ධීන් ද අන්තර්ජාලයට එකතු වෙයි. එහි දී දෛනික ව වාර්තා කරනු ලබන විවිධාකාර වූ සිද්ධීන් සමාජගත වීමෙන් භාෂාවේ ගතිකත්වය සිදු වන ආකාරය පිළිබඳ ව විමසීමට මුහුණු පොත භාවිත කරන මෙන් ම භාවිත නොකරන පුද්ගල නියැදි කෙරෙහි ද සමාජ හා වාග්විද්‍යා ලිඛිත මූලාශ්‍රයයන් කෙරෙහි ද මෙහි දී විශේෂ අවධානයක් යොමු වෙයි. ඒ අනුව මුහුණු පොතේ පළවන ඇතැම් සිද්ධිවල දී එම සිදුවීම්වලට සම්බන්ධ පුද්ගලයන් විසින් පවසනු ලබන ඇතැම් වදන් (නිදඃ අදාළ නෑනේ, ඔබට සතුටුයි ද දැන්...) මුහුණු පොතේ ඇතැම් පිටුවල පාලකවරුන් (Page Admin) ප්‍රකෘති ස්වරූපයෙන් හෝ විකෘති ස්වරූපයෙන් පළකරනු ලැබීම හේතුවෙන් හා නිරන්තර භාවිතය හේතුවෙන් එය සමාජ සම්මතයක් බවට පත්වීමෙන් අද්‍යතන භාෂණ සමාජයේ දී ද එම ප්‍රකාශයන් උපයෝගී කර ගනිමින් පුද්ගල සංවාද සිදු වන අයුරු දකින්නට ලැබෙන අතර මුහුණු පොතෙහි පළ වන ඇතැම් සිදුවීම් අද්‍යතන සිංහල භාෂණ සමාජය කෙරෙහි බලපෑම් කරන බව ඒ ඇසුරින් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ භාෂාව, ගතිකත්වය, මුහුණු පොත, සමාජ සංසිද්ධීන්, අන්තර්ජාලය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*

37

# යථාර්ථ ප්‍රතිනිර්මාණ විධික්‍රමයක් වශයෙන් මායා යථාර්ථවාදයේ භාවිතය හා මොහාන් රාජ් මඩවලගේ නවකතා

*ලක්මාලි, ඩබ්ලිව්. ජී. ඩී. එන්.*[1]
*සේනානායක, සසී ලවන්දි.*[2]

යථාර්ථවාදයේ ප්‍රධාන අරමුණ තත්ත්වානුකූල ලෙසත්, තර්කානුකූල ලෙසත් මිනිස් සමාජය නිර්මාණය කිරීම ය. මේ හා සම්බන්ධ විවිධ ප්‍රභේද පවතින අතර මායා යථාර්ථවාදය එයින් එකකි. සත්‍ය ලෝකය හා සැබෑ ලෝකය සම්බන්ධ කරමින් සාහිත්‍ය නිර්මාණ බිහි කිරීමට අනුබල දීම මායා යථාර්ථවාදයේ දී සිදු වේ. මෙම මායා යථාර්ථවාදය පිළිබඳවත් මොහාන් රාජ් මඩවලගේ නවකතා පිළිබඳවත් විචාරවාදීන් විවිධ මත ඉදිරිපත් කළ ද, මොහාන් රාජ් මඩවලයන් භාවිත මායා යථාර්ථවාදය යථාර්ථ ප්‍රතිනිර්මාණයේ දී කෙතරම් දුරට සාර්ථකදැයි මේ දක්වා විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැත. එබැවින් යථාර්ථ ප්‍රතිනිර්මාණ විධික්‍රමයක් වශයෙන් මායා යථාර්ථවාදයේ භාවිතය හා මොහාන් රාජ් මඩවලගේ නවකතා පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණය මඟින් සිදු වේ. එහි දී මොහාන් රාජ් මඩවලගේ සියලු ම නවකතා අධ්‍යයනය කිරීමටත්, ඔහුගේ කෘති පිළිබඳ ව රචනා වූ විචාර ග්‍රන්ථ අධ්‍යයනය කිරීමටත්, අන්තර්ජාලය මඟින් දත්ත ගවේෂණය කිරීමටත් අපේක්ෂා කෙරේ. මායා යථාර්ථවාදී රීතිය බටහිර සාහිත්‍ය ආභාසයෙන් මෙරට සාහිත්‍යයට එක්වුණු නවාංගයක් බැවින් එම රීතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමත්, එම රීතිය අනුදත් නිර්මාණකරුවකුගේ නිර්මාණ විශ්ලේෂණය කිරීමත්, ඔහු විසින් අනුගමනය කරන ලද රීතිය කෙතරම් දුරට සාර්ථකදැයි අධ්‍යයනය කිරීමත්, ලොවීනා සිට රජිත දක්වා මඩවලයන්ගේ නවකතා නිර්මාණකරණයේ විශේෂතා අධ්‍යයනය කිරීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. එමඟින් මොහාන් රාජ්මඩවල මෙරට සිටින මායා යථාර්ථවාදය අනුගමනය කරන දක්ෂ ලේඛකයකු බව හඳුනාගත හැකි වීම මේ පර්යේෂණයේ ප්‍රතිඵලය සේ දැක්විය හැකි ය.

ප්‍රමුඛ පදඃ මායා යථාර්ථවාදය, නවකතා, බටහිර සාහිත්‍යය, මොහාන් රාජ් මඩවල, ප්‍රතිනිර්මාණය

1 *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Wgdnwewerallagedara@gmail.com
2 *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Sasisenanayakeuok@gmail.com

38

# සද්ධර්මරත්නාවලියේ කතා රීතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් කතා කිහිපයක් ඇසුරිනි)

*නුවන්ති, ආර්.පී.එස්.*[1]

දහම්කතා ලිවීමේ සාහිත්‍ය උන්නතිකාමීන්ගේ උත්සාහයේ කූටප්‍රාප්තිය ලෙස සද්ධර්මරත්නාවලිය නම් කළ හැකි ය. සද්ධර්මරත්නාවලිය ලියැවෙන්නේ දඹදෙණි යුගයේ (ක්‍රි. ව. 1220-1293) අතර කාලයේ දී ය. සදහම් නමැති රුවන් ඇමුණූ වැල යන අර්ථය දෙන සද්ධර්මරත්නාවලිය ධර්මසේන හිමියන්ගේ කෘතියකි. මේ සඳහා බුද්ධඝෝෂ හිමියන්ගේ ධම්මපදට්ඨකථාව ඇසුරු කොට ගෙන ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සද්ධර්මරත්නාවලියේ ඇතුළත් කතා රීතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. තත් ක්ෂේත්‍රය පිළිබඳ විවිධ පර්යේෂණ සිදු වී ඇතත් එහි කතා රීතිය පිළිබඳ ප්‍රමාණවත් පර්යේෂණයක් සිදු වී නොමැති වීම මෙහි වැදගත්කමයි. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ සද්ධර්මරත්නාවලියේ කතා රීතිය කෙබඳු ද යන්නයි. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගැනේ. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සද්ධර්මරත්නාවලිය ඇසුරෙන් තෝරා ගත් කතා කිහිපයකුත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස සද්ධර්මරත්නාවලිය පිළිබඳ පශ්චාත් කාලීන ප්‍රාමාණික උගතුන් විසින් රචිත විචාර ග්‍රන්ථත් භාවිතයට ගැනේ. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස හඳුනා ගැනීමට හැකි වූයේ ධර්මසේන හිමියන් පොදු ජනයා විෂය කොට ගෙන ගැමි වහර මැනවින් භාවිත කරමින් කතා රීතිය සකස් කර ගෙන ඇති බවයි. තව ද, දේශීය රීතිය ගුරු කොට ගත් වර්ණනාත්මක භාෂාවක් යොදා ගැනීමත් කැපී පෙනෙයි. මෙහි දී අනාවරණය කර ගත් තවත් කරුණක් වන්නේ අමාවතුරේ සංක්ෂිප්ත රීතියත් බුත්සරණේ දැක්වෙන වර්ණනාත්මක රීතියත් පසෙක ලා ධර්මසේන හිමියන් තමන්ට අනන්‍ය වූ ස්වාධීන කතා රීතියක් ගොඩනගා ගෙන ඇති බවයි. ඒ අනුව බලන විට සද්ධර්මරත්නාවලිය සිංහල සාහිත්‍යයේ නව මං පෙත් විවර කිරීමට සමත් වූ නවතම කතා රීතියක් භාවිත කෙරුණ ධර්ම ග්‍රන්ථයක් බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: සද්ධර්මරත්නාවලිය, කතා රීතිය, ව්‍යවහාර බස, ධම්මපදට්ඨකථාව, වර්ණනාත්මක රීතිය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

39

# සම්ප්‍රදාය - නව්‍යත්වය හා ගුණදාස අමරසේකරගේ අසක්දා කව

**සපුතන්ත්‍රි, අයි. එම්.**[1]

සමාජයේ සෑම ප්‍රපංචයක් සමඟ ම සම්ප්‍රදාය අවියෝජනීය ලෙස බැඳී පවතී. සාහිත්‍යය අරබයා ද එය සනාතනික වන අතර ම සෑම සාහිත්‍යකරුවෙකු ම සම්ප්‍රදායෙන් නිසඟයෙන් ම ආභාසය ලබයි. සම්ප්‍රදාය අර්ථාන්විත සංකල්පයක් බවට පත් කර ගැනීමේ දී ඒ හා බැඳී පවතින 'නව්‍යත්ව සංකල්පය' උපයුක්ත කොට ගත හැකි ය. සම්ප්‍රදාය හා නවීනත්වය යන විචාර සංකල්ප ගුණදාස අමරසේකරගේ 'අසක්දාකව' කෘතියෙහි නිරූපණය වන ආකාරය විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. ටී. එස්. එලියට් හා රේමන්ඩ් විලියම්ස් ආදි විද්වතුන් සම්ප්‍රදාය පිළිබඳ සාධනීය සංකල්ප ඉස්මතු කළ අතර 'එරික් හොබ්ස්බෝම්' හා 'ටෙරන්ස් රේන්ජර්' ආදි විද්වතුන් සම්ප්‍රදාය පිළිබඳ නිශේධනීය සංකල්ප ඉස්මතු කිරීමට පෙළඹිණ. මෙම පර්යේෂණයෙහි ගැටලුව වන්නේ අමරසේකරගේ 'අසක්දාකව' සම්ප්‍රදාය හා නවීනත්වය කෙතෙක් දුරට සාධනීය ලෙස උපයෝගී කර ගෙන ඇත්තේ ද යන්න විමර්ශනය කර බැලීම ය. මෙහි දී සම්ප්‍රදාය හා නවීනත්වය පිළිබඳ දේශීය හා විදේශීය විද්වතුන්ගේ සංකල්ප ද, ඒ හා සම්බන්ධ ව රචනා වී ඇති ශාස්ත්‍රීය හා පූර්ව පර්යේෂණ කෘති ආදි මූලාශ්‍රය ද භාවිත කරමින් දත්ත එක්රැස් කිරීම මඟින් පර්යේෂණය සිදු කෙරේ. මෙම පර්යේෂණයෙහි ප්‍රතිඵලය නම් පූර්වයේ රචනා වූ කෘති සඳහා බලපා ඇති සම්ප්‍රදායානුකූල ආකෘති හා සන්දර්භ ලක්ෂණ භාවිත කරමින් සේ ම නව්‍යකරණය වූ සිංහල කාව්‍ය සංකල්ප භාවිත කරමින් සිංහල කාව්‍ය නව්‍ය මාර්ගයකට අවතීර්ණ කිරීමට ගත් ප්‍රයත්නය සාර්ථක වී ඇති බව තහවුරු වීම ය. අමරසේකරගේ 'අසක්දාකව' සම්ප්‍රදායෙන් අනුරාව ලබමින් නව්‍යත්වයකින් පෝෂණය වී ඇති හෙයින් විද්වතුන්ගේ ඇගයීමට ලක් වෙමින් පවතී. කුමාරතුංග මුනිදාස, මහගමසේකර, විමල් දිසානායක හා බර්ට් බී. කුඩාහෙට්ටි ආදි කවියන්ගේ කෘති විශ්ලේෂණයේ දී මෙම සංකල්පද්වය භාවිත වී ඇති අයුරු පැහැදිලි කර ගත හැකි ය. මේ අනුව බලන කල සෑම සාහිත්‍ය කෘතියකට ම පාහේ පූර්වයේ වූ සම්ප්‍රදායේ අනුරාව ලැබෙන බවත් එය නව්‍යත්වයකින් යුක්ත ව පශ්චාත් කාලීන ව නැවත නිර්මාණය වන බවත් මෙමඟින් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ ආකෘතිය, සන්දර්භය, අනුරාව, සිංහල කාව්‍යය, විචාර සංකල්පය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සාහිත්‍ය විචාරය, සිංහල අධ්‍යයනාංශය,* imeshadi@gmail.com

# 40
# 'සමනල සංධ්වනිය' හා 'ඇගේ ඇස අග'යන චිත්‍රපටවලින් ප්‍රේමය පිළිබිඹු කරන ආකාරය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්.

*උදයකුමාර, එස්. එම්. කේ. එම්.*[1]

සමකාලීන සිනමා කලාව තුළ ප්‍රේමය තේමා කර ගනිමින් ප්‍රතිනිර්මාණය වූ චිත්‍රපට දෙකක් ලෙස ජයන්ත චන්ද්‍රසිරිගේ 'සමනල සංධ්වනිය' (2013) හා අශෝක හඳගමගේ 'ඇගේ ඇස අග' (2016) යන චිත්‍රපටයන් හඳුනාගත හැකි ය. පශ්චාත් කාලීන යුද මානසිකත්වයෙන් පිරිහුණු සමාජයක ප්‍රේමය තේමා කොට ගත් ගුණාත්මක ගණයේ නිර්මාණයන් බිහිවීමේ අවශ්‍යතාවක් මතු වී තිබුණි. මෙම චිත්‍රපට සාම්ප්‍රදායික සීමාවෙන් ඔබ්බට ගිය අසම්මතවාදී වූ සමාජ බැඳීම් තුළ සිරගත වූ ප්‍රේමයේ ස්වභාවය පිළිබඳ අවධාරණය කරනු ලබන නිර්මාණයන් ය. 'සමනල සංධ්වනිය' චිත්‍රපටයේ දී ගැටවරයෙකු හා බැඳුණු කුල කාන්තාවකගේ ප්‍රේමයක් ඉදිරිපත් කරයි. සංයමය තුළින් ගොඩනැගුණා වූ ආධ්‍යාත්මික ප්‍රේමය සමස්ත 'සමනල සංධ්වනිය' සිනමා නිර්මාණයෙහි දිග හැරේ. මෙහි දී වාදීෂ, පුන්‍යා ව මුල් වරට දකින අවස්ථාව හා චිත්‍රපටය අවසානයේ දී ඔහු ඇය ව වැලඳ ගැනීමට උත්සහ දරනු ලබන අවස්ථාවන් ප්‍රේමයේ ආධ්‍යාත්මික භාවයන් උද්දීපනය කරන බව පෙනී යයි. විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයෙකු හට ප්‍රේම කරනා නූතන යථාර්ථවාදී තාරුණ්‍යයේ චෛතසික ස්වභාවයන් හා ඒ හරහා සිදුවන්නා වූ සමාජ ගැටීම් පිළිබඳ 'ඇගේ ඇස අග' චිත්‍රපට තුළින් ඉදිරිපත් කරයි. මෙහි දී ආචාර්යවරයා රිතිකාගේ නොපැමිණීම හමුවේ ඇය ව සොයා යෑම හා අවසානයේ දී පන්සල මුල් කොට ගත් සිදුවීම් මාලාව, අසම්මත ප්‍රේමය තුළ සිර වී සිටින පුද්ගල මානසිකත්වය මනා කොට අවධාරණය වන සාධකයන්ගෙන් කිහිපයකි. මේ අනුව පෙනී යන්නේ 'සමනල සංධ්වනිය' තුළ දී ප්‍රේමය හා සමාජ බැඳීම් ආධ්‍යාත්මික හා සමාජ සම්මතයන් වටා ගෙතී ඉදිරිපත් කරනා අතර 'ඇගේ ඇස අග' චිත්‍රපටය තුළින් ප්‍රේමය වටා ගෙතුණ සමාජ බැඳීම් යථාරූපී භාවයකින් නිරූපණය කරන බවයි.

ප්‍රමුඛ පදඃ සමනල සංධ්වනිය, ඇගේ ඇස අග, අසම්මත, ආධ්‍යාත්මික, යථාර්ථවාදය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය. koshila.madushani11@gmail.com*

41

# සංචාරක ව්‍යාපාරය දක්ෂිණ ලංකාවේ සංස්කෘතියට කර ඇති බලපෑම

*හේමමාලි, කේ. ජී. එස්.*[1]


ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල දළ දේශීය ආදායමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සංචාරක ව්‍යාපාරය තුළින් පියවා ගැනේ. සේවා වියුක්තියට පිළියමක් ලෙස හා අඩු වියදමක් මත ආදායම් වැඩි කර ගත හැකි වීමත් යන හේතූන් නිසා සංචාරක ව්‍යාපාරය වර්තමානය වන විට ආර්ථික ප්‍රතිලාභ සහිත කර්මාන්ත අතර ඉදිරියට පැමිණ තිබේ. එහෙත් ආර්ථික වර්ධනය විෂයයෙහි සැලකිය යුතු දායකත්වයක් සැපයෙන සංචාරක ව්‍යාපාරය මඟින් මෙරට සංස්කෘතිය කෙරෙහි කිසියම් ඍණාත්මක බලපෑමක් සිදුවෙමින් පවතී. එමඟ ින් වඩාත් බලපෑම් එල්ල කෙරෙන්නේ මෙරට පහතරට සංස්කෘතිය කෙරෙහි ය. ඒ අනුව මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කෙරෙන්නේ සංචාරක ව්‍යාපාරය මඟින් මෙරට දකුණු පළාතේ වෙරළාසන්න ප්‍රදේශවල සංස්කෘතිය කෙරෙහි ඇති වන බලපෑම් පිළිබඳ ව ය. සංචාරක ව්‍යාපාරය පිළිබඳවත් මෙරට සංස්කෘතිය පිළිබඳවත් විවිධ පර්යේෂණ සිදු වී ඇතත් සංචාරක ව්‍යාපාරය දක්ෂිණ ලංකාවේ සංස්කෘතියට කර ඇති බලපෑම පිළිබඳ ව මෙතෙක් කිසිදු පර්යේෂණයක් සිදු වී නොමැති වීම මෙම පර්යේෂණය කෙරෙහි මා යොමු වීමට විශේෂ හේතුවක් විය. සංචාරක ව්‍යාපාරය පිළිබඳ නව දැක්මක් සහිත ප්‍රවීණ විද්වතුන්, හෝටල් කළමණාකරුවන් සහ සේවකයන්, දක්ෂිණ ලංකාවේ සංචාරක ව්‍යාපාරය වඩාත් ප්‍රචලිත ව පවතින ප්‍රදේශවලින් තෝරාගත් ජන කණ්ඩායම් සහ සමාජ සංස්කෘතික ගවේෂකයන් සමඟ සිදු කෙරෙන සම්මුඛ සාකච්ඡා හා ඔවුන් වෙත යොමු කෙරෙන ප්‍රශ්නාවලි මඟින් අදාළ දත්ත රැස් කෙරිණි. ඊට අමතර ව සංචාරක කර්මාන්තය අලළා රචනා කෙරුණු පොත්පත් මෙන් ම අන්තර්ජාලගත තොරතුරු ද භාවිතයට ගැනිණි. ආර්ථික වර්ධනය විෂයයෙහි දැවැන්ත මෙහෙයක් සිදු කරන සංචාරක ව්‍යාපාරය හේතුවෙන් විපර්යස්ත වී ඇති දක්ෂිණ ලංකාවේ සංස්කෘතිය පිළිබඳ ගවේෂණය කිරීමේ අරමුණෙන් සිදු කෙරුණු මේ පර්යේෂණය මඟින් වෙරළාශ්‍රිත ප්‍රදේශවාසීන් සංචාරකයින් අනුකරණයට පෙළඹීම සහ සාම්ප්‍රදායික රැකියාවන් අභාවයට යාම, එම ප්‍රදේශවල ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය භාවිතය, සමලිංගික සේවනය වැනි ක්‍රියාවන් ව්‍යාප්ත වීමෙන් සදාචාරාත්මක පරිහානියක් ඇති වීම යන බලපෑම් සිංහල සංස්කෘතිය මත පතිත වී ඇති ආකාරය හඳුනාගත හැකි විය.


ප්‍රමුඛ පදඃ සංචාරක ව්‍යාපාරය, දක්ෂිණ ලංකාව, සංස්කෘතිය, ආර්ථිකය, විපර්යස්ත වීම

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* s.h.kahandagamage@gmail.com

# 42

# සාම්ප්‍රදායිකත්වය නූතනත්වය හා ගළපා කවියට ජීවය දුන් ලාල් හැගොඩගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනයක්

*ජයවර්ධන, ආර්. ඒ. ඩී. ටී. එස්.*[1]

කාව්‍ය මාධ්‍යයෙහි ලා සමකාලීන සමාජ දේශපාලන වාතාවරණය සියුම් ව ග්‍රහණයට ගනිමින් වඩාත් කලාත්මක අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා ලාල් හැගොඩ කවියා ගත් වැදගත් වෑයම පිළිබඳ සමස්තයක් ලෙස මෙහි දී අගය කෙරේ. මෙකී වෑයම කාව්‍ය කිහිපයක් මගින් ඓතිහාසික ව හා න්‍යායාත්මක ව හැදෑරීමට ලක් වේ. ඔහුගේ කවිය නූතනත්වය හා ගැළපීමේ දී සමාජය තුළ ජනතාවාදී දෘෂ්ටිය ප්‍රතික්ෂේප වීම දක්නට ලැබිණි. මේ අතර දේශපාලන සටන්පාඨ කවි බවට පරිවර්තනය වීම, තරුණයාගේ විප්ලවයට සානුකම්පිත හැඟීමක් එක් කළ කවි මෙන් ම කවියේ ස්වරූපය, ආකෘතිය ආදිය නව්‍යාකාරයෙන් දැකීමක් ද මෙකල ප්‍රවණතා ලෙස දක්නට ලැබේ. ලෝකයේ වේගවත්වීම්වලට සාපේක්ෂ ව ප්‍රකාශන මුහුණුවර වෙනස් කරමින් මනුෂ්‍යත්වය, සොබාදහම දෙස වඩාත් සියුම් ව දැකීමේ දෘෂ්ටියකින් පරිපූර්ණ වෙමින් හැගොඩගේ කලඑළි බැසීම තුළින් සිංහල කවියට අමුතු අත්දැකීමක් ලබා දෙමින් මිනිස් චින්තනයේ සියුම් දෘශ්‍ය රූප මවමින් මිනිස් චින්තනය ප්‍රකෘතිමත් කළේ ය. ලාල් හැගොඩගේ ප්‍රතිභාපූර්ණ කවිය හුදු සෞන්දර්යාත්මක රොමෑන්තිකවාදී වෙමින් සැබෑ සමාජ ප්‍රශ්නවලින් වියුක්ත වූවක් නොවූ අතර සැබෑ සමාජ යථාර්ථය ප්‍රතිනිර්මාණය කළේ ය. සෞන්දර්යාත්මක මානුෂීය අත්දැකීම් හරහා ගලා යන කාව්‍ය සංකල්පනා ඔහුගේ කෘති කිහිපයක් ඇසුරින් හා සමකාලීන කවීන්ගේ කෘති හා සසඳමින් විචාර මත හා අදහස් ගළපමින් වඩාත් කාව්‍යාත්මක දෘෂ්ටියකින් හැදෑරීම තුළින් ප්‍රත්‍යක්ෂ කෙරේ. කවිය නම් වූ සියුම් ප්‍රකාශනය තුළින් ගෙන ගිය දෘෂ්ටිවාදය අතික්‍රමණය කරමින් සැබෑ මනුෂ්‍යත්වය ස්වභාව ධර්මය හා ගළපමින් සැබෑ ජනතාවක් අරමුණු කරමින් මිනිසාගේ ඉරණම දේශපාලනයේ, ආර්ථිකයේ එසේ ම ස්වභාව ධර්මයාගේ ද ඵලයක් බව විශිෂ්ට අයුරින් පෙන්වා දීම විද්‍යමාන වේ.

ප්‍රමුඛ පදඃ සමාජ යථාර්ථය, සියුම් දෘශ්‍ය රූප, මනුෂ්‍යත්වය, ස්වභාව ධර්මය, ප්‍රතිභාපූර්ණ කවියා

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* sewjaya92@gmail.com

43

# සිදත්සඟරා කතුවරයා ලිංග විග්‍රහයට දක්වා ඇති නිදර්ශන පිළිබඳ විමසුමක්

*උදයංගනී කේ. ඒ.*[1]

දඹදෙණි යුගය නොහොත් 13 වන සියවසේ දී පතිරාජ හිමියන් විසින් සම්පාදනය කරන ලද සිදත්සඟරාව මූලික කොට ගනිමින් විද්වතුන් අතර ගොඩනැගුණු මතවාද රාශියකි. ඒ අතර ලිංගාධිකාරයේ විග්‍රහ වන ලිංග භේදය ද මතවාද හා ගැටලු ඇති වීමට මුල් වූ අවස්ථාවකි. ලිංගය යනු ලක්ෂණයයි. ව්‍යාකරණ ලිංගය අභාවයට යෑම නිසා අර්ථය පමණක් සැලකිල්ලට ගනිමින් පැමිණි ලිංගය සමාජ ලිංගය වන අතර එය අර්ථානුගත ලිංගය වශයෙන් ද හඳුන්වනු ලබයි. ඒ අනුව සියලු ම ශබ්ද අචේතනික හා සචේතනික වශයෙන් කොටස් දෙකකට බෙදෙන අතර එහි දී සචේතනික ශබ්ද අතුරෙන් පුරුෂවාචී ශබ්ද පුරුෂ ලිංගයටත් ස්ත්‍රීවාචී ශබ්ද ස්ත්‍රී ලිංගයටත් අයත් සේ සැලකෙයි. අචේතනික ශබ්ද අයත් වනුයේ නපුංසක ලිංග ගණයට ය. නාමපද වරනැඟීමේ රටාව පදනම් කොට ගනිමින් තීරණය කරනු ලබන ලිංග භේදය ව්‍යාකරණ ලිංගයයි. මෙහි දී කිසියම් ශබ්දයක් අර්ථයෙන් ස්ත්‍රී ලිංග වුව ද පුරුෂ ලිංග වුව ද නපුංසක ලිංග වුව ද පුරුෂ ශබ්දයක් ලෙස වරනැගේ නම් පුරුෂ ලිංගයට ද ස්ත්‍රී ශබ්දයක් ලෙස වරනැගේ නම් ස්ත්‍රී ලිංගයට ද අන්‍ය ශබ්දයක් ලෙස වරනැගේ නම් නපුංසක ලිංගයට ද අයත් වේ. පාලි, සංස්කෘත මාතෘ භාෂාවල පැවතියේ මෙම ව්‍යාකරණ ලිංගයයි. නමුත් සිංහල භාෂාවේ තිබෙනුයේ අර්ථානුගත ලිංග භේදයයි. සිදත් කතුවරයා දක්වන ලිංග විග්‍රහය සහ එයට සපයන නිදර්ශන අතර පරස්පරතාවක් පවතී. එනම්, ඔහු 'පණින් හදන් යුත් පවසනුයේ පුම ලිඟු වේ - සහයොන් සතුන් කියලු සද වේ ඉතිරි ලිඟු නම්' යනුවෙන් ලිංග භේදය අර්ථානුගත ලිංගයට අනුව විග්‍රහ කරමින් ඒ සඳහා දක්වන නිදර්ශන ව්‍යාකරණ ලිංග යට අයත් වීම එම පරස්පරතාවට හේතුවයි. ඒ පිළිබඳ ව විමර්ශනයක යෙදීම මෙහි අරමුණ වන අතර සිදත් සඟරාව ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද සඟරා ලිපි, සංස්කරණ හා පුවත්පත් ලිපි ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ද යොදා ගැනේ.

ප්‍රමුඛ පදඃ සිදත්සඟරාව, පතිරාජ හිමි, අර්ථානුගත ලිංගය, ව්‍යාකරණ ලිංගය, අන්‍ය ශබ්ද

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* udayangigarusinhe456@gmail.com

# 44
# සිදත්සඟරාව පද්‍යකරණය සඳහා රචිත කෘතියකි යන මතය පිළිබඳ විමසුමක්

*චාන්දනී, ඩබ්.*[1]

සිදත්සඟරාව දැනට විද්‍යමාන ව පවතින පැරණිතම ව්‍යාකරණ ග්‍රන්ථයයි. මෙය 13 වන සියවසේ දී දඹදෙණි යුගයේ විසූ පතිරජ පරිවේණාධිපති හිමියන් විසින් රචනා කරන ලද බැව් පිළිගැනුණ ද මෙහි කර්තෘත්වය සම්බන්ධයෙන් පවතින විද්වත් මතය විවාදාපන්න ය. සිදත්සඟරාව සිංහල භාෂාවේ ව්‍යාකරණ ක්ෂේත්‍රය අලළා රචනා වුව ද එය කවි පබඳින ආධුනිකයන් විෂයෙහි කළ බව කෘතියෙහි සඳහන් වේ. එබැවින් මෙය රචනා වී ඇත්තේ සිංහලයේ ව්‍යාකරණය සම්බන්ධයෙන් ද නැතහොත් පද්‍ය බන්ධනය සඳහා ද යන්න විමසා බැලීම වැදගත් වේ. ඇතැම් විද්වතුන් අදහස් කරන පරිදි සිදත්සඟරාවේ එන බොහෝ සූත්‍ර හෝ සිද්ධාන්ත ව්‍යාකරණ ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනිකයින්ට ප්‍රයෝජනය සඳහා නොවන අතර එම සූත්‍ර හා සිද්ධාන්ත ග්‍රහණය කර ගැනීමට ව්‍යාකරණය පිළිබඳ පෘථුල දැනුමක් අවශ්‍ය වේ. දඹදෙණි යුගයේ ඓතිහාසික හා සාහිත්‍යමය මූලාශ්‍රය ඇසුරෙන් සිදු කළ මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි සිදත්සඟරාව, ව්‍යාකරණ ග්‍රන්ථයක් සේ සැලකුව ද එය පද්‍යකරණය සඳහා වූ විමර්ශනයක් බැව් පෙනේ. ඒ අනුව සිදත්සඟරාව සිංහල භාෂාවේ ව්‍යාකරණ ක්ෂේත්‍රයට වඩා පද්‍ය බන්ධනයට පිවිසෙන දුහුනන්ගේ දැනුම ප්‍රසාරණය කිරීමේ පරමාර්ථයෙන් රචනා වූ ග්‍රන්ථයක් බව ප්‍රතීයමාන වේ.

ප්‍රමුඛ පදඃ දඹදෙණි යුගය, පද්‍යකරණය, ව්‍යාකරණය, සිදත්සඟරාව, සූත්‍ර හා සිද්ධාන්ත

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Chandanibndr@gmail.com

45

# සිංහල පරිවර්තන සාහිත්‍යයේ මුල් නාම සහ ලේඛක නාම සම්බන්ධ තත් භාෂානුගත අධ්‍යයනයක් (තෝරා ගත් රුසියානු ග්‍රන්ථ කිහිපයක් ඇසුරිනි)

*ඩිල්ෂානි චතුරිකා දාබරේ, පී.*[1]

ලාංකේය සාහිත්‍ය වපසරියට සමීප සබඳතාවක් දක්වන රුසියානු සාහිත්‍ය ග්‍රන්ථ මෙරට පරිවර්තන සාහිත්‍යයෙහි ප්‍රමුඛතම ස්ථානය උසුලයි. රුසියානු ලේඛකයන් විසින් විරචිත විශ්වව්‍යාපී සාහිත්‍ය කෘති රුසියානු සහ ඉංග්‍රීසි යන භාෂා ද්වයෙන් ම සිංහල බසට පරිවර්තනය කළ ලේඛකයෝ බොහෝ වෙති. මෙම පරිවර්තනවල ග්‍රන්ථ නාම සහ ලේඛක නාම අධ්‍යයනයේ දී පැහැදිලි වන කරුණ නම් මුල් රුසියානු නාම එලෙසින් නොයොදා හෙළ බසට උචිත පරිදි භාවිත කර ඇති බවයි. රුසියානු භාෂාවට අනුව උච්චාරණය කිරීමේ දී ඉන් ඇතැම් නාම වෙනස් ස්වරූප දරන බැව් පැහැදිලි ව පෙනේ. මෙම වෙනස මාර්ටින් වික්‍රමසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර ආදි විචාරකයන්ගේ මැදිහත්වීම හේතුවෙන් සිදු වූවක් බවට ද මත පවතී. ඒ අනුව මෙම අධ්‍යයනයෙහි අරමුණ වූයේ මෙරට රුසියානු සාහිත්‍ය පරිවර්තකයන්ගේ සාධනීය ලක්ෂණ හඳුනා ගනිමින් තෝරා ගත් රුසියානු ග්‍රන්ථ කිහිපයක තත් භාෂානුගත සැබෑ උච්චාරණ ස්වරූප විමසීමයි. මේ සඳහා සුප්‍රකට රුසියානු ලේඛක ලියෝ තෝල්ස්තෝයිගේ 'යුද්ධය හා සාමය' (1869) සහ 'ඇනා කැරනිනා' (1877), ෆියොදෝර් දොස්තොයොවුස්කිගේ 'අපරාධය හා දඬුවම' (1866), 'කර්මසෝ සහෝදරයෝ' (1880) සහ 'යක්ෂයෝ' (1872), මැක්සිම් ගෝර්කිගේ 'අම්මා' (1907) සහ 'මගේ විශ්වවිද්‍යාල' (1923) ඇන්ටන් චෙකෝව්ගේ 'තුන් අවුරුද්ද' (1895) සහ 'චෙරිවත්ත' (1904) යන ග්‍රන්ථ යොදා ගැනිණි. පර්යේෂණ ක්‍රමවේදය සහ මූලාශ්‍රය වශයෙන් රුසියානු භාෂාව පිළිබඳ ප්‍රාමාණික වියතුන්ගේ ඇසුර මෙන් ම අන්තර්ජාල භාවිතය ද, රුසියානු ශබ්දකෝෂ සහ පරිවර්තන ග්‍රන්ථ පඨනය ද දැක්විය හැකිය. රුසියානු බසින් පරිවර්තන කටයුතු කරන දැදිගම වී. රුද්‍රිගු, එච්. බී. ජයරත්න, පද්ම හර්ෂ කුරණගේ යනාදි ලේඛකයන්ගෙන් කිහිපදෙනෙකු නිවැරදි මුල් රුසියානු ග්‍රන්ථ හා කතුවර නාම සිය කෘතිවල සඳහන් කර ඇත. ඉංග්‍රීසි බසින් පරිවර්තන කටයුතු කළ සිරිල් සී. පෙරේරා, ආනන්ද අමරසිරි, මුනිදාස සෙනරත් යාපා, චූලානන්ද සමරනායක, ස්වර්ණකාන්ති රාජපක්ෂ යනාදි ලේඛක ලේඛිකාවන්ගෙන් සුළුතරයක් පමණක් රුසියානු පිටපතෙහි නාමය එලෙසින් ම දක්වන බව පැහැදිලි ය. රුසියානු අක්ෂර මාලානුගත උච්චාරණයට අනුව ගත් කල ලෙව් තොල්ස්තොයි (лев толстой), ආන්තෝන් චෙහෝව් (Антóн чехов) ආදි වශයෙන් යථෝක්ත නාම සකස් විය යුතු ය. මෙම විග්‍රහයට අනුව පාඨකයා මෙතෙක් දැන සිටි රුසියානු ලේඛක සහ ග්‍රන්ථ නාම සිංහල උච්චාරණයට සාපේක්ෂ ව වෙනස් වන අතර මෙරට රුසියානු සාහිත්‍ය පරිවර්තකයන්ට අනන්‍ය වූ ලක්ෂණ පිළිබඳ ව ද වෙසෙස් අවධානය යොමු වනු ඇත.

ප්‍රමුඛ පදඃ රුසියානු උච්චාරණය, රුසියානු නාම, රුසියානු සාහිත්‍යය, සිංහල පරිවර්තන, සිංහල උච්චාරණය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

46

# සිංහල භාෂාවේ හලන්ත භාවිතයේ අවගමනයට බලපෑ හේතු

*කොබ්බෑකඩුව, එච්. ජී. ඒ. වී. කේ. එම්.* [1]

සිංහල ගද්‍ය භාෂාව, නූතන මිශ්‍ර සිංහල ස්වරූපයට පත්වීමේ මූලික අඩිතාලම දමෙන්නේ ක්‍රි. ව. 8 වැනි සියවසේ සිට ක්‍රි. ව. 13 වැනි සියවස දක්වා වූ මධ්‍යතන සිංහල අවධියේ දී ය. 'ඇ' කාරය, අර්ධානුනාසික (සඤ්ඤක), මහප්‍රාණ අක්ෂර, දීර්ඝ ස්වර භාවිතය, ඇතැම් තැනක අක්ෂර මධ්‍යගත 'අ' ස්වරය ගිලිහී යාම, වචනාන්තයේ 'අ' ස්වරය ගිලිහී යාම, එම නිසා හලන්ත ස්වභාවයක් ප්‍රකට වීම, මෙම යුගයේ භාෂා ලක්ෂණ විය. හලන්ත ස්වභාවයේ ප්‍රවණතාව හැර උක්ත සියලු ලක්ෂණ නූතන සිංහල භාෂාවේ තවමත් දැකිය හැකි වුව ද 'හ' කාරය හැර සියලු ම ව්‍යංජනාක්ෂරවල පාදාන්තයේ හලන්ත ස්වරූපය ගැනීමේ ප්‍රවණතාව, මධ්‍යතන සිංහල යුගයේ අවසානයටත් සියවස් දෙකකට පමණ පෙර (ක්‍රි. ව. 10 වන සියවසෙහි අවසානය පමණ වන විට) අභාවයට යාම විශේෂත්වයකි. ප්‍රස්තුත භාෂා යුගය පිළිබඳ සාකච්ඡා කෙරෙන විට, මේ පිළිබඳ ව විවිධ මත පළ වුව ද, ඍජු ව ඒ හා සම්බන්ධ විමර්ශනාත්මක පර්යේෂණයක් සිදු නොවීම ඌනතාවකි. සිංහල භාෂාවේ ශීඝ්‍ර දියුණුවක්, විශාල වෙනසක් හා ශීඝ්‍ර විකාසයක් ප්‍රකට කරන වැදගත් ම අවධියේ මුල් භාගයේ දී ඇරඹී, යුග ප්‍රවණතාවක් ව පැතිරී, යුගාවසානයටත් පෙර භාෂාවෙන් ඉවත් වූ, හලන්ත ශබ්ද ස්වරූපයට එසේ වූයේ මන්දැයි විමසා බැලිය යුතු ය. මේ සඳහා ක්‍රි. ව. 7, 8, 9 සියවස්වල සීගිරි ගී, කාලානුරූපී ව තෝරා ගත් ශිලාලේඛන, තත් කාලීන පොත්පත්, විද්වත් මතිමතාන්තර ක්‍රි. ව. 8 - 10 සියවස් සීමාව තුළ අධ්‍යයනයට ලක් කෙරෙමින්, හලන්ත ස්වරූපයේ අවගමනයට ප්‍රධාන හේතු විමර්ශනය කෙරේ.

ප්‍රමුඛ පදඃ මධ්‍යතන යුගය, හලන්ත, ප්‍රවණතාව, අවගමනය, ස්වරාන්ත

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* kobbekaduweanuradha@gmail.com

## 47

# සිංහලයේ අර්ධ අනුනාසික්‍ය ශබ්ද පිළිබඳ විමර්ශනයක්

*දේවානන්ද හිමි, තමාඩුවේ* [1]

අක්ෂර හැටකින් යුත් නූතන සිංහල හෝඩියේ ඇතුළත් 'ඟ, ඦ, ඬ, ඳ, ඹ' යන පසකුරු සඤ්ඤකාක්ෂර, අර්ධ අනුනාසික්‍යාක්ෂර යන නම්වලින් හැඳින්වේ. භාෂණ සිංහලයේ ඒ ගණන ද ඉක්මවන බැව් ස්වර නාසික්‍යකරණය (Nasalization) මඟින් විශද වේ. කිසි විටකත් හල් ව නොයෙදෙන මේ අක්ෂර අතුරෙහි ''ඦ'' යන්න ඉතාමත් විරල වශයෙන් ද සෙසු අක්ෂර බහුල වශයෙන් ද ව්‍යවහාර වේ. සිංහල භාෂා ඉතිහාසයේ මධ්‍යතන සිංහල අවධියේ සිට සඤ්ඤකාක්ෂර භාවිත විය. පෙණහල්ලේ සිට එන වායු ධාරාව උච්චාරණේන්ද්‍රිය පද්ධතිය තුළ දී විවිධ බාධා කිරීම්වලට භාජන වෙයි. එම වායු ධාරාව නාසාරන්ධ්‍රය ඔස්සේ පමණක් ගමන් කරවීමෙන් නිපදවෙන ශබ්ද නාසික්‍ය ශබ්ද ලෙස ද සැලකෙන අතර වායු කලාපය යම් පමණකට නාසාරන්ධ්‍රය හා මුඛරන්ධ්‍රය ඔස්සේ ගමන් කරවීමෙන් නිපදවෙන ශබ්ද අර්ධානුනාසික්‍ය ශබ්ද ලෙස හැඳින්වේ. අර්ධානුනාසික්‍යාක්ෂර සංයුක්තාක්ෂර වුව ද අද්‍යතන ව්‍යවහාරයේ කේවල ශබ්ද විශේෂයක් කොට නූතන ශබ්ද විද්‍යාඥයෝ පහදති. ඔවුහු ඒ සඳහා ස්පෙක්ට්‍රොග්‍රෑෆ් යන්ත්‍ර ද කිමෝග්‍රෑෆ් යන්ත්‍ර ද යොදා ගෙන සූක්ෂ්ම පර්යේෂණ කොට ඔසිලෝමික් වාර්තා (Osicillomink) ඉදිරිපත් කොට ඇත්තාහ. ඓතිහාසික ව සංයෝග යක් ලෙස ද උච්චාරණය අනුව කේවල ශබ්ද වර්ගයක් ලෙස ද, මෙම සඤ්ඤක ශබ්ද පවතින්නේදැයි යන කරුණාද්වය විමසීම මේ පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථයයි. මේ සඳහා සඤ්ඤකාක්ෂර පිළිබඳ ලියැවුණු ශාස්ත්‍රීය නිබන්ධ හා විචාරාත්මක ලිපි ද සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාවන්හි ප්‍රාථමික ව්‍යාකරණ ග්‍රන්ථ ද තත් භාෂාවල ම ද්විතීයික මූලාශ්‍රයාදිය ද මුඛ්‍ය කොට ඇසුරු කෙරේ. මේ නයින් සැලකීමේ දී සඤ්ඤකාක්ෂර හුදු කේවල ශබ්ද කොට්ඨාසයක් ලෙස ද සිංහල භාෂාවේ සන්නිවේදනයෙහි ලා මේ අක්ෂරවලින් හා ශබ්දවලින් මනා පිටුවහලක් ලැබෙන බැව් ද ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය.

ප්‍රමුඛ පදඃ සඤ්ඤකාක්ෂර, ඓතිහාසික, ශබ්ද විද්‍යාත්මක, සංයෝග, සන්නිවේදන, අක්ෂර

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය.*

48

# සීගිරි කිවිඳියන්ගේ නිර්මාණ ඇසුරෙන් හෙළි වන තත්කාලීන කාන්තාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*අප්සරා සඳමාලි ආර්. පී.*[1]

සීගිරි කුරුටු ගී සිංහල පද්‍ය සාහිත්‍යයට අයත් පැරණි මූලාශ්‍රයයක් වන අයුරු හඳුනාගත හැකි ය.  මෙම ගී අනුරාධපුර යුගයට අයත් ක්‍රි. ව. 8, 9 හා 10 ආදි සියවස්වල දී රචනා වූ බව පිළිගැනේ. පැරණි ශ්‍රී ලාංකේය ජන සමාජය පිළිබඳ කරුණු ගවේෂණයේ දී සීගිරි ගී වැදගත් ඓතිහාසික මූලාශ්‍රයයකි. සීගිරි ගී රචකයෝ විවිධ සමාජ ස්තර නියෝජනය කළහ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සීගිරි කිවිඳියන්ගේ නිර්මාණ ඇසුරින් හෙළි වන තත්කාලීන කාන්තාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. සීගිරි ගී ලියූවන් අතර පද්‍යකරණයේ නියලුණු කාන්තාවන් ඇත්තේ කිහිපදෙනෙකි. සීගිරි බිතු සිතුවම්වලින් නිරූපිත කාන්තාවන් හා තදනුබද්ධ අපර මූලාශ්‍රයන් පිළිබඳ ප්‍රාමාණික පර්යේෂණයන් සිදුකර ඇතත්, සීගිරි ගී ලියූ කාන්තාවන් පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කර නොමැත. එම නිසා සමකාලීන සමාජයේ කාන්තාවගේ භූමිකාව ගවේෂණය කිරීමේ දී සීගිරි සිතුවම්වලට වඩා සීගිරි කිවිඳියන්ගේ නිර්මාණ කොතෙක් දුරට වැදගත් වේ ද? යන්න මාගේ පර්යේෂණ ගැටලුවයි. මේ සඳහා අනුගමනය කෙරෙන ක්‍රමවේදය වන්නේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරෙන් කරුණු විග්‍රහ කිරීමයි. ප්‍රාථමික මූලාශය්‍ර ලෙස සීගිරි ගී ද, ද්විතීයික මූලාශ්‍රය ලෙස පශ්චාත් කාලීන ප්‍රාමාණික උගතුන් විසින් සම්පාදනය කරන ලද විචාර ග්‍රන්ථ ද ඉවහල් කර ගැනේ. එහි දී සීගිරි කිවිඳියන් අතර විවිධ ප්‍රදේශ, විවිධ ස්ථර නියොජනය කළ කාන්තාවන් ද කුලය, අධ්‍යාපනය ආදිය අතින් පුරුෂයන් පවා අභිභවා ගිය කාන්තාවන් ද සිටි බව හඳුනාගත හැකි විය. පුරුෂ මූලික සමාජ ක්‍රමය තුළ වුව ද ස්ත්‍රියට හිමි විය යුතු නිසි ස්ථානය හිමි වූ බව පෙනේ. මේ අනුව 8 හා 9 සියවස් වන විට ලාංකේය කාන්තාව සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික කටයුතුවල දී වඩාත් ස්වාධීන ව කටයුතු කළ බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ  කාන්තාව, කිවිඳියෝ, භූමිකාව, ස්වාධීනත්වය, සීගිරි ගී

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*

## 49

# සීගිරි ගීයේ ස්ත්‍රී-පුරුෂ අසම්මතය හා බැඳුණු මනෝ විවරණය

*වරුණි වත්සලා, පී. ඩබ්.*[1]

සිංහල සාහිත්‍යයේ සුවිශේෂ යුගයක් ලෙස අනුරාධපුර යුගය වැදගත් ය. මෙකල සාහිත්‍යය, ගද්‍යය හා පද්‍යය වශයෙන් ද්විඛණ්ඩනයකට ලක් කොට හඳුනා ගත හැකි ය. ඒ අතර පද්‍ය සාහිත්‍යයේ අනුස්මරණීය නිර්මාණයක් වන්නේ සීගිරි පද්‍යයයි. සීගිරි ගී නිර්මාණ බොහොමයක් දේශීය සම්ප්‍රදායානුගත නිර්මාණ වන අතර ඒවායේ විශේෂිත වූ අලංකාර, කාව්‍ය උපක්‍රම පැවතිණ. සීගිරි ගී රචකයෝ ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි නානාවිධ අදහස් මනෝභාවයන් සහිත වුවෝ ය. ඔවුන් අතර සාමාන්‍ය ගැමියන් මෙන් ම විදග්ධ පුද්ගලයෝ ද වූහ. මේ හේතුවෙන් සීගිරි ගීයේ රසයන් කුළුගැන්වීම ද එකිනෙකට වෙනස් ස්වභාවයක් උසුලයි. ඇතැම් ගීවල මනා කාව්‍යාත්මක ගුණයන් ඉස්මතු වන සෙයකි. සීගිරි කවීන්ගේ ස්ත්‍රී-පුරුෂ අසම්මතය හා බැඳුණු මනස විවරණය කොට දැක්වීම මෙහි පර්යේෂණ ගැටලුවයි. ප්‍රිය-ප්‍රියාවන්ගේ ප්‍රේමය උදෙසා හේතු වන සිතෙහි ගති ස්වාභාවයන් මෙන් ම එකල නිරූපිත සමාජ සත්තාවන් ද සීගිරි කවීන් වස්තු විෂය සේ යොදා ගත් අයුරු අධ්‍යයනය කිරීම මින් අපේක්ෂිත ය. සීගිරි ගී ඔස්සේ බොහෝ පර්යේෂණ කෘති ප්‍රකාශයට පත් වුව ද සම්මතය ඉක්මවා ගිය බැඳීම් තුළ පුද්ගල මනස පිළිබඳ කෙරී ඇති විවරණයක් හඳුනා ගැනීම අසීරු ය. එබැවින් මෙම පර්යේෂණය මඟින් එකල පැවති සමාජයේ පුද්ගල චෛතසික ස්වභාවයත් ඔවුනොවුන්ගේ ආධ්‍යාත්මික සමෝධානයන්ගේ පෘථුලතාව පිළිබඳවත් විමර්ශනයක යෙදිය හැකි ය. පුද්ගල සන්තානගත ව ඇති වන්නා වූ රාගය, ප්‍රේමය, වේදනාව ආදි මනෝභාවයන් කුළු ගැන්වීමේ දී සීගිරි කවියෝ සංයමය සුරැකියෝ ය. 344 ගීයෙන් ප්‍රකාශ වන්නේ ස්ත්‍රී චපලත්වයයි. තම රාගී චේතනාව දැල් වූ ඇය ඔහු ඉදිරියේ ම තවෙකෙකුට ප්‍රේම කරන්නී ය. ඒ අතර ඇයගේ අනුග්‍රහය සඳහා තෙවැන්නෙකුගේ පැමිණීම ඔහුගේ පුදුමයට හේතුවකි. මෙම සංකීර්ණමය ක්‍රියාවලිය කවියා ඉදිරිපත් කොට ඇත්තේ කෝපය, තරහව, වෛරය, වේදනාව දැනවෙන අයුරින් නොව මනා සංයත බවකින් යුක්තව ය. මෙහි දී පුද්ගල සිත්හි ඇති වන්නා වූ හැඟීම් සමුදායන්හි ගුප්ත ස්වරූපයත්, පොදු සමාජ චපලත්වයත් නිරූපිත ය. සීගිරි ගී කවියෝ භාෂා සාහිත්‍යයේ පරිචිත වුවෝ ය. සීගිරිය නැරඹීමේ දී සිත්වලට ගලා ආ මනෝභාවයන් විවිධ කාව්‍ය ශිල්ප ක්‍රම ඔස්සේ පිඬු කොට දක්වමින් පාඨකයා හට අසම්මතයෙන් සම්මතය කරා පැමිණෙන්නැ'යි ආරාධනා කරන සෙයකි. මේ අනුව සීගිරි කවීන් ස්ත්‍රී-පුරුෂ අසම්මත බැඳියාවන් තුළින් සමාජ මිදවීමක් අපේක්ෂා කළ බැව් සනාථ කිරීම මෙම විමර්ශනයේ අරමුණයි.

ප්‍රමුඛ පදඃ සීගිරි ගී, මනෝභාවයන්, සංයමය, පෘථුලතාව, ආධ්‍යාත්මික සමෝධානයන්

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*

50

# සීගිරි පද්‍යයන්හි සඤ්ඤකයේ භාවිතය

*කමලවීර, පී. එන්. ටී.*[1]

සිංහල වර්ණමාලාවේ ඇති සඤ්ඤක අක්ෂර සිංහලයට පමණක් ආවේණික අක්ෂර වේ. ප්‍රාකෘත භාෂා වන පාලි, සංස්කෘත හෝ සිංහල භාෂාවට ඥාතීත්වයක් දක්වන වංග, කොයිත්, නේපාල්, ඔරිස්සා යනාදි භාෂාවන්හි ද සඤ්ඤක අක්ෂර දැක ගත නොහැකි ය. මෙම අක්ෂර මුලින් ම හමුවන සීගිරි පද්‍යයන්හි එය භාවිත වූයේ කෙසේ යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පරමාර්ථයයි. ඒ සඳහා සීගිරි පද්‍ය, සීගිරි පද්‍ය අශ්‍රයෙන් රචිත පර්යේෂණ කෘති, ශිලා ලිපි සහ සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ මූලාශ්‍රය ලෙස භාවිත කර ඇත. සිංහල භාෂාවේ 'ග, ජ, ඩ, ද, බ' යන ඝෝෂ අල්පප්‍රාණ අක්ෂර සමඟ 'ඞ, ඤ, ණ, න, ම' යන වර්ගාන්තවල අර්ධය සංයෝග වී 'ඟ, ඦ, ඬ, ඳ, ඹ' යන සඤ්ඤක අක්ෂර නිර්මාණය වේ. මෙම සඤ්ඤක අක්ෂර ඍජු ලෙස ම ක්‍රි. ව. 8, 9, 10 සියවස්වලට අයත් සීගිරි පද්‍යයන්හි භාවිත වී ඇත. එහෙත් බොහෝ අවස්ථාවන්හි ඍජු ව ම මෙම සඤ්ඤකය නොයෙදී ඒ වෙනුවට එහි සංයෝග ව ඇති ඝෝෂ අල්පප්‍රාණ අක්ෂර සහ වර්ගාන්ත අක්ෂර වෙන වෙන ම ලියැවී ඇති ආකාරය ද හඳුනා ගත හැකි ය. මෙය වඩාත් පැහැදිලි ව පෙනෙන්නේ තත්භව පද විමසන කල්හි ය. මීට හේතුව මෙම කාලය වන විට සඤ්ඤකය සම්බන්ධයෙන් පුරාණ ආචාර්යවරුන් අතර විවිධ මතභේද පැවතීම මත සඤ්ඤකය භාවිත කිරීම හා නොකිරීම යන මත දෙකට අයත් ගුරුකුල දෙකක් තිබීම විය හැකි ය. මේ බව 'සිදත්සඟරාව' හා 'එළු සඳැස් ලකුණ' ආදි පැරණි ව්‍යාකරණ ග්‍රන්ථ අධ්‍යයනය කිරීම මඟින් ද පැහැදිලි වේ. ඒ අනුව සීගිරි ගී රචනා කළ ජනයා අතර ද මෙම ගුරුකුල දෙකට ම අයත් වූවන් සිටින්නට ඇති හෙයින් මෙලෙස සීගිරි පද්‍යයන්හි සඤ්ඤකය මෙන් ම සංයෝග නොවූ නාසික්‍ය ශබ්ද ද වෙන වෙන ම භාවිත වන්නට ඇත. එහෙත් පසු කාලීන ව සිදු වූ භාෂා ව්‍යවහාරයේ වර්ධනයත් සමඟ වර්තමානය වන විට සඤ්ඤකය ස්ථාවර අක්ෂරයක් ලෙස සිංහල වර්ණමාලාවට ද ඇතුළත් ව ඇත.

ප්‍රමුඛ පදඃ සිංහල වර්ණමාලාව, සඤ්ඤකය, අර්ධානුනාසික්‍ය, සීගිරි ගී, සිදත් සඟරාව

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*

## 51

# සුබ නිමිති ප්‍රකාශනයෙහි ලා හංස සන්දේශයේ අනන්‍යතාව

*ලක්මාලි, ඩබ්. ජී. එස්.*[1]

සිංහල සන්දේශ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වන්නේ කෝට්ටේ යුගයයි. මේ යුගයේ විරචිත සන්දේශ ලෙස පරෙවි, සැළලිහිණි, කෝකිල, ගිරා සහ හංස යන සන්දේශ පංචකය හඳුනාගත හැකි ය. මේ යුගයේ දී සුබ නිමිති පිළිබඳ විශ්වාසය මෙරට ජනතාව කෙරෙහි තදින් බලපෑ බව මෙම සන්දේශ පිළිබඳ ව විමර්ශනාක්ෂිය යොමු කිරීමේ දී දෘශ්‍යමාන වේ. නමුත් වීදාගම මහමෙත් තෙරිඳුන් විසින් විරචිත හංස සන්දේශයෙහි සුබ නිමිති කෙරෙහි අවධානය යොමු නොකරන්නේ යැයි ඇතැම් විද්වතුන් දරන මතය පිළිබඳ ව විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. යථෝක්ත සන්දේශයන්හි සංස්කරණ හා එම සන්දේශ පිළිබඳ ව ලියැවුණු විචාර, විමර්ශන ඇසුරු කර ගනිමින් මෙම විමර්ශනය සිදු කෙරේ. තත්කාලීන අනෙකුත් සන්දේශයන්හි දූතයා පිටත්කර හැරීමේ දී දෘෂ්ටි ගෝචර සුබ නිමිති දැකගන්නා ලෙස උපදෙස් ලබාදෙයි. එසේ ම හංස සන්දේශයෙහි ද ශ්‍රව්‍ය ගෝචර සුබ නිමිත්තක් ලෙස පිරිත් ශ්‍රවණය කර තම දූත ගමන පිටත්වන ලෙස හංසයාට උපදෙස් සපයන අයුරු විද්‍යමාන වේ. හංසය බෞද්ධ මුහුණුවරක් ගත්ත ද දේව විශ්වාසය හා සුබ නිමිති පිළිබඳ විශ්වාසය ප්‍රතික්ෂේප නොකරයි. අරණ්‍යවාසී යති පරපුරෙන් පැවත එන හංස සන්දේශ කතුවරයා ග්‍රාමවාසී යති පරපුර හා ගැටෙන අයුරු හංස ගිරා ගැටුම තුළින් විද්‍යමාන වේ. තත්කාලීන අනෙකුත් සන්දේශකරුවන් මෙන් ම ගිරා සන්දේශකරුවා ද දූතයා පිටත්කර හැරීමේ දී දෘෂ්ටි ගෝචර සුබ නිමිති දක්නට උපදෙස් ලබාදෙන අතර ගිරාවට පිළිතුරක් ලෙස ලියැවෙන හංස සන්දේශයෙහි ශ්‍රව්‍ය ගෝචර සුබ නිමිත්තක් ලෙස පිරිත් ශ්‍රවණය කිරීම යොදාගෙන ඇති බව පැහැදිලි ව ම පෙනේ. මේ අනුව සුබ නිමිති මිථ්‍යාවන් ලෙසටත්, හංස සන්දේශයෙහි සුබ නිමිති පිළිබඳ සංකල්ප ඇතුළත් නොවන බවටත් ඇතැම් විද්වතුන් විසින් දරන ලද මතය හේතු සාධක සහිත ව ඛණ්ඩනය වන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: සුබ නිමිති, හංස සන්දේශය, ගිරා සන්දේශය, පිරිත්, අරණ්‍යවාසී

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, සිංහල අධ්‍යයනාංශය.*

## 52

# හලාවත ප්‍රදේශයේ ධීවර සමාජය හා බැඳුණු සංස්කෘතික ගති ලක්ෂණ පිළිබඳ විමසුමක්

*හිරුණිකා, ජේ. පී. පී.* [1]

'හලාවත' යනු අප රටේ සාමාජීය වශයෙන් ඉතා වැදගත්, කරාව වංශිකයන්ට ම ආවේණික ලක්ෂණ රාශියකින් සමන්විත වන ධීවර ප්‍රදේශයකි. මසුන් ඇල්ලීම ප්‍රධාන ජීවනෝපාය කර ගත් හලාවත පදිංචිකරුවන් අතරින් බොහෝ දෙනෙක් ක්‍රිස්තියානි ආගම අදහන කරාව වංශිකයෝ වෙති. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරාව වංශිකයන් හා සම්බන්ධ සංස්කෘතික ලක්ෂණ, හලාවත පිහිටා ඇති ධීවර කර්මාන්තය සිදු නොකරන අනෙකුත් ප්‍රදේශයන් හා සසඳන විට දක්නට ලැබෙන විශේෂතා පිළිබඳ සොයා බැලීමයි. මෙම සමාජ ස්තර ද්වයෙහි ම පවතින වාග් මාලාව, ජීවන වෘත්තීන්, අධ්‍යාපන මට්ටම, ආහාර සංස්කෘතිය මෙන් ම චාරිත්‍රවාරිත්‍රයන්හි ද බොහෝ දුරට අසමානතා පවතී. එකී විශේෂතා එම ප්‍රදේශයේ ජනතාවගේ උච්චාරණ විධි, උගත් නූගත්කම්, පරිසර වෙනස් වීම්, ජීවන රටා ආදි කරුණු මත පදනම් ව පවතී. මෙම පර්යේෂණය සඳහා සම්මුඛ සාකච්ඡා ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කළ අතර එහි දී හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදි වයසේ වූ පුද්ගලයන්ගෙන් දත්ත රැස් කර ගන්නා ලදි. හලාවත ධීවර සමාජය තුළ පවතින භාෂාව, ජීවන වෘත්තීන්, චාරිත්‍රවාරිත්‍ර හා නිවාස සැලසුම් ක්‍රම පිළිබඳ මෙම පර්යේෂණය මගින් විශේෂ අවධානයක් යොමු කොට ඇත. ඒ අනුව හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අනෙකුත් ප්‍රදේශයන්ගෙන් වෙනස් වන උපසංස්කෘතික ලක්ෂණ රැගත් සමාජයක් ලෙස 'හලාවත' ධීවර සමාජය හඳුන්වා දිය හැකි ය.

ප්‍රමුඛ පදඃ උපසංස්කෘතිය, කරාව වංශිකයන්, ක්‍රිස්තියානි ආගම, භාෂාව, සමාජීය විශේෂතා

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*

## 53

## A comparative study on Literary Influence and Intertextuality

**Wageeshani, Loku Badu Jayasuriyage.**[1]

Literary Influence can be interpreted as the inspiration that a literary text obtain by other creative work, social or critical concepts and many other external facts. Intertextuality does not only consider the effect upon a literary text by other relevant texts, but focus is paid to grasp the inter connection between a group of texts. These two concepts seem to be similar in surface level, but in an in-depth study the differences between these two critical concepts could be identified. Thus, the aim of this study is to examine the different aspects of Literary Influence and Intertextuality with special reference to two selected examples. The two examples are, the poem titled Maradaanen by Berty B. Kudahetti and the poem titled Apsaraavadekima by Gamini Nishantha Karunarathna. According to the analysis it was found that the Intertextuality is practiced in a broader sense in the field of literature than that of Literary Influence. In Literary Influence, the major attention goes towards the author. I.e. how the author has been influenced by other authors and their writing styles, latest trends in world literature and many other facts. Contrastingly, In Intertextuality, the focus is not solely paid to the author, but the reader and the social milieu come into the fore front also. The previous texts that influence and condition the concerned text can be re-read in the light of the theories relevant to Intertextuality. Therefore it is tempting interpret that Literary Influence and Intertextuality are two different critical concepts which can be used in very different approaches when justifying a literary work.

Key words: Literary Influence, Intertextuality, Critical concepts, Author, Reader

1 *B.A.(special) Third year, Literary Criticism, Department of Sinhala, wageeshanilbj@gmail.com*

# 54

# Art of writing and letterings during Pre-Buddhist Era in Sri Lanka

**Kobbekaduwe. H. G. A. V. K. M.** [1]

When discussing about the history of the art of Writing of Ceylon it is not very famous that there had been evidence about the art of writing before the arrival of Arahanth Mahinda thero (viz. before 03rd century A. D) according to archaeological sources. Such sources help to estimate that the art of writing in Sri Lanka has a long history which goes back to the period of time in which Aryan colonies were established in Sri Lanka, in the 05th century B.C. Instead of written sources like Mahawamsa, there had been much evidence such as, set of lettering inherent to Ceylon which was not found in set of Ashoka letterings, the different writing patterns of ancient inscriptions, etc. But new archaeological sources which were found in Anuradhapura Salgahawatta, Kantharodaya, Akurugoda, and Ibbankatuwa excavations from carbon 14 methodology which has been decided upon the chronological factors before the 05rd century B.C. interms of the evolusions of the letterings in the art of writing in Sri Lanka. Letters like 'ම, බ, ද, ත, හ, ප, ධ' are carved on clay plaques and clay pots were found from these excavations. Finally, it could be concluded that there had been the art of writing in Sri Lanka inexistence before the arrival of prince Wijaya and his followers and it was developed after 03rd century A.D. Archaeological information, related books were associated as sources for this study.

Key words: Art of writing of Ceylon, written sources, Archaeological sources, Arrival of Mahinda thero, Epigraphy.

*1 B.A.(special) Third year, Department of Sinhala, kobbekaduweanuradha@gmail.com*

## 55

## Dostoevsky’s Psychology on Sinhala Cinema (A Comparison between the short story “The Meek One” by Fyodor Dostoevsky and the Sinhala film “Oba Nathuwa Oba Ekka” by PrasannaVithanage)

***Yasarathna, Hasitha Buddhini.***[1]

In this study, a comparison is made between the short story ‘The Meek One’ by Fyodor Dostoevsky (1821-1881), who was most popular for regarding the psychoanalytical characters and incidences andthe Sinhalese film, ″Oba Nathuwa Oba Ekka”(With You Without You, 2015) by PrasannaVithanage. PrasannaVithange, director and script writer of “Oba Nathuwa Oba Ekka” was influenced by Dostoevsky’s short story. He has mentioned it in discussing his film and the critics have discussed about the relationship between the film and the short story. This study, uses the author’s own insights and observations for the analysis. The main question is to understand the extent to which the short story has been reflected in the film. To understand the question, selected incidents and characters are used. Especially the behavior of the wife of the owner of the pawning center is examined. She commits suicide after having heard of the decision of his husband to go out of the city. Prasanna has recreated the similar decision as a trip to India. The suicide incident is the most significant one in both creative works. The incident is analyzed step by step. The reasons behind the incident and how those reasons were reflected by Dostoevsky and Prasanna Vithanage are also investigated with a focus on their differences. The critical opinions, reaction of the audience and opinions revealed through a questionnaire distributed among those who watched the film and by comparing all those with the observations made after reading the short story, it is considered that Prasanna Vithanage is not up to the same level of Dostoevsky in examining human psychology and emotions.

Keywords: Dostoevsky, Prasanna Vithanage, The Meek One, With You without You, Pawning centre owner

1 *B.A.(special) Third year, Department of Sinhala.*